# බෞද්ධාලෝකය

QD/NEWS/117/2021

ISSN 2613-8743

18 වැනි කාණ්ඩය 3 වැනි කලාපය ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි (2021 ජූලි - අගෝස්තු)

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ප්‍රකාශනයකි



## 2021 නිලවරණයෙන් ඉදිරි වර්ෂ තුන සඳහා වැඩි චන්දයෙන් තේරී පත් වූ කෘත්‍යාධිකාරී මණ්ඩලය



බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ වාර්තා පිටපත්, වෙසක් දින ආලෝක පූජාවට සහභාගි වූ ගරු අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර මැතිතුමාට සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන් මැතිතුමාට, සමුළුවේ නියෝජ්‍ය සභාපති රොෂාන් මද්දුමගේ මැතිතුමා විසින් පිළිගැන්වීම.





බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි 2021 ජූලි - අගෝස්තු

## ලිපි සරණිය


- ධම්ම පදය - ජීවිතයට සම්බන්ධ කර ගනිමු - සිංහල සම්පාදක: පණ්ඩිත රන්ජිත් වනරත්න Translated by: Prof. Siromi Samarasinghe 2
- දම්සක් දේශනාව සිංහලෙන්... (කවරයේ කතාව) - වෛද්‍ය රානි ප්‍රනාන්දු 3
- සුත්තනිපාතයෙන් අනාවරණය වන බුදුරජාණන් වහන්සේ පිළිබඳ... - පූජ්‍ය පුස්සැල්ලේ විනීත හිමිපාණෝ 7
- වෘක්ෂලතා ලෝකය පිළිබඳ බෞද්ධ ආකල්පය - ඩෙන්සිල් සේනාධීර 11
- ඓතිහාසික රෝහණ රාජ්‍යයේ සීමා මායිම් - පූජ්‍ය මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි 19
- ඇසළ පොහොය උදාවේ බොදු අසිරිය - චන්ද්‍රසිරි වැලිගමගේ 25
- THREE-WAY LIBERATION FROM SAMSARA - Das Miriyagalla 27
- ප්‍රත්‍යවේක්ෂාව - ආචාර්ය හසන්ත සමරසිංහ 29
- සෝතාපන්න සිත - නාලක ජයසේන 33
- අධ්‍යාපනයේ බෞද්ධ පිවිසුම - තරිඳු ධනංජය වීරසිංහ 36
- අනුරාධපුර පැරණි යෝධ ඇළෙහි වාරි තාක්ෂණික ලක්ෂණ - ආචාර්ය එච්.එච්.ඒ. කරුණාරත්න 40
- සම්මාකම්මන්ත - පූජ්‍ය මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි 44
- බොදු සමුළු පුවත් - 46



**සංස්කාරක මණ්ඩල උපදේශක**
ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

**සංස්කරණ කළමනාකරණය**
වෛද්‍ය රානි ප්‍රනාන්දු

**සංස්කාරක මණ්ඩලය**
චන්ද්‍රසිරි වැලිගමගේ
ශ්‍යාම් නුවන් ගනේවත්ත
ආචාර්ය අශෝක් කරුණාරත්න
නාලක ජයසේන
ඉෂාන් එදිරිසූරිය

**ප්‍රකාශනය**
ප්‍රචාරක කටයුතු පිළිබඳ ජාතික මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**කවර නිර්මාණය සහ පිටු සැකසුම**
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**මුද්‍රණය**
ෆාස්ට් ප්‍රින්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථන : 011 2691695 / 011 2688517 / 011 2667017
ෆැක්ස් : 011 2688517 web : www.acbc.lk
විද්‍යුත් තැපැල් : acbc380@gmail.com
buddalokanews@gmail.com

# බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි

2021 ජූලි - අගෝස්තු

# ධම්ම පදය
## ජීවිතයට සම්බන්ධ කර ගනිමු

### චිත්ත වර්‍ගය - කෙලෙස් නැසීමෙන් සිත පිරිසිදු වේ

**3 -1 ඵන්ද චපලං චිත්තං**
**දුරක්ඛං දුන්නිවාරයං**
**උජුං කරොති මෙධාවී**
**උසුකාරො'ච තෙජනං**

සැලෙන්නාවූ, ස්ථිර නොවූ, දුකසේ රැකිය යුතුවූ දුසිරිත් නොවැළකිය හැකි වූ සිත නුවණැත්තේ කෙරෙයි, කුමක් මෙන්ද යත්, හී වඩු තෙම: හී දණ්ඩක් (හැද මැඩ සෘජු කරන්නාක්) මෙනි

3-1 බුදුරජාණන් වහන්සේ එක් කලෙක චාලිකා නුවර අසල චාලිකා පව්වෙහි කරවන ලද විහාරයෙහි වැඩ වාසය කරන සේක. එකල උපස්ථාන කළෝ මෙඝිය ස්ථවිරය. දිනක් බුදුන් වෙත පැමිණ ජනතු ග්‍රාමයට පිඬු පිණිස යාමට අවසර ඉල්ලීය. අවසර ලදින් එහි ගොස් පස්වරුයෙහි කිමිකාලා ගං ඉවුරට වැඩ සිත්කලු අඹ උයනක් දැක එහි සිට මහණදම් පිරීමට අදහසක් ඇති විය. ඒ සඳහා එහි යාමට බුදුන්වහන්සේගෙන් අවසර ඉල්ලීය. එවිට බුදුන්වහන්සේ මේඝිය තෙරුන්ගේ නුවණ මෝරා නොගිය බව දැන ගමන වැළැක් වූහ. දෙවන වර ද ඉල්ලීම වැළැක් වූහ. තෙවැනි වර අවසර දුන්හ.

මෙඝිය තෙරුන් වහන්සේ එහි වැඩ එක්තරා ගස මුලක දිවා විහරණය පිණිස වැඩ හුන්හ. එතැන තමන් පිළිවෙළින් ජාති පන්සියයක්ම රජව උයන් කෙළි කෙළිමින් නළඟනන් පිරිවරා හුන් තැන විය. එහිදී තෙරුන්ට ම මහණ දම් අතුරුදහන්ව ගියා සේද, රජ වෙස් ගෙන නළඟනන් පිරිවරා හුන්නාහු සේ ද වැටහිණ.

එකෙණෙහි ඔහු සිත කාම විතර්කයෙක් උපන. ඒ හා ම බඩු සහිතව අල්ලා ගත් සොරුන් දෙදෙනෙකුන් ඉදිරියට පමුණුව සිටියවුන් සේ දුටහ. එකෙණෙහි උන් අතුරෙන් ඉදිරියට පමුණුව සිටියවුන් සේ දුටහ. එකෙණෙහි උන් අතුරෙන් එකෙකුට වධය නියම කිරීම් වශයෙන් ව්‍යාපාද විතර්කය උප ණ. හිර දඬුවම් නියම කිරීම් වශයෙන් විහිංසා විතර්ක උපන. මෙසේ අකුසල විතර්කයන්ගෙන් වට කෙරණු මට මහණ දම් පුරන්ට නො හැකි යයි නැවත බුදුන් වහන්සේ වෙත පැමිණියහ. එහිදී ලාමක අකුසල විතර්කයෝ මා වට කර ගත්හයි දන්වා සිටියහ. එවිට බුදුන් වහන්සේ සිත පැද්දෙන පෙරළෙන සුලු එකක් බැව් දක්වා සිත වසඟයට ගත යුතු යයි බණ වදාරා ඒ තෙරුන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිට වූ සේක.

ධම්මපද වනරත්න ව්‍යාඛ්‍යා පොතින්
සම්පාදක: **පණ්ඩිත රන්ජිත් වනරත්න මහතා**

### Cittavagga
### The Mind

**33. Phandanam capalam cittam**
**durakkham dunnivarayam**
**ujum karoti medhavi**
**usukaro va tejanam.**

Just as an arrow-maker straightens an arrow shaft, even so the discerning person straightens his mind-so fickle and unsteady, so difficult to guard and control.

Once when the The Buddha was residing at the monastery on the Chalika Mountain, near the city of Chalika , Meghiya Thera was attending upon him. One day, Meghiya thera requested permission from the Buddha to visit the village of Jhanthu, for his round of alms. Having obtained the Buddha's permission, he went there and in the afternoon went to the bank of the Kimikala river where he noticed a pleasant grove of mango trees, which he thought was a good place to practice the Buddhist monastic lifestyle. He requested permission from the Buddha to go to the mango grove for this purpose, but the Buddha having realised that Meghiya thera was not yet ready for it mentally, did not permit him to go. The Buddha refused Meghiya thera's request a second time as well, but on the third time the request was granted.

Meghiya thera went to the mango grove and was resting at the foot of a tree after consuming the mid day meal. It was the place where, during five hundred previous births, as a king, he had enjoyed the company of beautiful dancers in the mango grove. The thera felt as if he was no longer associated with the life of a monk and that once again he was king, in the company of the beautiful dancers.

At that moment sensual thoughts of Kama *vitakka* arose within him, imagining there were two robbers caught with stolen goods and brought to his presence. He was assailed by evil thoughts of *vyapada vitakka,* ordering one of them to be punished by torturing. Cruel thoughts of *vihimsa vitakka* arose within him ordering the robbers to be imprisoned. He felt he could no longer lead the life of a monk as his mind was wandering. He returned to the Buddha and reported that his mind was being invaded by unwholesome thoughts during that time.

The Buddha advised that the mind is fickle and easily distracted. Therefore the excitable mind has to be controlled. Having listened to the Buddha's sermon, Meghiya thera attained the state of *Sotapanna.*

Translated by: **Prof. Siromi Samarasinghe**

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි 2021 ජූලි - අගෝස්තු



# දම්සක් දේශනාව සිංහලෙන්...

**වෛද්‍ය රානි ප්‍රනාන්දු**

දඹදිව, බරණැස ඉසිපතනයේ මූලගන්ධකුටි විහාරයේ බෝමළුවේ පිහිටුවා ඇති පුවරුවෙන් පිටපත් කරන ලදී.

මා විසින් මෙසේ අසන ලදී, එක් සමයෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් මිගදායෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන් අමතා ධම්මචක්ක සූත්‍ර දේශනාව වදාළ සේක.

පින්වත් මහණෙනි, පැවිද්දන් සේවනය නොකළ යුතු වූ මේ අන්ත දෙකකි. යම් ඒ කාමයන්හි කාම සුඛයේ ඇලී ගැලී වාසය කිරීමක් ඇද්ද මෙය හීන වූ දෙයකි. ග්‍රාමක උත්තම මිනිසුන් විසින් සේවනය නොකරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.

පින්වත් මහණෙනි, යම් ඒ තමාව පීඩාවට පත් කරවන වැඩ පිළිවෙළක් ඇද්ද එය දුක් සහිත දෙයකි. උත්තම මිනිසුන් විසින් සේවය නොකරන දෙයකි. අනර්ථ සහිත දෙයකි.

පින්වත් මහණෙනි, ඒ මේ අන්ත දෙකට නො පැමිණ තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදාව අවබෝධ කරන ලද, මේ මධ්‍යම ප්‍රතිපදාව දහම් ඇස ලබා දෙයි. නුවණ උදා කරයි. සංසිඳීම ඇති කරයි. විශේෂ ඥාන ඇති කරයි. නිවන පිණිස පවතින්නේය.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද දහම් ඇස ලබා දෙන නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, අවබෝධය ඇති කරන, නිවන පිණිස පවතින්නාවූ මධ්‍යම ප්‍රතිපදාව නම් කුමක්ද?

ඒ මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. එනම් සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය, සම්මා වාචා, සම්මා කම්මන්තය, සම්මා ආජීවය, සම්මා වායාමය, සම්මා සතිය, සම්මා සමාධිය යන මෙය යි.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද, දහම් ඇස ලබා දෙන, නුවණ උදා කරන, සංසිඳීම ඇති කරන, අවබෝධය ඇති

කරන, නිවන පිණිස පවතින්නා වූ මධ්‍යම ප්‍රතිපදාව නම් මෙයයි.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නම් වූ ආර්ය සත්‍යයයි. ඉපදීම ද දුකකි. මරණය ද දුකකි. අප්‍රිය පුද්ගලයා හා අප්‍රිය වස්තූන් සමඟ එක් වීම ද දුකකි. ප්‍රිය පුද්ගලයන් ගෙන් හා ප්‍රිය වස්තූන්ගෙන් වෙන් වීම ද දුකකි. කැමති වන්නා වූ යම් දෙයක් ඇත් ද එය නොලැබීම ද දුකකි. සංක්ෂේපයෙන් කීවොත් පංච උපාදාන ස්කන්ධයෝ ම දුකකි.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක හට ගැනීම නම් වූ ආර්ය සත්‍යයයි. පුනර්භවය ඇති කරවන ආස්වාදයෙන් ඇලෙන්නා වූ යම් ඒ තණ්හාවක් ඇත් ද එයයි. එනම් කාම තණ්හාව, භව තණ්හාව හා විභව තණ්හාවය.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයි. ඒ තණ්හාවේ ම ඉතිරි නැතිව නොඇල්මෙන් නිරුද්ධවීමක් වේද, දුරුවීමක් වේ ද, තණ්හාවෙන් මිදීමක් වේද, ආලය නැතිවීමක් වේ ද එයයි.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යයයි. එනම් සම්මා දිට්ඨිය, සම්මා වාචා, සම්මා කම්මන්තය, සම්මා ආජීවය, සම්මා වායාමය, සම්මා සමාධිය යන මෙයයි.

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නම් වූ ආර්ය සත්‍යය යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය ප්‍රහාණය කළ යුතු යි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහස් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක නම් වූ ආර්ය සත්‍ය පරිපූර්ණ වශයෙන් අවබෝධ කරන ලදියි කියා මා හට පෙර නොඇසූ විරු ධර්මයන්හි දහම් ඇස පහළ විය. ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි, මෙය වනාහි දුක හට ගැනීම නම් වූ ආර්ය සත්‍යයි කියා මා හට පෙර නො ඇසුවී ධර්මයන්හි දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

ඒ දුක හට ගැනීම නම් වූ ආර්ය සත්‍ය ප්‍රහාරණය වුවේ යයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන් හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය,

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍යයි කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය.

ඒ දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍ය (විද්‍යාව, විමුක්ති වශයෙන්) සාක්ෂාත් කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය,

ඒ දුක නැතිවීම නම් වූ ආර්ය සත්‍ය (විද්‍යා, විමුක්ති වශයෙන්) සාක්ෂාත් කළ යුතුයි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය,

පින්වත් මහණෙනි, මෙය වනාහී දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යයයි. කියා මා හට පෙර නො ඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍ය (ශීල - සමාධි - ප්‍රඥා වශයෙන්) ප්‍රගුණ කළ යුතු යැයි මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

ඒ දුක නැතිවීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍ය (ශීල - සමාධි - ප්‍රඥා තුළ) ප්‍රගුණ කරන ලදී යි කියා මා හට පෙර නොඇසූ විරූ ධර්මයන්හි දහම් ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

පින්වත් මහණෙනි, මේ චතුරාර්ය සත්‍ය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළසකින් යුතුව සැබෑ තත්ත්වය නම් වූ

ඥාන දර්ශනය සුවිශුද්ධ ලෙස හා මට යම් තාක් අවබෝධ නො වූයේ වේද,

ඒ තාක් කල්හි ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි මරුන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහි අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමියි ප්‍රතිඥා නො දුන්නෙමි.

එහෙත් පින්වත් මහණෙනි, මා හට යම් කලක මේ චතුරාර්ය සත්‍යය ධර්මයන් පිළිබඳව මේ ආකාරයට පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළසකින් යුතුව සැබෑ තත්ත්වය නම් වූ ඥාන දර්ශනය සුවිශුද්ධ ලෙසට අවබෝධ වූයේ වේද,

ඒ තාක් කල්හි ම පින්වත් මහණෙනි, දෙවියන් සහිත වූ ලෝකයෙහි මරුන් සහිත වූ බඹුන් සහිත වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ දෙව් මිනිස් ප්‍රජාව තුළ මම වනාහි අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළෙමියි ප්‍රතිඥා දුන්නෙමි.

**දස දහසක් ලෝක ධාතුවම කම්පා විය. බලවත්ව කම්පා විය. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා ගිය අප්‍රමාණවූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේය.**

මා හට ඥාන දර්ශනය පහළ විය. මාගේ චේතෝ විමුක්තිය වෙනස් නො වන්නේය. මෙය වනාහි අන්තිම ඉපදීම වේ. දැන් මා හට පුනර්භවයක් නැත්තේ යි. භාග්‍යවතුන් වහන්සේ මේ ධම්මචක්ක සූත්‍ර දේශනය වදාළ සේක.

අතිශයින් ම සතුටට පත් වූ ඒ පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මේ ශ්‍රී සද්ධර්මය මහත් සොම්නසින් යුතු ව පිළිගත්තාහු ය. මේ ධම්මචක්ක දේශනය වදාරන කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා වූ යම් දෙයක් ඇත් ද, හේතූන් නිරුද්ධ වීමෙන් ඒ සියල්ලම නිරුද්ධ වී යන ස්වභාවයෙන් යුක්තය යි කියා කෙලෙස් රහිත වූ අවිද්‍යා මලකඩ රහිත වූ දහම් ඇස පහළ විය.

අප ගේ භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වනාහි ශ්‍රමණයකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නො හැක්කේ ම යයි කියා පොළොවවාසී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

පොළොවවාසී දෙවියන් ගේ දහම් ඝෝෂාව අසා චාතුම්මහාරාජික දෙවියෝ දහම් ඝෝෂාව පැවැත්වූවාහු ය.

චාතුම්මහාරාජික දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා තාවතිංස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

තාවතිංස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා යාම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

යාම දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා තුසිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

තුසිත දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා නිම්මාණරතී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

නිම්මානරතී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා පරනිම්මිත වසවත්ති දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

පරනිම්මිත වසවත්ති දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්ම පාරිසජ්ජ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

බ්‍රහ්මපාරිසජ්ජ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා බ්‍රහ්ම පුරෝහිත දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

බ්‍රහ්මපුරෝහිත දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා මහාබ්‍රහ්ම දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

මහාබ්‍රහ්ම දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා පරිත්තාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

පරිත්තාභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අප්පමාණාභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

අප්පමාණ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා ආභස්සර දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

ආභස්සර දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා පරිත්තසුභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

පරිත්තසුභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අප්පමාණසුභ දෙවියෝ දහම් ඝෝෂා පැවැත් වූවාහු ය.

අප්පමාණසුභ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා සුභකිණ්හ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

සුභකිණ්හ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා වේහප්පල දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

වේහප්පල දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අවිහ දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

අවිහ දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අතප්ප දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

අතප්ප දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා සුදස්ස දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

සුදස්ස දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා සුදස්සී දෙවියෝ දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

සුදස්සී දෙවියන්ගේ දහම් ඝෝෂාව අසා අප භාග්‍යවත්න් වහන්සේ විසින් බරණැස ඉසිපිතන මිගදායෙහි දී අනුත්තර වූ ධම්මචක්කය පවත්වන ලදී. එය වහානී ශ්‍රමණයකුට හෝ බ්‍රාහ්මණයකුට හෝ දෙවියකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලෝකයෙහි වෙන කවරෙකුට හෝ වෙනස් කළ නොහැක්කේ මය යි කියා අතනිට්ඨ දෙවියෝ ද දහම් ඝෝෂා පැවැත්වූවාහු ය.

ඒ ක්ෂණයෙහි ම, ඒ මොහොතෙහිම බ්‍රහ්ම ලෝක යම් තාක් වේ ද ඒ තාක් මේ දහම් ඝෝෂාව පැතිර ගියේය.

දස දහසක් ලෝක ධාතුව ම කම්පා විය. බලවත්ව කම්පා විය. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා ගිය අප්‍රමාණවූ ආලෝකයක් ලෝකයෙහි පැතිර ගියේය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "භගවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා, භගවත් කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් ම අවබෝධ කළා" යන උදානය පහළ කළ සේක.

මේ ආකාරයෙන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන් වහන්සේට අඤ්ඤා කොණ්ඩඤ්ඤ නාමය ඇති වූයේ ය.

සාදූ! සාදූ! සාදූ!

අප සියලු දෙනාට ද මේ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය වහ වහා අවබෝධ කර ගැනීමේ වාසනාව උදාවේවා!!

**බෞද්ධ සාහිත්‍ය උත්සවය - ශ්‍රී බු.ව. 2565/2021**

## බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ භාරගැනීම

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් 15 වන වරටත් සංවිධානය කරනු ලබන බෞද්ධ සාහිත්‍ය උත්සවය සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව 2021 සැප්තැම්බර් මස 27 දින ප.ව. 2.30 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

මෙහිදී 2020 වර්ෂය තුළදී ප්‍රකාශයට පත් කරන ලද බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සඳහා ශාස්ත්‍රීය, නවකතා, පර්යේෂණ, පරිවර්තන, ළමා සාහිත්‍ය, නව ප්‍රබන්ධ, පද්‍ය, ගේය කාව්‍ය වන විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ඇගයීමට ලක් කොට ග්‍රන්ථ කතෘවරුන් උදෙසා ත්‍යාග හා සම්මාන පිරිනැමීම සිදු කරනු ලබයි.

**ඔබ විසින් 2020 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද පළමු මුද්‍රණයට අදාළ ඉහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ ලියවුණු ග්‍රන්ථ පිටපත් දෙක බැගින් 2021 ජූලි මස අවසානයට පෙර සම්මේලන මූලස්ථානයට භාර දීමට කාරුණිකවන්න**

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

දු.අංකය - 011-2691695/ 076-5611374

විද්‍යුත් තැපැල :- acbc380@gmail.com

වෙබ් අඩවිය :- www.acbc.lk



# සුත්තනිපාතයෙන් අනාවරණය වන බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන අදහස්

**පූජ්‍ය පුස්සැල්ලේ විනීත හිමිපාණෝ**
**(B.A. in English (BPU),**
**Med in TESL (HELP University, M'siya)**

ගෞතම බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ, ශාක්‍යමුණි බුදු රජාණන් වහන්සේ යනුවෙන් හඳුනාගත හැකිය. ලොව පහළ වූ ශාස්තෲන් වහන්සේලා අතර තථාගතයන් වහන්සේ අග්‍රගණ්‍ය මාර්ගෝපදේශකයන් වහන්සේය යන්න අවිවාදිතය. උන්වහන්සේගේ ඉගැන්වීම් බුද්ධාගම, ත්‍රිපිටකය, ශ්‍රී සද්ධර්මය යන අන්වර්ථයන්ගෙන් සිංහලයෙහි හඳුන්වනු ලැබේ. ඉංග්‍රීසි භාෂාවේ Buddhism යන්න මේ සඳහා භාවිත වේ. ඉගැන්වීම් වල ස්වරූපය අනුව පිටක වශයෙන් ත්‍රිවිධාකාර වේ. සුත්ත නිපාතය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ය. එහි උරග, මහා අෂ්ඨක සහ පාරා යනාදී වග්ග පසෙකි. මෙහි එන සූත්‍ර ධර්මයන් ගද්‍ය පද්‍ය වලින් නිර්මිත ය. ධර්ම කාරණා වලට අමතරව භාරතිය සමාජයේ දේශපාලනික, ආර්ථික, ආගමික, දාර්ශනික, පාරිසරික හෙවත් භූගෝලීය හා සාහිත්‍යමය කරුණු රැසක් දැකගත හැකි මූලාශ්‍රයක් වශයෙන් සුත්ත නිපාතය අගය කළ හැකි ය. බුදුරජාණන් වහන්සේගේ සමකාලීනයන් උන්වහන්සේ පිළිබඳව දැරූ ආකල්ප හෙවත් අදහස් ද මෙහි දක්නට ලැබෙන සුවිශේෂිතාවයකි. ශාස්තෘවරයෙකු, මාර්ගෝපදේශකයෙකු, අධ්‍යාත්මික නායකයෙකු, මහා පුරුෂයෙකු කෙලෙස් මරුන් පැරදූ නිකලෙස් උතුමෙකු ලොව කලාතුරකින් පහළ වන දුර්ලභ උතුමෙකු සහ මහා ප්‍රාඥයෙකු වශයෙන් භාරතීය සමාජයේ විවිධ තරාතිරමේ සමකාලීනයන් උන්වහන්සේව ප්‍රශංසා මුඛයෙන් ඉතා විචිත්‍රවත් ලෙස වර්ණනා කරති. මෙහි ලා අපගේ අරමුණ වන්නේ එකී අදහස තුළින් මතුවන මාර්ගෝපදේශකයෙකු අධ්‍යාත්මික නායකයෙකු හා මහා පුරුෂයෙකු වශයෙන් ඇති ලක්ෂණ පිළිබඳව විමසීමයි.

භාග්‍යවතුන් වහන්සේ ලොව බිහි වූ විශිෂ්ටතම හා නිවැරදිම මාර්ගෝපදේශකයෙකු වශයෙන් බොහෝදෙනා අගය කරති. දෙව් මිනිසුන්ට අවවාද හා අනුශාසනා කිරීමෙහි ලා උන්වහන්සේ අභිභවා යන්නට වෙනත් සමතෙක් ලොව නැතැයි යන්න පිළිගත් මතයයි. මේ කරුණ සනාථ කිරීමෙහි ලා සුත්ත නිපාතයේ ප්‍රමාණවත් සාධක හමුවේ. ඒ අතුරෙන් කසීභාරද්වාජ, ආලවක ආදි සූත්‍ර ධර්මයන් නිදසුන් ලෙස වැදගත් ය. මිථ්‍යාමතවල පිහිටා ජීවිතය අන්ධකාරයෙන් අන්ධකාරයට

ගමන් කරන මිනිසුන්ගේ ජීවිත ආලෝකයට ගැනීමෙහි ලා බුදුරජාණන් වහන්සේ මොනතරම් නිපුණතාවකින් යුක්ත ද යන්න උන්වහන්සේ හමු වේ සැනසුන සමකාලීනයෝ අවිජ්ජාව ප්‍රකාශ කරති. කසීභාරද්වාජයන් එවැන්නෙකි. ඔහු සීසෑමේ කටයුතු වල නිරතව සිටින විට පිඬුසිඟා වැඩි බුදුරජාණන් වහන්සේට ආමන්ත්‍රණය කරන්නේ වසල වාදයෙනි.

"අහං චේ සමණ කසාමිච වපාමිච වපිතවාච භුඤ්ජාමි. තවමපි සමණ කසසසු ච වපසසුච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජමාති ......" මහණ මම සී සාමි, වපුරමි, සී සා වපුල දේ අනුභව කරමි. මහණ තොපත් සී සා වපුල දේ අනුභව කරව.[1]

ඉහත සූත්‍රාගත උද්ධෘතයෙන් පැහැදිලි වන්නේ තමන් වෙත පැමිණි ආගන්තුකයා වෙත කිසිම ගරුසරුවක් නොමැතිව නොසලකා හැරීමයි. ඒ බවට සාමාන්‍ය කෙනෙකුට ආමන්ත්‍රණය කරන සමණ ආදී වචන භාවිතයෙන් ම විද්‍යමාන වේ. සී සෑම පිළිබඳව එවිට සැබෑ තතු පවසා දහම් දෙසූ බුදුරජාණන් වහන්සේ ගැන පවසන්නේ ඉතා විචිත්‍ර අදහසකි.

**"අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්සවා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති..."**

භවත් ගෞතමයන් වහන්ස ඉතා මැනව, භවත් ගෞතමයන් වහන්ස යම් සේ යටිකුරු කරවන ලද්දක් උඩුකුරු කොට තැබුවා සේ වැසී තිබූ දෙයක් මඟ මං මුළාවෙකුට මඟ කියන්නෙකු සේ, අඳුරෙහි ඇති අයට රූප දකිත්වායි අන්ධකාරයට තෙල් පහනක් දැල්වූවා සේ එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නන් අයුරින් ධර්මය දෙසන ලදී.[2]

මෙම ප්‍රකාශය බමුණාගේ අධ්‍යාත්මයෙන් ම පැන නගින්නා වූ අදහසකි. එක් පැත්තකින් මෙහි සාහිත්‍යමය අගයක් ද ඇත. උපමා සතරකින් භාග්‍යවතුන් වහන්සේ ගේ අගය සහ මාර්ගෝපදේශන කෞශල්‍ය මැනවින් නිරූපණය කරති. යථෝක්ත උපමා සතර මොනයම් අර්ථයකින් වැදගත් වන්නේ දැයි සුත්ත නිපාතට්ඨ කතාවේ පහත පරිදි අයුරින් සඳහන් වේ.

යම් තැනක යටිකුරු කරන ලද්දක් උඩුකුරු කිරීම යනු අසද්ධර්මයට වැටී තිබූ අයට සද්ධර්මය විවර කළ යනුයි. එසේ මිනිසා දෘෂ්ටි ගහණයෙන් කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයත් අතුරුදන් වූවායි පවසා ශාසනය විවර කිරීමයි. මංමුළා වූවෙකුට මඟ පෙන්වා දෙන්නේ යම්සේද යත් ක්‍රෝධ මාර්ගයට මිථ්‍යාමාර්ගයට පිවිසි අයට මේ ස්වර්ගමෝක්ෂ මාර්ගය යැයි පෙන්වීමය. අන්ධකාරයට තෙල් පහනක් දැල්වීම යන මොහාන්ධකාරයේ නිමග්න වූවන්ට මේ බුද්ධානුභවයෙන් රූප දකිත්වායි මොහාන්ධකාරය විනාශ වන දේශනාවෙන් අන්ධකාරය දුරුලීමයි. මේ පරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ නා නා පරිද්දෙන් ධර්මය දේශනා කළ සේක.[3]

අටුවාචාරීන් වහන්සේගේ ඉහත විග්‍රහයට අනුව විශිෂ්ට මාර්ගෝපදේශක වශයෙන් අධ්‍යාත්මික මාර්ගය කියා දීමේ දී බුදුරජාණන් වහන්සේගේ කෞශල්‍ය විද්‍යමාන වේ. එහිලා කසීභාරද්වාජ වැනි මිථ්‍යා මතධාරීන් බුදුරදුන්ගේ ඇසුරෙන් සම්පූර්ණයෙන්ම වෙනස් වූ වග පැහැදිලිය. එසේම බුදුරදුන් පිළිබඳ අදහසද යහපත් වශයෙන් ඉතා උසස් අයුරින් භාරතීය සමාජයේ විවිධ අය අදහස් ප්‍රකාශ කළ බව සනාථ වේ. ආලවක, වසල ආදී උරගවග්ගයේ අදාළ ධර්මයන් තුළද ඉහත අයුරින්ම භාග්‍යවතුන් වහන්සේ වර්ණනාවට ලක් කරයි.

මහාවග්ගයේ හමුවන හේමවත සූත්‍රය පාරායන වග්ගයේ වත්ථු ගාථා හා සූත්‍රයන් බුදුරජාණන් වහන්සේ තුළ වූ අධ්‍යාත්මික ලක්ෂණ විග්‍රහ කරන මූලාශ්‍රයන් ය. භාරතීය ජන සමාජයේ මානවයා අධ්‍යාත්මික නායකයෙකු තුළ දැකීමට ප්‍රිය කරන ලක්ෂණ මෙන්ම භාග්‍යවතුන් වහන්සේ ඉහළින්ම එකී ලක්ෂණයන්ගෙන් සමන්විත බවට තොරතුරු සමකාලීනයෝ සාකච්ඡා කළ අයුරු දක්නට ලැබේ. හේමවත සූත්‍රයේ සාතාගිර හේමවත යකුන්ගේ සාකච්ඡාව කදිම නිදසුනකි.

හෙමවත - ඒ ශාස්තෘන් වහන්සේගේ සිත මොනවට සංවර වේද?

සියලු සතුන් කෙරෙහි සම සිත් ඇත්තේ වේදැයි? නොවේදැයි?

ඉටු අනිටු අරමුණු වල උන්වහන්සේගේ සංකල්පයනක් වශීකෘත වේද?

සාතාගිර - සියලු සතුන් කෙරෙහි සම සිත් ඇති උන්වහන්සේගේ සිත මොනවට සමාන වෙයි

ඉටු අනිටු අරමුණුවල උන්වහන්සේගේ තීර්ථකයෝ වශීකෘතය.

හෙමවත - අනුන්ට අයත් දෑ නොගන්නේද?

එසේම ප්‍රාණීන් කෙරෙහි සංයත වේද?

අබ්‍රහ්මචරියාවෙන් දුරුවේද?

ධ්‍යාන හිස් නොකරේද?

සාතාගිර - අයිනාදන් නොගන්නේය.

එසේම ප්‍රාණීන් කෙරෙහි සංයත වේ.

අබ්‍රහ්මචරියාවෙන් දුරුවේ.

ඒ බුදුරජාණන් වහන්සේ දැහැන් හිස් නොකෙරේ.

හෙමවත - මුසා බස් නොබනේද?

පරුස් බස් නැත්තේද?

පිසිනු බස් නොතෙපලයිද?

කිම පලප් නොබනේද?

සාතාගිර - උන්වහන්සේ මුසා බස් නොබණයි.

එසේම පරුස් බස් නැත්තේ වෙයි.

පිසුණු බස්ද නොතෙපලයි.

උන්වහන්සේ නුවණින්ම පිරිසිඳ දැන අරුත්ම දෙසන සේක.

හෙමවත - ක්ලේශකාමයන් හි වස්තුකාමයන්හි නොඇලුනේද?

සිත ව්‍යාපාදයෙන් නොකැලඹුනේද?

මෝහය ඉක්ම වූයේද?

කිම සියලු දහම් හි නුවණැස් ඇතිද?

සාතාගිර - කාමයන්හි නොඇලෙයි.

එසේම සිත ව්‍යාපාදයෙන් නොකැලඹුනේ වෙයි.

මෝහය ඉක්මවූයේ වෙයි.

බුදුරජාණන් වහන්සේ සියලු දහම් හි නුවණැස් ඇත්තේ වෙයි.

හෙමවත - ඒ බුදුරදුන් අවිද්‍යාවෙන් සමන්විත වේද?

සුපිරිසිදු පසළොස්වරණ ධර්මය ඇත්තේ වේද?

උන්වහන්සේගේ සියලු ආශ්‍රමයෝ කළපා වේද?

කිම පුනර්භයක් නැත්තේද?

සාතාගිර - උන්වහන්සේ අෂ්ඨවිද්‍යාවෙන් සමන්විතය

එසේම සුපිරිසිදු පසළොස්වරණ ධර්මයක් ඇත්තේ වේ.

උන්වහන්සේගේ සියලු ආශ්‍රවයෙන් බැහැර කර ඇත.

උන්වහන්සේට පුනර්භවයක් නැත.

එසේම මුනිඳුගේ සිත ශ්‍රද්ධා, කාය, වාග් භාවිතයෙන් සම්පූර්ණ වෙති. එසේ හෙයින් විජ්ජාචරණ සම්පන්න වූ භාග්‍යවතුන් වහන්සේ ඒ ආකාරයෙන්ම දකිමු.[4]

භාරතීය සමාජයේ අධ්‍යාත්මික නායකයෙකුගේ බලාපොරොත්තු වන ගුණ විශේෂය හා සත්‍යාවබෝධය පිළිබඳ මතය මෙහි නිරූපිතය. කායවාග් සංවරය, ක්ලේශ ධර්ම ප්‍රහීණය, ආත්ම විද්‍යා පසළොස්වරණ ධර්මයන්ගෙන් පරිපූර්ණ බව හා පුනර්භවයක් නැති බව හා නියම මඟ දත යුතුය. සාතාගිරයන් හිමවතට පිළිතුරු දෙමින් පවසන්නේ ඒ භාග්‍යවත් සම්බුදුරජාණන් වහන්සේ ඒ සියලු අධ්‍යාත්මික ලක්ෂණයන්ගෙන් සම්පූර්ණ බවයි. සමකාලීන භාරතීය මනුෂ්‍ය නොවන එහෙත් අවබෝධයට දියුණු මනසක් ඇති සත්වයින් පවා සම්බුද්ධ චරිතය හඳුනාගත් බවට මෙය පැහැදිලි උදාහරණයකි.

තවද පරායණ වග්ගයේ වත්ථු ගාථා පරිච්ඡේදයේ බාවරී බමුණා විසින් බුදුරජාණන් වහන්සේ හඳුනා ගන්නා සුවිශේෂ අධ්‍යාත්මික ලක්ෂණයන් ගැන පහදා දෙයි.

**"අනාවරණ ඤාන දස්සාවි යදි බුදෙධා භවිසසති මනසා පුචජිතෙ පඤෙහ වාචාය විපසසති"[5]**

උන්වහන්සේ අනාවරණ ඥාන දස්සාවි බුදුන් වහන්සේ නම් ඔබ සිතින් විමසන ප්‍රශ්නවලට උන්වහන්සේ වචනයෙන් පිළිතුරු දෙයි.

අන් අයගේ සිත කියවා සිතේ ඇති ප්‍රශ්නවලට වචනයෙන් ඔවුන් හට පිළිතුරු ලබා දීමේ හැකියාව ඇත්තේ බුදුරජාණන් වහන්සේට පමණි. එය සාමාන්‍ය මිනිසෙකු සතු ගුණයක් නොවේ. බාවරී වැනි ධ්‍යානලාභි වේදයන්හි පරතෙරට පිවිසි උගත් බ්‍රාහ්මණයෝ බුද්ධකාලීන භාරතයේ විසූහ. ඔවුන් උගත් ශාස්ත්‍රයක් ඇති බුද්ධ සංකල්ප පිළිබඳ මනා දැනුමක් ලබාගත් අය වූහ. මේ අයුරින්

භගවතුන් වහන්සේගේ පරචිත්ත විජානන ඥානය උන්වහන්සේ හඳුනා ගැනීමට උපකාර වන බවට පිළිගත්හ. යථෝක්ත, සාතාගිර, හේමවත සංවාදය හා පරායන වග්ගයේ එන තොරතුරු වලින් බුද්ධ කාලයේ විසූ බොහෝදෙනා තථාගතයන් වහන්සේ ගැන අවබෝධයෙන් සිටි වග පෙනේ.

දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් භාග්‍යවතුන් වහන්සේට හා සක්විති රජුන්ට පමණක්ම පිහිටන බවට බෞද්ධ සාහිත්‍ය බොහෝ සූත්‍ර වල අනාවරණය වන කාරණයකි. මහා පුරුෂ ලක්ෂණයන්ද මෙයට පරියාය නාමයකි. බුදුන් වහන්සේ කෙරෙහි ඒවා පිහිටා ඇති අයුරුත් එමඟින් උන්වහන්සේව හඳුනා ගැනීමට හැකි බවත් බාවරී අසිත ආදී බමුණන් මහාපුරුෂ ලක්ෂණයන් පිළිබඳව අවබෝධයක් ඇත්තේය. ඒවායින් බුදුන් වහන්සේ හඳුනා ගැනෙන ආකාරය සූත්‍රධම්වල මෙසේ සඳහන් වේ.

**"ආගතානි හි මනෙනසු මහා පුරුෂලක්ෂණ**
**දවනිසොනි ච ව්‍යාඛ්‍යාතා සමථා අනුපුබ්බසො**

**යසෙසත මොනති ගතෙතසු මහාපුරුෂලක්ඛණා**
**දුවෙව කසස ගතියො නතියො හින විජ්ජති**

**සඛ අගාරං අජ්කඑසති විජෙයති පඨමං ඉමං**
**අදණොඩන අසකෙථන ධමෙමන මනුසාසති**
**සබසො පබ්බතිති අගාරා අනගාරියං**
**විවතචජදෙදා සම්බුද්ධදෙවා අරණ භවති අනුත්තරෝ"[6]**

පිළිවෙළින් විස්තර කරන ලද පරිපූර්ණ වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වේදයෙහි ආයේය. යම් පුරුෂයෙකුට ශරීරයේ ඒවා ඇත්නම් ඔහුට දෙගතියෙන්ම වෙයි. තෙවැන්නෙක් නොමැත. ඔහු ගිහිගෙයි වේ නම් අදත්ථාධානයෙන් නොසැතින් මේ පොළොව දිනා දැහැමින් අනුශාසනා කරයි. නොහොත් සක්විති රජවෙයි. තවද ඔහු ගිහිගෙයින් නික්ම පැවිදි වේනම් නැතිකළ කෙළෙස් ඇතිව අරහත් අනුත්තර සම්මා සම්බුද්ධ වෙයි. මේ අයුරින් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිහිටන සත්පුරුෂයා තුන්ලෝකය තුළ ජීවිතය සාක්ෂාත් කරන ආකාරය සැකෙවින් විස්තර කෙරේ. බුදුරජාණන් වහන්සේ මෙහිලා විශේෂයෙන් අන්තර්ගත වෙන්නේ ඒ දෙගතියෙන් ගිහිගෙයින් නික්ම පැවිද්ව බුද්ධත්වයට පත්වූ කෙලෙස් රහිත උතුමෙකු ලෙසයි. සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව කලාතුරකින් බිහිවන දුර්ලභ මනුෂ්‍යයෙකු ලෙස භාරතීය විද්වත් සමාජය තුළ ප්‍රකටව ඇත.

යථෝක්ත කාරණා විශ්ලේෂණය කිරීම තුළින් කාරණා කීපයක්ම නිගමනය කළ හැක. බුදුරජාණන් වහන්සේ ජීවත් වූ භාරතීය සමාජය තුළ සිටි සමකාලීනයන් උන්වහන්සේ හා සම නොවීම ප්‍රධානම කාරණයයි. ඒ සියලු දෙනාම ප්‍රකාශ කරනුයේ උන්වහන්සේ වැනි උසස් කෙනෙකු තව මේ ලොව නැති බවයි. එසේම එකී සමකාලීනයන් පහත අයුරින් වර්ග කළ හැක.

**බුදු රජාණන් වහන්සේ ඇසුරු කළ සමකාලීනයන්**

**බුදුරජාණන් වහන්සේ ඇසුරු නොකළ සමකාලීනයන්**

කසීභාරද්වාජ, ආලවක, සාතාගිර සහ බවාරි බමුණාගේ ශිෂ්‍යයන් පළමු වර්ගයෙහි ලා ගත හැක. හේමවත, බවාරිගේ සොළොස් ශිෂ්‍යයන් අන් අයගේ උපදේශය මත භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කොට සරණ ගිය වූවන් ය. බවාරි බමුණා මෙහි දෙවැනි කොටසට අයත් ය. ඔහු උගත් ශාස්ත්‍රයෙන් බුද්ධ සංකල්පය ගැන කළ තොරතුරුවලින් පැහැදිලි වන්නේ තවත් එවැනිම බුදුරජාණන් වහන්සේ ගැන උගත් එහෙත් උන්වහන්සේ ව නොදුටු සමකාලීනයන් සිටි බවයි. එසේම තවද විශේෂී කරුණක් ඇත. එනම් මේ සමකාලීනයන් අතර මනුෂ්‍යයන් මෙන්ම සාතාගිර හෙමවත ආලවකා දී ධර්මය අවබෝධයට මුහුකුරා ගිය නුවණක් ඇති යක්ෂයින් ද සිටීමයි. දෙවියන් මිනිස් ලොව මිනිසුන්ට භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ හෙළිකොට උන්වහන්සේ වෙත එළඹීමට මඟපෙත් පෑදීම සනාථ කරනුයේ තථාගත කීර්තිය මනුලොව මිනිසුන් අතර පමණක් නොව දෙව්ලොවද ප්‍රචලිත බවයි. මේ සියලු කාරණාවල අවසාන නිගමනය ලොව විශිෂ්ටතම හා අග්‍රගණ්‍යම උසස්ම ආධ්‍යාත්මික හා චරිත ලක්ෂණ ගුණෝපේත පුද්ගලයා සම්බුදු රජාණන් වහන්සේ පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට ප්‍රයෝජනවත් ය.

**ආන්තික සටහන්**

1. කසීභාරද්වාජ සූත්‍රය 28 වැනි පිටුව.
2. කසීභාරද්වාජ සූත්‍රය, සුනිත නිපාතය පිටු 28.
3. සුත්ථ නිපාත කථාව පිටු. 4. හෙමවන සූත්‍රය මහා වග්ගය සුනීත නිපාතය.
5. වත්ථු ගාථා, පරායණ වග්ගය - 310 පිටු.
6. වත්ථු ගාථා, පරායණ වග්ගය - 310 පිටු.



# වෘක්ෂලතා ලෝකය පිළිබඳ බෞද්ධ ආකල්පය

ඩෙන්සිල් සේනාධීර

අප ජීවත්වන ස්වභාවික පරිසරය තුළ ශාක ප්‍රජාවට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. මනුෂ්‍යයා ඇතුළු සකල සත්ව ප්‍රජාවගේම මූලික අවශ්‍යතා සියල්ලක්ම වෘක්ෂලතා විසින් ඉටුකර දෙනු ලබන බව ඉතා පැහැදිලිය. සතුන්ගෙන් තොර උද්භිද ලෝකයක් පිළිබඳව අපට සිතා ගතහැකි නමුදු වෘක්ෂලතාවන්ගෙන් තොර සත්ව ලෝකයක පැවැත්මක් ගැන අපට සිතා ගත නොහැකිය. නාගරීකරණය සහ නූතන තාක්ෂණය වැනි සාධක පදනම් කරගත් ඊනියා සංවර්ධනයේ නාමයෙන් වෘක්ෂලතාවන්හි පවත්නා පාරිසරික අගය අමතක වී යාමේ ප්‍රතිඵලයක් වශයෙන් මතුවී ඇති ගැටලු නැවත වරක් උද්භිද ලෝකය පිළිබඳ ගවේෂණය කිරීමට මිනිසා යොමුවී ඇති බවක් ද දැකිය හැකිය. ඒ අනුව මෙහි ලා අපගේ උත්සාහය වනුයේ බුදුසමය වෘක්ෂලතා ලෝකය පිළිබඳව දක්වන ආකල්පය කවරේද යන්න සංක්ෂිප්තව විමසා බැලීමයි.

මෙහි ලා ප්‍රථමයෙන් සඳහන් කළ යුතු කරුණක් වනුයේ වෘක්ෂලතා, ප්‍රාණීන් සංඛ්‍යාවෙහි ලා බුදුසමය විසින් පිළිගනු ලබන බවය. මෙය පැහැදිලිව දැක්වෙන එක් අවස්ථාවක් වශයෙන් සුත්තනිපාතයේ වාසෙට්ඨ සූත්‍රය පෙන්වා දිය හැකිය. වාසෙට්ඨ සහ භාරද්වාජ යන බුද්ධිමත් බ්‍රාහ්මණ තරුණයින් දෙදෙනෙකු විසින් මතුකරන ලද මනුෂ්‍ය වර්ගයා උපතින්ම විවිධ ජාතීන්ට විභජනය කළ හැකිද යන පැණයට පිළිතුරු ලෙස ජෛවවිද්‍යාත්මක, සමාජවිද්‍යාත්මක සහ ආචාරවිද්‍යාත්මක සාධක පදනම් කරගනිමින් බුදුරදුන් විසින් ඉදිරිපත් කළ විග්‍රහය උන්වහන්සේ මෙසේ ආරම්භ කරති.

ප්‍රාණීන් ඒ ඒ වර්ගවලට බෙදී යන අයුරු මම ඔබට ක්‍රමානුකූලව සහ සාක්ෂි සහිතව විස්තර කරන්නෙමි. මක්නිසාදයත් ප්‍රාණීන්ගේ වර්ග ද විවිධ විශේෂයන්ගෙන් සමන්විත වන බැවිණි.

තෘණද වෘක්ෂද දැනගන්න. එහෙත් ඔවුහු ඒ බවක් පළ නොකරති. ඔවුහු අන්‍යොන්‍ය වශයෙන් විවිධ වූ විශේෂයන්ගෙන් සමසන්විතය.

**තෙසං වොහං ව්‍යක්ඛිස්සං අනුපුබ්බං යථා තථං**
**ජාති විභාගං පාණානං අඤ්ඤමඤ්ඤාහි ජාතියො**
**තිණ රුක්ඛෙ පි ජානාථ න චාපි පටිජානරෙ**
**ලිංගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤාහි ජාතියො**

(වාසෙට්ඨ සුත්ත, සුත්තනිපාත, පි. 188)

මෙහි ලා ප්‍රාථමිකව පෙන්වා දෙනු ලබන ප්‍රාණීන් වර්ගය වනුයේ වෘක්ෂලතා වීම අපගේ සාකච්ඡාවේදී ඉතා වැදගත් කරුණක් ලෙස සැලකිය හැකිය. සූත්‍රයෙහි එය දැක්වෙනුයේ 'තිණ රුක්ඛ' යන පදයෙනි. සුත්තනිපාත අට්ඨකථාව වන පරමත්ථජෝතිකාවෙහි සඳහන් වන පරිදි 'තිණ' යන්නෙන් තල් හා පොල් වැනි අභ්‍යන්තරයෙහි අරටුව රහිත එහෙත් බාහිරව අරටුව පවතින කඳින් සමන්විත ශාක ද රුක්ඛ යන්නෙන් අභ්‍යන්තරයෙහි අරටුව පවත්නා බාහිරව අරටුව නොමැති කඳින් සමන්විත ශාක ද අදහස් කෙරේ.

**තත්ථ තිණානි නාම අන්තො ඵෙග්ගුනී බහි සාරානි තස්මා තාලනාළිකෙරාදයො පි තිණ සංගහං ගච්ඡන්ති. රුක්ඛා නාම බහි ඵෙග්ගු අන්තා සාරා. තිණානි ච රුක්ඛා ච තිණ රුක්ඛා. තෙ උපයොග බහුවචනෙන දස්සෙන්තො ආහ තිණ රුක්ඛෙපි ජානාථා ති.**

(පරමත්ථජෝතිකා පි.346)

මේ අනුව තිණ රුක්ඛ යන පදයෙන් සකල ශාක ප්‍රජාව ම අදහස් කළ බවට නිගමනය කළ හැකිය.

වෘක්ෂලතා ප්‍රාණීන් සංඛ්‍යාවෙහි ලා සැලකුව ද ඒවා තුළ සත්වලෝකයෙන් විශේෂ කොට සැලකිය හැකි ලක්ෂණයක් ද පවතින බව එම සූත්‍රයෙහි එන සඳහනකින් පැහැදිලි වෙයි. එනම් ඒවායෙහි තමන් වෘක්ෂලතාවන් ය යන හැඟීමක් ඒවා තුළ නොමැති බවයි.

**තිණරුක්ඛෙ පි ජානාථ න චාපි පටිජානරෙ**

(වාසෙට්ඨ සුත්ත, සුත්තනිපාත, පි. 188)

මෙයින් අපට ගම්‍ය කරගත හැකි වනුයේ වෘක්ෂලතා ප්‍රාණීන් වුවද මිනිසා ඇතුළු සත්වලෝකයේ දක්නට ලැබෙන ආකාරයේ මනෝවිද්‍යාත්මක ක්‍රියාකාරීත්වයක් ඒවා තුළ නොපවත්නා බවය.

මෙහිදී අපගේ අවධානය යොමුවිය යුතු තවත් වැදගත් කරුණක් නම් ප්‍රාණීන් පිළිබඳව බුදුසමයේ දැක්වෙන 'තස-ථාවර' වර්ගීකරණයයි. මෙලොව දක්නට ලැබෙන ප්‍රාණීන් තස සහ ථාවර යනුවෙන් ප්‍රභේද දෙකකට වෙන්කොට දක්වා ඇති බව නිකාය ග්‍රන්ථවල දක්නට ලැබේ. මෙත්ත සූත්‍රයේදී 'තසා වා ථාවරා වා' (මෙත්ත සුත්ත, සුත්තනිපාත, පි. 44) යනුවෙන් ද ධම්මික සූත්‍රයේදී 'යෙ ථාවරා යෙච තසන්ති ලොකෙ' (ධම්මික සුත්ත, සුත්තනිපාත, පි. 118) යනුවෙන් ද නාලක සූත්‍රයේදී 'පාණෙසු තස ථාවරෙ' (නාලක සුත්ත, සුත්තනිපාත, පි. 218) යනුවෙන් ද සඳහන්ව තිබීම නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. තස යන්නෙන් අදහස් කෙරෙනුයේ චලනය වන ස්වභාවය වන අතර ථාවර යන්නෙන් අදහස් කෙරෙනුයේ නිශ්චලව පවතින ස්වභාවයයි. මේ අනුව මෙම වර්ගීකරණය සඳහා පදනම්ව ඇත්තේ ප්‍රාණියා සතු චලනය වීමේ හැකියාව බව පෙනේ.

**කෙසේවෙතත් සුත්තනිපාත අට්ඨකථාව වන පරමත්ථජෝතිකාව ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනුයේ වඩා වෙනස් අර්ථකථනයක් බව මෙහිදී පෙන්වා දිය යුතුව ඇත. ඒ අනුව තස යනුවෙන් හඳුන්වනු ලබනුයේ තෘෂ්ණාවෙන් සහ බයෙන් යුතු සසර ගමනෙහි නිරතව සිටින සත්වයින් එනම් අර්හත්වයට නොපැමිණි පෘථග්ජන පුද්ගලයෝය. ථාවර යනුවෙන් හඳුන්වනු ලබනුයේ තෘෂ්ණාව ප්‍රහාණය කරමින් සසර ගමන නැවැත්වූ රහතන් වහන්සේය.**

(සුත්තනිපාත අට්ඨකථා, පි. 141)

මෙම සාම්ප්‍රදායික අර්ථකථනයෙහි පවත්නා තාර්කිකත්වය මෙහිදී විමසා බැලීම අවශ්‍යය. යථොක්ත වර්ගීකරණය දැක්වෙන එක් ස්ථානයක් වන මෙත්ත සූත්‍රයෙහි තස සහ ථාවර යන පදවලින් අනතුරුව එන 'අනවසේසා' යන පදය වෙත සහ එම සූත්‍රයෙහි ම එන අනෙකුත් වර්ගීකරණ වෙත ද මෙහිදී අපගේ අවධානය යොමු කරමු. 'අනවසේසා' යන පදයෙහි අරුත වනුයේ ශේෂ නොකොට ආවරණය කරන්නේය යන්නයි. සූත්‍රයෙහි දක්නට ලැබෙන සෙසු වර්ගීකරණ සියල්ලෙන් ම මිනිසා පමණක් නොව ලෝකයෙහි වාසය කරන විවිධාකාර ජීවීන් සියල්ල ම කිසිවෙක් හෝ ඉතිරි නොකොට ආවරණය කෙරේ. (සුත්තනිපාතයේ මෙත්ත සූත්‍රය බලන්න). එහෙත් සාම්ප්‍රදායික අර්ථකථනය අප පිළිගන්නේ නම් තස සහ ථාවර යන වර්ගීකරණයට අයත්වන්නේ මනුෂ්‍යයා පමණි. එහිදී සූත්‍රයෙහි එන 'අනවසේසා' යන යෙදුම සමග එම පිළිගැනීම සංගත නොවන බවක් පෙනේ. ඒ අනුව තස යන්නෙන් මිනිසා ඇතුළු ඔබ මොබ ගමන් කිරීමේ හැකියාව ස්වභාවයෙන් ම ලබා ඇති ජීවීන් අදහස් කෙරෙන බවට නිගමනය කිරීම අසාධාරණ නොවේ. එහිදී ථාවර යන්නෙන්

ගමන් කිරීමේ හැකියාවක් නොමැති එකම ස්ථානයේ පසුවන ජීවීන් අදහස් කෙරෙන බව ද ගම්‍ය වෙයි. මෙම ගණයට කොරල් වැනි ඇතැම් සමුද්‍ර සත්වයින් පමණක් නොව වෘක්ෂලතා ද ඇතුළත් වන බව කිව යුතුය. මේ අනුව වාසෙට්ඨ සූත්‍රයෙහි දැක්වෙන පරිදි වෘක්ෂලතා සප්‍රාණික වස්තු ලෙස බුදුසමය විසින් පිළිගෙන තිබීම සෙසු සූත්‍ර මගින් ද තහවුරු වන බව දක්නට ලැබේ.

බුදුසමය අනුව වෘක්ෂලතාවන්ටද මිනිසුන්ට සහ සතුන්ට මෙන් ප්‍රාණය ඇති බවත් වාසෙට්ඨ සූත්‍රයෙන් ගම්‍ය වන පරිදි වෘක්ෂලතා තුළ පවත්නා ප්‍රාණය මිනිසුන් සහ සතුන් තුළ පවතින තරම් වර්ධිත මට්ටමක නොමැති බවත් මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා ද පවසයි.

(අබේනායක, 1995, පි. 125)

භික්ෂු සමාජය තුළ පවත්නා වස්විසීම නම් වූ චාරිත්‍රධර්මය ආරම්භ වීමට පදනම් වූ වස්සූපනායික ශික්ෂාපදය බුදුරදුන් විසින් පනවන ලද්දේ ද උද්භිද ලෝකය හා සබැඳි සිදුවීමක් හේතුකොටගෙන ය. ජෛන සමය විසින් තෘණ වෘක්ෂලතා ඒකේන්ද්‍රිය ප්‍රාණීන් ලෙස සලකනු ලබන අතර ඒවා කැඩීම හෝ මැඬීම පාපකර්මයක් කොට ද සලකති. වස්සූපනායික ශික්ෂාපදය බුදුරදුන් විසින් පනවන ලද්දේ එලෙස ඒකේන්ද්‍රිය ජීවීන් ලෙස මිනිසුන් විසින් සලකන ලද තෘණ සහ කුඩා ප්‍රාණීන් පාගමින් වැසි සමයේදී බුද්ධශ්‍රාවකයින් ගමන් කරන්නේය යනුවෙන් ඇතැම් දෙනා විසින් එල්ල කරන ලද චෝදනාව පදනම් කරගනිමිනි.

**ඉමෙහි පන සමණා සක්‍යපුත්තියා හේමන්තම්පි ගිම්හම්පි වස්සම්පි චාරිකා චරන්ති හරිතානි තිණානි සම්මද්දන්තා ඒකේන්ද්‍රියං ජීවං විහෙඨෙන්තා බහු ඛුද්දකෙ පාණෙ සංඝාතං ආපාදෙන්තා.**

(මහාවග්ගපාලි, පි. 347)

ඒකේන්ද්‍රිය ප්‍රාණීන් පිළිබඳ සංකල්පය බෞද්ධ මතයක් නොව ජෛන මතයක් බව සත්‍යයකි. ජෛන සමය විසින් ඒකේන්ද්‍රිය ප්‍රාණීන් ලෙස සලකන ලද්දේ ද වෘක්ෂලතා පමණක් නොවේ. ජෛන ඉගැන්වීම් අනුව වෘක්ෂලතා සහ තෘණ ආදී වූ සියලුම උද්භිද ගණයේ වස්තු ද පඨවි, ආපෝ, තේජෝ සහ වායෝ යන සතර මහාභූත ද ජීවාත්මයෙන් යුතු ඒකේන්ද්‍රිය ප්‍රාණීහු වෙති. බුදුසමයෙහි එවැනි ඉගැන්වීමක් නොමැත. එහෙත් බුදුරදුන් විසින් යථෝක්ත ශික්ෂාපදය පනවන ලද්දේ තත්කාලීන භාරතීය සමාජය තුළ ඉතා ප්‍රබලව පැවති ජෛන ආගමේ අනුගාමිකයින්ගෙන් එල්ලවූ චෝදනාවකින් ස්වකීය ශ්‍රාවක ගණයා බේරා ගැනීමේ අටියෙන් පමණක් නොව එම චෝදනාවෙහි කිසියම් සාධාරණ අන්තර්ගතයක් පවතින බව උන්වහන්සේට පෙනී ගිය නිසා යැයි ද සිතීම අයුක්ති සහගත නොවේ. එම සාධාරණ අන්තර්ගතය වූ කලී අන්කිසිවක් නොව වෘක්ෂලතාවන්හි පවත්නා පාරිසරික වටිනාකමයි. ඇත්තෙන්ම මෙම සිද්ධියෙන් ප්‍රකට වනුයේ කවරෙකුගේ හෝ සාධාරණ අදහසකට එකඟතාව දැක්වීම පිණිස උන්වහන්සේ තුළ පැවැති උතුම් වූ නම්‍යශීලී ගුණයයි.

වෘක්ෂලතාවලට මනුෂ්‍යයාට මෙන් විඤ්ඤාණයක් තිබේද යනුවෙන් කෙනෙකුට මෙහිදී ප්‍රශ්නයක් මතු කළ හැකිය. සප්‍රාණිකත්වය සහ සවිඤ්ඤාණිකත්වය යනු එකක්ද දෙකක්ද යන ප්‍රශ්නයත් මෙහිදී මතුවෙයි. මේවා වෙනම සාකච්ඡාවලට ලක් කළ යුතු ගැටලු වෙති. වෘක්ෂලතාවලට මිනිසාට මෙන් වර්ධිත ස්නායු පද්ධතියක් නොමැති බැවින් සංවේදීතාව පිළිබඳ ඒවායේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අප නොදන්නා බොහෝ දෑ තිබිය හැකිය. උද්භිද ලෝකය හෝ සත්ව ලෝකය හුදෙක් භෞතවේදීය හා මනෝවිද්‍යාත්මක විශ්ලේෂණවලට ලක්කිරීම බුදුසමයේ අරමුණ නොවන හෙයින් එවැනි විවරණ එහිදී සිදුවී ඇත්තේ බුදුසමයේ මූලික අරමුණට ප්‍රමාණවත් වන තරම් දුරකට පමණකි. ජෛන සමයෙහි මෙන් ඒකේන්ද්‍රිය යනාදී වශයෙන් වර්ගීකරණය නොකොට හුදෙක් ඊට වඩා ආනුභූතික ලෙස එහිදී එය වර්ගීකරණය කොට ඇත්තේ එබැවිනි.

දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි සඳහන් වන පරිදි වෘක්ෂලතා ද පරිණාමීය ධර්මතාවට යටත්වූ දෑ වෙති. එම සූත්‍රයෙහි දැක්වෙන කථා පුවත අනුව මෙලොව ප්‍රථමයෙන් ම හටගත් ශාක විශේෂය හැඳින්වෙනුයේ අහිච්ඡත්තක යනුවෙනි. මෙය ඉතා ප්‍රාථමික ගණයට අයත් පැළෑටි විශේෂයක් බව එහි දැක්වෙන විස්තරයෙන් පෙනේ. කාලයාගේ ඇවෑමෙන් එම ශාක වර්ගය අභාවයට යන අතර බදාලතා නම් වූ වැල් විශේෂයක් බිහිවෙයි. දීර්ඝ කාලයක් ඇවෑමෙන් එම ශාක වර්ගය ද අභාවයට යන අතර සහල් (සාලි) නම් වූ ශාකය බිහිවෙයි.

(අග්ගඤ්ඤ සුත්ත, දීඝනිකාය 3, පි. 144)

වෘක්ෂලතා ලෝකය පිළිබඳ එක්තරා වර්ගීකරණයක් දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ එයි. මෙම වර්ගීකරණය සඳහා නිර්ණායකය කොට ගෙන ඇත්තේ ඒවා ප්‍රජනනය වන ආකාරයයි. ඒ අනුව සියලුම වෘක්ෂලතා පහත දැක්වෙන පරිදි කොටස් පහකට බෙදේ.

1. මුල් මගින් ප්‍රජනනය සිදුවන ශාක *(මූලබීජං)*
2. කඳ මගින් ප්‍රජනනය සිදුවන ශාක *(ඛන්ධබීජං)*
3. පුරුක් මගින් ප්‍රජනනය සිදුවන ශාක *(ඵලුබීජං)*
4. දලු මගින් ප්‍රජනනය සිදුවන ශාක *(අග්ගබීජං)*
5. බීජ මගින් ප්‍රජනනය සිදුවන ශාක *(බීජබීජං)*

(බ්‍රහ්මජාල සුත්ත, දීඝනිකාය 1, පි. 10)

ඉහත වර්ගීකරණය දෙස බැලීමේදී පෙනී යනුයේ එය වෘක්ෂලතා ලෝකය සම්බන්ධයෙන් සිදුකරන ලද තියුණු නිරීක්ෂණයක් පදනම් කරගත් එකක් වන බවය.

ඇතැම් සුවිසල් වෘක්ෂ ආශ්‍රිතව කිසියම් අදෘශ්‍යමාන බලවේගයක් පවත්නේ යැයි කල්පනා කළ මනුෂ්‍යයෝ තමන් වෙත පැමිණෙන යම් යම් උවදුරු මඟහරවා ගෙන යහපත උදාකර ගැනීමේ අරමුණ ඇතිව වෘක්ෂ වන්දනාවෙහි යෙදුනු බවට සාධක ඇත. මෙහි නෂ්ටාවශේෂ අදත් නොදැකිය හැකි නොවේ. සිද්ධාර්ථ තාපසයාණෝ ඇසළ රුක මුල වැඩහිඳින වේලෙහි සුජාතා සිටු දියණිය ක්ෂීරපායාසය ගෙන එන ලද්දේ ද එම වෘක්ෂයට අධිගෘහිතව වාසය කරන්නේයැයි ඇය විශ්වාස කළ වෘක්ෂ දේවතාවාට පූජා කරනු පිණිසය.

කෙසේවෙතත් මිනිස් ජීවිත කෙරෙහි බලපානු ලබන එවැනි අධිභෞතික බලවේගයක් වෘක්ෂ ආශ්‍රිතව පවතින්නේය යන විශ්වාසය බුදුසමය විසින් පිළිගත්තක් නොවේ. බියෙන් තැතිගත් මිනිස්සු එම බිය නැතිකර ගැනීම පිණිස වනාන්තර, වෘක්ෂ සහ චෛත්‍යවල පිහිට පතන බවත් එය සාර්ථක ව්‍යායාමයක් නොවන බවත් ධම්මපදය සඳහන් කරයි.

**බහුං වෙ සරණං යන්ති - පබ්බතානි වනානි ච**

**ආරාම රුක්ඛ චෙත්‍යානි - මනුස්සා භය තජ්ජිතා**

**නෙතං ඛො සරණං ඛෙමං - නෙතං සරණමුත්තමං**

**නෙතං සරණමාගම්ම - සබ්බ දුක්ඛා පමුච්චති**

(ධම්මපදය 188 සහ 189 ගාථා)

කෙසේවෙතත්, වෘක්ෂදේවතා යනුවෙන් හඳුන්වනු ලබන කිසියම් පුද්ගල විශේෂයක් පිළිබඳ කරුණු ත්‍රිපිටක සාහිත්‍යයෙහි මෙන් ම ජාතක පොත වැනි කෘතිවල ද සඳහන් වෙයි. මෙම පුද්ගල විශේෂය වෘක්ෂ ආශ්‍රිතව වාසය කරන මිනිසාට වඩා ඇතැම් හැකියාවන්ගෙන් සමන්විත ඇතැම්විට මිනිසුන් සමග සංවාදයෙහි පවා යෙදෙන, සත්ව විශේෂයක් බව එම තොරතුරුවලින් පෙනීයයි.

මජ්ඣිම නිකායේ චූලධම්මසමාදාන සූත්‍රයේ එන කථා වස්තුවක වෘක්ෂ දේවතාවුන් වර්ග හයක් දැක්වෙයි. එනම් ආරාමදේවතා, වනදේවතා, වෘක්ෂදේවතා, ඕසධීදේවතා, තෘණදේවතා සහ වනස්පතිදේවතා යනුවෙනි.

අථ ඛො භික්ඛවෙ තස්මිං සාලෙ අධිවත්ථාය දේවතාය මිත්ත මච්චා ඤාතිසා ලොහිතා ආරාමදේවතා, වනදේවතා, රුක්ඛ ඔසධී තිණ වනස්පතීසු අධිවත්තා දේවතා සංගම්ම සමාගම්ම එවං සමස්සාසෙයුං.

(චූලධම්මසමාදාන සූත්‍රය, මජ්ඣිමනිකාය 1, පි. 718)

මේ පිළිබඳව විස්තර කරන අට්ඨකථාව පවසන්නේ ඒ ඒ තන්හි පිහිටා ඇති පුෂ්පොද්‍යානවලට සහ ඵලොද්‍යානවලට අධිගෘහිතව වාසයකරන දේවතාවුන් ආරාමදේවතා යනුවෙන් ද අන්ධවන සහ සුභවන යනාදී මහා වනාන්තරවලට අධිගෘහිතව වාසය කරන දේවතාවුන් වනදේවතා යනුවෙන් ද පූජ්‍යත්වයෙන් සලකනු ලබන නළෙරු සහ පුචිමන්දා වැනි ගස්වලට අධිගෘහිතව වාසයකරන දේවතාවුන් වෘක්ෂදේවතා යනුවෙන් ද අරළු සහ නෙල්ලි වැනි ඖෂධීය ශාකවලට අධිගෘහිතව වසන දේවතාවුන් ඕසධීදේවතා යනුවෙන් ද තල් සහ පොල් වැනි තාලවර්ගයේ ශාකවලට අධිගෘහිතව වාසය කරන දේවතාවුන් තිණදේවතා යනුවෙන් ද විශාල සහ පැරණි වෘක්ෂවලට අධිගෘහිතව වසන දේවතාවුන් වනස්පතී දේවතා යනුවෙන් ද හැඳින්වෙන බවය.

ආරාමදේවතානි තත්ථ තත්ථ පුෂ්පාරාමඵලාරාමෙසු අධිවත්ථා දේවතා, වනදේවතානි අන්ධවන සුභවනාදීසු අධිවත්ථා දේවතා, රුක්ඛදේවතානි අභිලක්ඛිතෙසු නළෙරු පුචිමන්දාදීසු රුක්ඛෙසු අධිවත්ථා දේවතා, ඕසධී තිණ වනස්පතීසු ති හරිටකී, ආමලකී ආදීසු ඕසදීසු, නාළනාළිකෙරදීසු

තිණෙසු වනපෙට්ඨකෙසු ච, වනස්පතී රුක්ඛෙසු අධිවත්ථා දේවතා.

(පපඤ්චසූදනීනාම මජ්ඣිමනිකායට්ඨකථා, පි. 309-310)

කෙසේවෙතත්, මෙම සූත්‍රයේදී එක් එක් වෘක්ෂදේවතාවුන් නම්කර ඇති අයුරු විමසා බලවවිට පෙනීයන්නේ ඒවා ඒ ඒ වෘක්ෂ තුළ පවත්නා සුවිශේෂී ලක්ෂණයක් හෝ උපයෝගීතාවක් ද්වනිත කරන ඒවා වන බවයි. කිසියම් පුද්ගලයෙකු, වස්තුවක් හෝ සංසිද්ධියක් තුළ පවතින විශේෂත්වයක් මතුකර පෙන්වමින් ජනතාවට කිසියම් වැදගත් පණිවුඩයක් දීම පිණිස බුදුසමය අනුගමනය කළ එක් උපායමාර්ගයක් වූයේ තත්කාලීන සමාජය විසින් පොදුවේ පිළිගෙන තිබුණු සංකල්පවලට නව අර්ථකථන දීමයි. එකල සමාජය තුළ ප්‍රචලිතව පැවති බ්‍රාහ්මණ, ආර්ය සහ මාර වැනි සංකල්පවලට මෙන් ම වෘක්ෂදේවතා සංකල්පයට ද යථොක්ත සූත්‍රය මගින් නව අර්ථකථනයක් ලැබුනු බව මෙහිදී අපට සිතාගත හැකිය.

බෞද්ධ චින්තකයින් විසින් වෘක්ෂලතාවලට දේවත්වයක් ආරෝපණය නොකරන ලද නමුත් ඒවා උසස් වැදගත්කමකින් යුතු වස්තු බව හඳුනාගෙන සිටි බව මෙයින් පෙනීයයි. වෘක්ෂලතාවල පවත්නා සුවිශේෂ ලක්ෂණ මෙන්ම ඒවායේ උපයෝගීතාව සංකේතාත්මකව ඉදිරිපත් කිරීම පිණිස බෞද්ධ චින්තකයෝ වෘක්ෂදේවතා සංකල්පය උපයෝගී කරගත් බව අපට නිගමනය කළ හැකිය.

ආරාමදේවතා යන්නෙන් සංකේතවත් කරනුයේ පුෂ්පෝද්‍යානවල සහ පලතුරු උද්‍යානවල පවත්නා මහඟු උපයෝගීතාවයි. උද්‍යානයක් වනාහි මනුෂ්‍යයා විසින් සංවිධානාත්මකව රෝපණය කරන ලද වෘක්ෂ සමූහයකි. පුෂ්පෝද්‍යාන මෙන් ම පලතුරු උද්‍යාන ද මානව සංස්කෘතියෙහි දියුණුව පිළිබිඹු කරන කැඩපත් බඳුය. ඈත අතීතයේ සිට ම දියුණු නාගරික ජනාවාසවල උද්‍යාන පිහිටුවීමට මිනිසා යුහුසුලු වූ බව ඉතිහාසයෙන් පෙනේ. උද්‍යාන මිනිසාගේ සෞන්දර්යාත්මක වින්දනය තෘප්තිමත් කරයි. ඔහුට සිසිලස හා විවේකය ලබාදෙයි. මිනිසාට පමණක් නොව පක්ෂීන් ආදී සතුන්ට ද උද්‍යානවලින් ඉටුවන සේවය ඉමහත්ය. කොන්ක්‍රීට් වනාන්තර බවට පත්වී ගෙන එන නූතන නගර තුළ පිහිටි පුෂ්පෝද්‍යානවල හා එලෝද්‍යානවල ඇති වැදගත්කම වර්තමානයේදී දිනෙන් දින වැඩිවෙමින් පවතී.

වනදේවතා යන්නෙන් සංකේතවත් කෙරෙනුයේ ස්වභාවික වනාන්තර යැයි අපට සිතාගත හැකිය. වනාන්තර වූ කලී සොබාදහම විසින් පරිසරය තුළ නිර්මාණය කරන ලද ඉතා වැදගත් ආයතනයකි. වනාන්තරයක් යනු හුදෙක් විවිධ ප්‍රමාණයේ වෘක්ෂලතා සමූහයක් පමණක් නොව විවිධ සත්වගණයාගේ ද පැවැත්මට සහ වර්ධනයට අත්‍යවශ්‍ය නිකේතනයකි. පෘථිවි ගෝලය මත දේශගුණික සමතුලිතතාව පවත්වාගෙන යාමට වනාන්තර උපකාරී වෙයි. පස සේදීයාම වළක්වයි. සූර්යාලෝකය කෙළින්ම පොළොවට පතිතවීම වළක්වන හෙයින් පාංශු ජලය වාෂ්පවීමේ වේගය අඩුකරයි. වනාන්තර වර්ග කිහිපයක් ඇත. මෙයින් ප්‍රධාන තැනක් ගන්නේ නිවර්තන වර්ෂා වනාන්තරය. එයට හේතුව වනාන්තරයක වර්ධනයට හිතකර සාධක වන අධික වර්ෂාව සහ අධික සූර්යාලෝකය වර්ෂයේ සෑම කාලයකදීම මේවාට ලැබෙන හෙයිනි. මේනිසා ලෝකයේ වෙනත් වනාන්තරවල වෙසෙන ජීවීන්ට වඩා අධික ජීවීන් සංඛ්‍යාවක් මේවායේ වාසය කරන අතර, ඒවා ලෝකයේ සාරවත්ම පරිසර පද්ධති බවට ද පත්ව ඇත. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන්නේ ද මෙම ගණයට අයත් වනාන්තරය.

ඕෂධීදේවතා යනුවෙන් සංකේතවත් කර ඇත්තේ වෘක්ෂලතාවන්හි පවතිනා ඖෂධීය ගුණය බව පැහැදිලිය. මිනිසාට වැලඳෙන ප්‍රධානතම රෝගය වූ කලී කුසගින්න බව ධම්මපදය පවසයි. (ධම්මපදය 303 ගාථාව.) මනුෂ්‍යයා ඇතුළු සියලු සත්වයින්ගේ පැවැත්මට සහ ශාරීරික වර්ධනයට අවශ්‍ය ආහාර සම්පාදනය කරදෙනු ලබනුයේ වෘක්ෂලතා විසිනි. මේ හැරුණුවිට මනුෂ්‍යයාට සහ සෙසු සත්වයින්ට වැලඳෙන විවිධ රෝගාබාධ සුවකිරීම සහ වැළැක්වීම පිණිස භාවිත කරනු ලබන ඖෂධ ලබාගනු ලබනුයේ ද ශාකවලිනි. ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයේදී යොදාගනු ලබන ඖෂධවලින් වැඩි කොටසක් පැළෑටිවලින් ලබාගන්නා බව අපි දනිමු. බටහිර වෛද්‍ය විද්‍යාවේ භාවිතවන බොහෝ ඖෂධ අද රසායනාගාර තුළ කෘත්‍රිමව සංස්ලේෂණය කරනු ලැබුව ද මුල්කාලයේදී ඒවා බොහොමයක් නිස්සාරණය කරගන්නා ලද්දේ පැළෑටිවලිනි.

වෘක්ෂදේවතා, තෘණදේවතා සහ වනස්පතිදේවතා යන සංකල්පවලින් සංකේතවත් කරනුයේ ඒ ඒ වෘක්ෂවල පවත්නා සුවිශේෂ ලක්ෂණ බවට අපට නිගමනය කළ හැකිය. වනාන්තරයක පවත්නා ශාක ප්‍රජාව ප්‍රධාන ස්ථර හතරකට බෙදේ. එනම්, නෙරු ස්ථරය, වියන් ස්ථරය, යටිවියන් ස්ථරය සහ බිම් ස්ථරය යනුවෙනි. නිවර්තන වනාන්තරයක ප්‍රධාන වනුයේ වියන් ස්ථරයයි. එය හිරුරැස් පොළොවට වැටීම බොහෝ දුරට වළක්වාලයි. මෙම ස්ථරයේ ශාක වනාන්තරයක මධ්‍යම ප්‍රමාණයේ උසක් දරන ඒවාය. වියන් ස්ථරයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ ශාකවල මුදුන් එකිනෙකට ආසන්නව පිහිටමින් ඒවා අතර පරතරයක් නැති වන සේ පැවතීමය. මෙම ස්ථරය සෑදී ඇත්තේ දෙවර්ගයක ශාකවලිනි. සමහර ශාක වනාන්තරයේ උසින් දෙවැනි තැන ගන්නා හොඳින් වැඩුනු ශාකය. තවත් සමහර ගස් වඩා උස ගස් බවට වැඩෙමින් පවතින ඒවාය. වෘක්ෂදේවතා යන්නෙන් අදහස් කරන ලද්දේ මෙම වියන් ස්ථරයට අයත් ශාක බව පෙනේ.

තෘණ යන්නෙන් අදහස් කෙරෙන්නේ තල් සහ පොල් වැනි තාලවර්ගයට අයත් එකබීජපත්‍රී ශාක බව පරමත්ථජෝතිකාව පවසයි. මෙයට අතිරේකව ඉතා කුඩා පැළෑටි ද මෙයට අයත් වන බව මහාවග්ගපාලියෙන් පෙනීයයි. මේ අනුව තෘණදේවතා යන්නෙන් අදහස් කරන ලද්දේ යටිවියන් ස්ථරයට සහ බිම් ස්ථරයට අයත්වන ශාක බවට නිගමනය කළ හැකිය.

ශාක ප්‍රජාව අතර ජීවත්වන යෝධ ශාක නෙරු ස්ථරයට අයත්වෙයි. මේවා උසින් මීටර පනහක් හෝ හැටක් පමණ වන අතර ඒවා වියන් ස්ථරය විනිවිද ගොස් සෙසු සියලුම ශාක අභිභවා නැගීසිටී. එබැවින් ඒවාට මනාව සූර්යාලෝකය ලැබේ. අධික උෂ්ණත්වයට මෙන්ම චණ්ඩ මාරුතවලට ද ඔරොත්තු දීමේ ශක්තිය ඒවා සතුය. වනස්පතිදේවතා යනුවෙන් චූලධම්මසමාදාන සූත්‍රයෙදී අදහස් කරන ලද්දේ මෙම නෙරු ස්ථරයට අයත් ශාක යැයි අපට නිගමනය කළ හැකිය.

භද්දසාල ජාතකයෙහි සඳහන් වන පරිදි මාලිගයක් ඉදිකිරීම පිණිස උයනෙහි පිහිටා තිබුණු විශාල සල්ගසක් කපන ලෙස රජු නියෝග කරයි. එවිට එම වෘක්ෂයෙහි වාසය කරන වෘක්ෂදේවතාවා අයැද සිටිනුයේ එක්වරම ගස නොකපන ලෙසත් අත්තෙන් අත්ත කපන ලෙසත් ය. එයට හේතු විමසූ කල්හි එම වෘක්ෂදේවතාවා පවසනුයේ තමන්ට කුමක් වුවද කම්නැති බවත් සිය ගස අවට ඇති බොහෝ පැළෑටිවල වාසය කරන සිය ඥාතීන්ට හිරිහැරයක් වෙතැයි සිතා එලෙස ඉල්ලා සිටින බවත්ය. මෙම කථාව මගින් ආධ්‍යහාරයෙන් පවසනුයේ විශාල ගසක් කපා බිම හෙළන කල්හි එය එක්වරම කපා නොහෙලා අවට පිහිටි කුඩා ගස්වලට හානියක් නොවන පරිදි එය සිදුකළ යුතු වන බවය.

**බුද්ධ චරිතයෙහි මූලික සිදුවීම් බොහොමයක් වෘක්ෂ ආශ්‍රිතව සිදුවී ඇති බව සඳහන් වෙයි. සිද්ධාර්ථ කුමරුන්ගේ උපත සිදුවූයේ ලුම්බිණියේ සල් වෘක්ෂයක් මූලයෙහි ය. සිද්ධාර්ථ තාපසයින් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ ගයාවේ ඇසතු වෘක්ෂ මූලයෙහිය. එමෙන් ම සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූයේ ද කුසිනාරා නුවර සල්රුක් සෙවණකය. බුද්ධත්වයෙන් ප්‍රථම සතිය නේරංජරා නදිය සමීපයෙහි ඇසතු බෝධි රුක්ඛ මූලයෙහි ද දෙවන සතිය අජපාල නම් නුග වෘක්ෂ මූලයෙහි ද තෙවන සතිය මිදෙල්ල වෘක්ෂ මූලයෙහි ද සිවුවන සතිය කිරිපලු වෘක්ෂ මූලයෙහි ද පස්වන සතිය නැවත අජපල් නුග වෘක්ෂ මූලයෙහි ද විමුක්ති සුවය විඳිමින් ගතකළ බව වාර්තා වෙයි.**

(මහාවග්ගපාලි, පි. 2- 11)

ගෞතම බුදුරදුන් පමණක් නොව ඊට පෙර ලෝකයේ පහළ වූ බුදුවරයින් වහන්සේලා ද සත්‍යාවබෝධය ලබා ඇත්තේ කිසියම් වෘක්ෂයක් පාමුලය. ඒ අනුව විපස්සී බුදුහු පළොල් ගසක් පාමුල ද සිඛී බුදුහු හෙළඹ ගසක් පාමුල ද වෙස්සභූ බුදුහු සල්ගසක් පාමුල ද කකුසන්ධ බුදුහු මහරි ගසක් පාමුල ද කෝණාගමන බුදුහු දිඹුල් ගසක් පාමුල ද කාශ්‍යප බුදුහු නුගගසක් පාමුල ද බුද්ධත්වයට පත්වූහ. (මහාපදාන සූත්‍රය, දීඝනිකාය, පි. 7). ලෝකයේ මෙතෙක් පහළවූ බුදුවරයින්වහන්සේලාගේ සංඛ්‍යාව මෙතෙකැයි කිව නොහැකිය. මේ අනුව උන්වහන්සේලා හැම කෙනෙක්ම අවබෝධඥානය ලබා ඇත්තේ වෘක්ෂමූලයකම වන බැවින් ද ඒ ඒ බුදුවරයින් වහන්සේලා විවිධ වාක්ෂමූලයන්හි ඒ සඳහා වැඩසිටි බැවින් ද ලෝකයේ ඇති සෑම වෘක්ෂයක් ම පාහේ කිසියම් බුදුවරයෙකුගේ පහසින්

පූජනීයත්වයට පත්වී ඇතැයි අපට උපකල්පනය කළ හැකිය. ඒ අනුව ලොව ඇති සෑම වෘක්ෂයක් ම බෝධි වෘක්ෂයක් බවට පත්වීමේ සම්භව්‍යතාවෙන් යුතුබව මෙහි ලා සැලකිය යුතුය.

වෘක්ෂලතා සහ සතුන් අතර පවතින අන්තර් සම්බන්ධතාව ද්වනිත කරවන කථා වස්තුවක් ද පන්සිය පනස් ජාතක පොත තුළ අන්තර්ගත වෙයි. එනම් තිත්තිර ජාතකයයි. එහි දැක්වෙන පරිදි හිමාලය වනයෙහි මහා නුග වෘක්ෂයක් ඇසුරු කොටගෙන තිත්තිර නම් කුඩා කුරුල්ලෙක් ද වානරයෙක් සහ හස්තියෙක් මිතුරුව වාසය කරති. ඔවුන් අතුරින් වැඩිමහලු තැනැත්තා සොයාගැනීමට ඔවුනට අවශ්‍ය විය. ඒ සඳහා ඔවුන් අනුගමනය කළ උපායමාර්ගය වූයේ ඔවුන් ඇසුරු කරන නුග ගස කවර කලෙක සිට පවතින්නේදැයි විචාරීමය. ඔවුහු එකිනෙකා මෙසේ ප්‍රකාශ කළහ.

මම ළාබාල කල්හි මේ නුගගස බඩ යටකොට ගියෙමි. යටකොට සිටි කල්හි වනාහි මේ වෘක්ෂයාගේ මුදුන් ශාකය මාගේ නාභිය ගැටෙන්නේ යැයි හස්තියා පැවසීය.

මම වානර පැටවා කල්හි බිම හිඳ ග්‍රීවය නොඔසවා ම මේ නුග පැළෑටියේ අක් දලු කැවෙමි යැයි වානරයා පැවසීය.

පූර්වයෙහි අසවල් නම් තැන මහත් නුග වෘක්ෂයක් වූයේය. මම ඒ වෘක්ෂයාගේ ඵලයක් අනුභව කොට මෙතැන්හි වර්චස් එළෑයෙමි. එයින් මේ වෘක්ෂය හටගත්තේ යැයි තිත්තිර නම් කුඩා පක්ෂියා පැවසීය.

සත්වලෝකයේ පැවැත්මට වෘක්ෂලතා උපයෝගී වන ආකාරය පමණක් නොව වෘක්ෂලතාවන්ගේ පැවැත්මට සත්වගණයා උපයෝගී වන ආකාරය ද මෙම කථාවෙන් නිරූපිතය. සත්තු ස්වකීය ආහාර හා වාසස්ථාන වැනි දෑ වෘක්ෂලතාවන්ගෙන් ලබාගන්නා සේ ම වෘක්ෂලතාවන්ගේ පරාගණය සහ ප්‍රචාරණය වැනි කාර්යයන්ට ද සත්වලෝකය දායකවන ආකාරය මෙයින් පැහැදිලි වෙයි.

වෘක්ෂලතා අරබයා පවතින බෞද්ධ ආචාරධර්මීය ආකල්පය පිළිබිඹු වන සංවාදයක් ඛුද්දක නිකායේ පේතවත්ථුපාලියෙහි දැක්වෙයි. මෙම සංවාදය සිදුවන්නේ ප්‍රවීණ වෙළඳ ව්‍යාපාරිකයෙකු සහ ඔහුගේ සහායට පැමිණෙන නවක වෙළඳ ව්‍යාපාරිකයෙකු අතර බව දක්නට ලැබේ. සාකච්ඡාවට විෂය වනුයේ ඔවුන් පෙරදින නැවතී සිටි ස්ථානයෙහි තිබුණු සුවිශාල වෘක්ෂයකි. එම ගස කපාගෙන නගරයට ගෙනගොස් විශාල මුදලක් උපයා ගැනීමට ප්‍රවීණ ව්‍යාපාරිකයා යෝජනා කරන නමුත් නවක ව්‍යාපාරිකයා එයට තරයේ විරුද්ධ වෙයි. ඔහු පවසනුයේ කිසියම් ගසක සෙවණෙහි යමෙක් මොහොතක් හෝ වාසය කළේ නම් එම ගසෙහි අත්තක් හෝ නොකැපිය යුතු බවත් එය මිත්‍රද්‍රෝහී ළාමක ක්‍රියාවක් වන බවත්ය. එහෙත් ඊට පිළිතුරු දෙන ප්‍රවීණ ව්‍යාපාරිකයා පවසනුයේ තමන්ට වාසියක් වේ නම් එවැනි ගසක අතු පමණක් නොව කඳ වුව ද කපාගෙන යාම සුදුසු වන බවය. එහෙත් නවකයා මෙයට එරෙහිව කරුණු දක්වමින් පවසනුයේ යම් ගසකින් සෙවණ ලද පුද්ගලයෙකු එම ගසෙහි කොළයක් හෝ නොකැඩිය යුතු බවත් එසේ කිරීම මිත්‍රද්‍රෝහී ළාමක ක්‍රියාවක් වන බවත්ය. එහෙත් ප්‍රවීණ ව්‍යාපාරිකයා මෙහිදී පවසන්නේ තමන්ට ලාභයක් උපයාගත හැකිනම් කෙනෙකු සෙවණ ලැබූ ගස සහමුලින් ම උදුරාගෙන යාම වුව ද සුදුසු වන බවය. එහෙත් මෙහිදී නවකයා නැවත නැවතත් අවධාරණය කරනුයේ යම් පුද්ගලයෙක් කිසියම් ගෙයක එක රැයක් හෝ වාසය කළේනම් යමෙකු සමීපයෙහි ආහාර පානාදිය ලබාගත්තේ නම් ඔහුට අවැඩක් සිහිනෙන් වත් නොසිතිය යුතු වන බවත් කෘතඥතාව සත්පුරුෂයින් විසින් අනුගමනය කෙරෙන උතුම් ගුණාංගයක් වන බවත්ය.

**යස්ස රුක්ඛස්ස ඡායාය -**
**නිසීදෙය්‍ය සයෙය්‍යවා**
**න තස්ස සාඛං භඤ්ජෙය්‍ය -**
**මිත්තදුබ්බොහි පාපකො**
**යස්සෙකරත්තම්පි ඝරෙ වසෙය්‍ය -**
**යත්ථන්න පානං පුරිසො ලභෙථ**
**න තස්ස පාපං මනසාපි චින්තයෙ -**
**කතඤ්ඤුතා සප්පුරිසෙහි වණ්ණිතා**

(අංකුර පේත වස්තුව, පේතවත්ථුපාළි, පි. 53)

මෙහිදී ප්‍රවීණ ව්‍යාපාරිකයාගේ වචනවලින් නියෝජනය වනුයේ හුදෙක් ධනය රැස්කිරීම සඳහා මිනිසා තුළ පවත්නා තෘෂ්ණාව හේතුකොටගෙන වෘක්ෂලතාවන්ට සිදුවන විනාශයයි. නවක ව්‍යාපාරිකයාගේ අදහස්වලින් නියෝජනය වනුයේ වෘක්ෂලතාවන්ගෙන් මිනිසාට ඉටුවන සේවය සහ ඒ අරබයා පවත්නා සුහදශීලී බෞද්ධ ආකල්පයයි.

බෞද්ධ සදාචාර දර්ශනය මානව සමාජය සහ සත්ව සමාජය ද ඉක්මවා යමින් උද්භිද ලෝකය දක්වා පැතිර පවත්නා බව බෞද්ධ මූලග්‍රන්ථ පමණක් නොව බුදුසමයේ ආභාසය ලත් බොහෝ රටවල සංස්කෘතිකාංග විමසා බැලීමෙන් ද පෙනීයයි.

ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේ තෘණ වෘක්ෂලතා විනාශ කිරීමෙන් වැළකුණ බව බ්‍රහ්මජාල සූත්‍රය පවසයි (බ්‍රහ්මජාල සූත්‍රය, දීඝනිකාය 1, පි. 8). කසීභාරද්වාජ බ්‍රාහ්මණයා විසින් පිරිනමන ලදුව බුදුරදුන් විසින් පිළිනොගත් පායාසය නිල් තණ නොමැති බිමෙක හෝ ප්‍රාණීන් රහිත තැනෙක බහාලන ලෙස උන්වහන්සේ උපදෙස් දුන්හ (කසීභාරද්වාජ සූත්‍රය, සුත්තනිපාත, පි. 26). පාචිත්තිය පාලියෙහි එන භූතගාම ශික්ෂාපදය අනුව වෘක්ෂ බීජයක්, එය බීජයක් බව දැන දැන සිඳීම හෝ බිඳීම හෝ වරදක් වෙයි. තව ද බීජයක් බවට සැකයක් පවතින වස්තුවක් සම්බන්ධයෙන් පවා එලෙස ක්‍රියාකිරීම වරදකි. එපමණක් නොව බීජයක් නොවන වස්තුවක් බීජයක්ය යන හැඟීමෙන් යුතුව සිඳීම, බිඳීම හෝ පිසීම වරදක් වෙයි (භූතගාම ශික්ෂාපදය, පාචිත්තිය පාලිය, පි. 107). මක්නිසාදයත් වෘක්ෂලතා තුළ ජීවය පවත්නා බවට හැඟීමක් මිනිසා තුළ පවත්නා බැවිණි. සංයුත්තනිකායේ වනරෝප සූත්‍රයෙහි සඳහන් වන පරිදි පුෂ්පොද්‍යාන සහ ඵලෝද්‍යාන නිර්මාණය කිරීම දිවා රාත්‍රියෙහි පින් වැඩෙන පුණ්‍යක්‍රියාවක් වෙයි.

**ආරාමරෝපා වනරෝපා තෙ ජනා සෙතුකාරකා**
**පපඤ්ච උදපානඤ්ච යෙ දදන්ති උපස්සයං**
**තෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති**
**ධම්මට්ඨා සීලසම්පන්නා තෙ ජනා සග්ගගාමිනො**

(වනරෝප සූත්‍රය, සංයුත්තනිකාය 1, පි. 60)

වෘක්ෂලතාවන්හි පවත්නා පාරිසරික අගය බුදුසමය විසින් වටහාගෙන තිබෙන අයුරු ඉහත දැක්වෙන කරුණුවලින් අපට පැහැදිලි වෙයි.

**ආශ්‍රිත ග්‍රන්ථ:**

දීඝනිකාය කාණ්ඩ. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය.2006

මජ්ඣිමනිකාය කාණ්ඩ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය.2006

සංයුත්තනිකාය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය.2006

ධම්මපදය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය. 2006

මහාවග්ගපාලි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය. 2006

පේතවත්ථුපාලි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය. 2006

සුත්තනිපාත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, ශ්‍රී ලංකාණ්ඩුවේ මුද්‍රණය. 2006

පපඤ්චසූදනීනාම මජ්ඣිමනිකායට්ඨකථා, සයිමන් හේවාවිතාරණ භාරය ප්‍රකාශනය, 1933.

පරමත්ථජෝතිකා නාම සුත්තනිපාතට්ඨකථා, සයිමන් හේවාවිතාරණ භාරය ප්‍රකාශනය, 1940.

පන්සියපනස්ජාතක පොත්වහන්සේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1995.

Abeyanayake, Oliver. Fundamentals of Buddhist Polity, 1995, Sarana Buddhist Associatiom, Singapore

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දායකත්වය ලබාගැනීම**

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් පාලනය කරනු ලබන භික්ෂු විවේකාශ්‍රම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස සහ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 27ක් ඇත.

එම ආයතනවල දානමාන හා සංවර්ධනයත් සඳහා ඔබගේ දායකත්වයන් ලබාදීමට කැමැත්තක් දක්වන්නේ නම් අප වෙත යොමුවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

වැඩි විස්තර
**www.acbc.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැකිය.**
**නැතිනම් පහත දුරකථන අංකවලින් විමසන්න.**
**දුරකථන: 0112 669017, 0112 691695, 0112 688517**



# ඓතිහාසික රෝහණ රාජ්‍යයේ සීමා මායිම්

**පූජ්‍ය මහාචාර්ය**
**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**
**පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

රාජ්‍යත්වය යන සංකල්පය බිහි වීමත් සමඟ ප්‍රාදේශීය භූ භෞතික සාධක සැලකිල්ලට ගෙන විමධ්‍යගත පාලන තන්ත්‍රයක් බිහි වී ඇත. පණ්ඩුකාභය (ක්‍රි:ව.107-30) රාජ්‍ය කාලයෙන් ඇරඹුණු මෙරට ප්‍රථමයෙන් භූ ඛණ්ඩයක් මත සීමා නිර්ණය කිරීමේ ක්‍රමවේදය අනුරාධපුර මධ්‍ය භාගය වන විට ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන ලෙස බෙදී ගොස් සංවිධානාත්මක පාලන තන්ත්‍රයක් ගොඩනැගීම දක්වා වර්ධනය වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර අවධිය අවසාන කාල පරිච්ඡේදය වන විට විවිධ රාජ්‍ය කාලවල අඩුවැඩි වශයෙන් ප්‍රාදේශීය පාලනයට නතු වූ උපරාජ්‍ය හඳුනාගත හැකිය. ලංකා ඉතිහාසය තුළ රෝහණ රාජ්‍ය ආරම්භයේ සිට අවසානය දක්වා උපරාජ්‍යයක් ලෙස පැවතිය ද ප්‍රාදේශීය බෙදීම් අනුව ප්‍රධාන රාජ්‍යයක් මෙන් බලවත් භූමි භාගයක් හා බලතන්ත්‍රයක් නතු කර ගෙන සිටි බව පැහැදිලිය.


ලංකාවේ පුරාණ දේශ සීමා නිර්ණය කිරීම භූ භෞතික පිහිටීම සැලකිල්ලට ගෙන සිදු කර ඇත. ප්‍රධාන රාජ්‍යය අවට පවතින අවශේෂ ප්‍රදේශ ප්‍රධාන පාලන බලයට නතු කර ගැනීමට පාලකයෝ ක්‍රියාකර කළ හ. මෙලෙස ක්‍රියාත්මක වීම සඳහා බලපාන ලද කරුණු කිහිපයක් කි, එනම් ආරක්ෂිත බලකොටු, ස්වභාවික සම්පත්, ජාත්‍යන්තර සබඳතා පැවැත් වීමේ අවකාශය, ස්වභාවික ආරක්ෂිත භූමි භාගයක් වීම මේ අතර වැදගත් වේ. අනුරාධපුරය ප්‍රධාන පාලන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ අවධියේ සිට උපරාජධානිය වශයෙන් රෝහණයට සක්‍රීය දායකත්වයක් ලබා දී ඇත. මහාවංශයේ සඳහන් වන ආකාරයට දේවානම්පියතිස්ස රජුගේ (ක්‍රි:ව: 250-210) බාල සොහොයුරෙකු වන මහානාග විසින් රෝහණය උපරාජධානියක් ලෙස ගොඩනගා ගෙන ඇත (මහාවංශය, 1996). එතැන් සිට රජරට ප්‍රධාන පාලක මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ අවධියේ සිට රජුන් තැනීමේ කාර්යය උපරාජධානිය වූ රෝහණයට පැවරී ඇති සුවිශේෂිතම කාර්යය කි. මේ හෙයින් රාජ්‍යත්වයට පැමිණි සෑම පාලකයෙකු ම උපරාජයෙක් ලෙස හෝ යුද සේනා සංවිධානය ආදී කාර්යයන්වල දී රෝහණ රාජ්‍ය තුළ ස්වකීය පන්නරය ලබාගත් බව පැහැදිලිය.

භූ විද්‍යාත්මක සාධක කෙරෙහි සැලකිලිමත් වෙමින් භූ විද්‍යාඥයන් "කලාපීය" වශයෙන් බෙදා දක්වා ඇත. මේ අනුව ලංකාවේ දේශගුණික හා පාංශු තත්ත්වය සැලකිල්ලට ගෙන පාරිසරික කලාප අනුව සිදුකළ වර්ගීකරණය වළවේ ගඟ කේන්ද්‍රයේ සිට බටහිර අර්ධය පහතරට තෙත් කලාපයටත් (WZLC)

නැගෙනහිර අර්ධ හතරට වියළි කලාපයටත් (DZLC) ලෙස බෙදා දක්වයි (Panabokke, 1998). මෙම කලාපවල වර්ෂාපතන විචල්‍යතාවල සාමාන්‍ය මිලිමීටර් 25000-500 දක්වා අගයන් ලබන අතර මෙය බටහිර හා නැගෙනහිර ප්‍රදේශවල වර්ෂාපතන විචල්‍යතාවල මධ්‍යයනය සැලකිල්ලට ගෙන බෙදීම් නිර්ණය කර ඇත (Sirinanda, 1983; Domroes, 1998).

පාෂාණවල ව්‍යාප්තිය අනුව සිදු කළ වර්ග කිරීමක් වශයෙන් සංකීර්ණ "Complex" ලෙස බෙදා දැක්වීම පෙන්වාදිය හැකිය. ඒ අනුව භූගෝලීය සාධක පිළිබඳ සැලකිලිමත් වීමේ දී සමස්ත ලාංකීය භූතලය ප්‍රාග් කේන්ද්‍රිය යුගයට අයත් පාෂාණ හා ඒවායේ වර්ග ලක්ෂණ හා ව්‍යුහය අනුව උපකොටස් හතරකට බෙදා දක්වා ඇත. එනම්,

1. උස් බිම් සංකීර්ණය - මධ්‍යම කඳුකර, උස් බිම් ද ඇතුළු ඊසාන දිග සිට නිරිත දිග දක්වා ව්‍යාප්තව ඇත.
2. වන්නි සංකීර්ණය - බටහිර විජයානු සංකීර්ණය ලෙස හඳුන්වන උස්බිම් සංකීර්ණයෙන් බටහිර පහත් බිම් ප්‍රදේශයෙන් ව්‍යාප්තව ඇත.
3. විජයානු සංකීර්ණය - නැගෙනහිර විජයානු සංකීර්ණය ලෙස හඳුන්වන මෙය උස්බිම් සංකීර්ණයෙන් නැගනෙහිර ප්‍රදේශයේ ව්‍යාප්තව ඇත.
4. කඩුගන්නාව සංකීර්ණය - උස් බිම් සංකීරණයෙන් මධ්‍යස්ථ පිහිටා ඇති නමුත් මෙහි අන්තර්ගත පාෂාණ වර්ග උස් බිම් සංකීර්ණයෙන් බටහිර වේ.





(Coorey, 1989).

## සිතියම් අංක 04/05: භූ භෞතික සාධක සැලකිල්ලට ගෙන සිදුකළ වර්ග කිරීම

පුරාණ රෝහණය ඉහත භූගෝලීය බෙදීම්වලට අනුව විජයානු සංකීර්ණයට අයත් වේ. මෙම කලාපයෙන් අනාවරණය කරගත හැකි සුවිශේෂී භූ විෂමතා ලක්ෂණ ලෙස (පාෂාණ වර්ගීකරණය අනුව) කළු සහ සුදු වර්ණයෙන් යුක්ත නයිස් පාෂාණ (Gneisses) තීරූ වශයෙන් ව්‍යාප්තව ඇති ක්වාට්ස් හා පෙල්ක්පාර් විශේෂ වේ. වළවේ ගඟ හා කිරිඳි ඔය අතර කලාපයේ හා හම්බන්තොට කලාපයෙන් මෙම පාෂාණ හඳුනාගත හැකිය. රෝස පැහැති පෙල්ස්පාර් පාෂාණ (Feldspar gneisses) කිරින්ද සිට කෝමාරිකාගල දක්වා විහිදී ඇත. විශාල කුට්ටි වශයෙන් ව්‍යාප්තව ඇති පාෂාණ මඟුල් මහාවිහාරය සිට නිරිත දිග හා තිස්සමහාරාමයට නැගෙනහිර දක්වා ම ව්‍යාප්තව ඇති අයුරු දැකගත හැකිය (Coorey, 1984; Almond, 1955). නයිස් පාෂාණය බහුලව දැකිය හැකි කලාප ලෙස කතරගම, පානම, යාල වනෝද්‍යානය ආදී ප්‍රදේශයන් පෙන්වාදිය හැකිය. නැගෙනහිර කලාපයේ බෞදද්ධ ආරාම සංකීර්ණවල ව්‍යාප්තිය මෙම භූ භෞතික සාධක අනුව ස්ථානගත වී ඇති අයුරු පැහැදිලිය. සමස්තයක් ලෙස ගත්කළ පුරාණ රෝහණ උපරාජ්‍ය ගොඩනැගීම සඳහා මෙම භූ භෞතික සාධකවල සකස් වීම සෘජුව ම බලපා ඇත.

භූ විෂමතා ලක්ෂණ පදනම් කර ගනිමින් සමස්ත ලාංකීය භූ කලාප ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වා ඇත. එය මූලික වශයෙන් භූමියේ සම්මෝච්ඡ රේඛාවල විහිදීම සැලකිල්ලට ගෙන සිදු කළ වර්ග කිරීමකි. මෙම බෙදීම් අනුව,

1. මුහුදු මට්ටමින් අඩි 300 ට වඩා පහත් බිම් ප්‍රදේශ මුහුදු බඩ ප්‍රදේශ ලෙස ද
2. මුහුදු මට්ටමින් අඩි 300 ටත් 1200 ක් අතර උස් ප්‍රදේශ උස් බිම් ප්‍රදේශ ලෙස ද
3. දිවයිනේ මධ්‍ය කොටස් අඩි 1200 ට වඩා උස් සමෝච්ඡ රේඛා සහිත ප්‍රදේශ කඳුකර ප්‍රදේශ ලෙස ද
4. මුහුදු මට්ටමින් උස අඩි 3000 පමණ වූ ඌව ද්‍රෝණි ආදි ප්‍රදේශ උස්සානු පෙළ හරහා ඒමේ අතට විහිදෙන බිම් ප්‍රදේශ ලෙස ය (ආරියපාල, 1969).





**සිතියම් අංක 01: රුහුණු මායා පිහිටි අනුව බෙදීම**

ලංකාවේ භූගෝලීය සාධක මත පිහිටා සිදු කළ ප්‍රථම බෙදීම රුහුණු, මායා, පිහිටි වශයෙන් බෙදා වෙන් කර ඇත. මෙම බෙදීමට අනුව රෝහණ රාජ්‍යයට අයත් ප්‍රදේශය පසුකාලීනව වඩාත් ලඝු කර ඇති බවක් පැහැදිලිය. වර්තමාන දකුණු පළාතට අයත් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක රෝහණය උපරාජ්‍යක් ලෙස ක්‍රියාත්මකව පැවති අවධියේ වෙනත් රාජ්‍යන්වලට අයත්ව පැවති දිස්ත්‍රික්ක බව පැහැදිලිය. ඒ අනුව දකුණු පළාතට අයත් "හම්බන්තොට" දිස්ත්‍රික්කය මුල් බෙදීමට අනුව රෝහණයටත් "ගාල්ල" හා "මාතර" දිස්ත්‍රික්ක මායා රටටත් අයත් ව පැවතී ඇත. මෙම පුරාණ බෙදීම අනුව රුහුණු, මායා, පිහිටි රාජ්‍යවලට අයත් අවශේෂ දිස්ත්‍රික්ක ද හඳුනාගත හැකිය. එම කලාප වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

| රුහුණු | පිහිටි | මායා |
|---|---|---|
| හම්බන්තොට | මාතලේ | පුත්තල |
| වැල්ලවාය | පොළොන්නරුව | කුරුණෑගල |
| බදුල්ල | අනුරාධපුරය | ගම්පොළ |
| නුවරඑළිය | පදවිය | කොළඹ |
| මොනරාගල | ත්‍රිකුණාමලය | කෑගල්ල |
| දිගාමඩුල්ල | වව්නියාව | කළුතර |
| මහියංගනය | මන්නාරම | රත්නපුර |
| මඩකලපුව | මුලතිව් | ගාල්ල |
| සේරුවාවිල | යාපනය | මාතර |
| | | මහනුවර |


**වගු අංකය: රුහුණු, මායා, පිහිටි ප්‍රදේශවලට අයත් උපප්‍රදේශයන්**

මෙම බෙදීම සඳහා මූලිකව ම පදනම වී ඇත්තේ කලා ඔය, මහවැලි ගඟ හා වළවේ ගඟ යි. මහවැලි ගඟ හා කලා ඔය අතර කලාපය පිහිටි රට ලෙසත් වළවේ ගඟ හා කලා ඔය අතර කලාපය මායා රට ලෙසත් වළවේ ගඟ හා මහවැලි ගඟ අතර කලාපය රුහුණු රට ලෙසත් හඳුනාගත හැකිය.




**සිතියම් අංක 02: රුහුණු මායා පිහිටි රාජ්‍යවලට අයත් අවශේෂ ප්‍රදේශ**

භූ භෞතික සාධකවල විහිදීම සැලකිල්ලට ගෙන දේශ සීමා නිර්ණය කළ අවස්ථාවල සකස් වීම අනුව කළුගඟ දක්ෂිණ දේශය හා රෝහණය මායිම් වන ගංගාවයි. සබරගමු කඳු වැටියෙන් ආරම්භ වන කළු ගඟ සැතපුම් 70 පමණ දුරක් ගමන්කර කළුතර



වෙරළෙන් මුහුදට සම්බන්ධ වේ. මෙයට අමතරව රට අභ්‍යන්තරය හරහා ගලායන කුඩා ගංගා ලෙස බෙන්තර ගිං ගඟ ගාලු ගඟ, නිල්වලා ගඟ, මාතර ගඟ වැදගත් වේ. රෝහණයේ අභ්‍යන්තර ප්‍රාදේශිය බෙදීම් සඳහා මෙම අභ්‍යන්තර භූ භෞතික සාධක බලපා ඇත. රෝහණයේ දකුණු ප්‍රදේශයේ හා ගිනිකොන දිග ගංගාවේ, වළවේ ගඟ සැතපුම් 83ක් ද, කිරිඳි ඔය සැතපුම් 73 ක් ද, මැණික් ගඟ සැතපුම් 81ක් ද හා කුඹුක්කන් ඔය සැතපුම් 70ක් ද වශයෙන් මධ්‍ය කඳුකරයේ සිට රට අභ්‍යන්තරය හා වෙරළ බඩ කලාපය හරහා මුහුදට වැටේ (එම, 10 පිට).

**සිතියම් අංක 06: රෝහණ භූගෝලීය සාධකවල ව්‍යාප්තිය**

වර්තමාන භූගෝලීය බෙදීම් අනු දකුණු පළාතේ භූ රූපණය අනුව කලාප 05 ක් හඳුනාගත හැකි වේ.


1. තංගල්ලෙන් නැගෙනහිරට විහිදී යන රැළිබිම් ප්‍රදේශය
2. මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවලත් බටහිරට ව්‍යාප්තවන කඳුගැටි මුදුන් හා නිම්න ලක්ෂණ
3. බෙන්තර සිට මාතර දක්වා වෙරළබඩ කලාපයේ පටු තීරුවක් ලෙස විහිදී යන කබොක් කඳු ගැට සහ තැනිතලාවන් ජල වහන රටාවන් ආශ්‍රිත ගංගා තැනි යන මුවදොර කලාප
4. මාතර දිස්ත්‍රික්ක උතුරු ප්‍රදේශයේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තැනින් තැන ව්‍යාප්තව ඇති ශේෂ කඳු ගැට, පාෂාණ උද්ගත, ගල්තලා යන පාෂාණ වැටි
5. ගාල්ලෙන් ගිනිකොන දිගින් යන මාදුගඟ නිම්නයේ පටු තීරුවක් ලෙස දක්නට ලැබෙන හොලෝසීන වෙරළ ලක්ෂණ සහ වැටි

**සිතියම් අංක 03: අභ්‍යන්තර බෙදීම සඳහා බලපාන ලද ස්වභාවික පිහිටීම**

රෝහණ උපරාජ්‍ය බිහි වීම සඳහා වළවේ ගඟ ප්‍රබල දායකත්වයක් ලබා දී ඇති නිර්මිතයක් ලෙස සැලකිය හැකිය. රෝහණයේ දෙවැනි අගනුවර වශයෙන් ක්‍රියාත්මක වූ මහානාගහුල අම්බලන්තොට ප්‍රදේශයේ පිහිටා ඇති අතර මේ කලාපය වළවේ ගඟ මධ්‍ය කලාපයක් ලෙස සැලකිය හැකිය. කිරිඳි ඔය (කිරින්ද නදි) ඇල්ලපොල්ලෙන් බැස බුත්තලට




බස්නාහිරින්, වැල්ලවාය පසුකර පහළම මාර්ගයේ දී රෝහණයේ පැරණි අගනුවර වූ මාගම සහ තිස්සමහාරාමය අසල ප්‍රදේශවලට ජලය සපයමින් ගලායයි. නැගෙනහිරින් රෝහණයට අයත් ප්‍රධාන ගංගාව වන්නේ මහවැලි ගඟ හෙවත් වාලුකා නදියයි. රෝහණයේ භූමි ප්‍රමාණය පිළිබඳව පෙන්වාදෙන ගෛගර් සඳහන් කරන්නේ "දැන් රුහුණු නම් ගිනිකොන රට එවක රෝහණය නමින් හඳුන්වන ලදි. රෝහණයේ භූමි ප්‍රමාණය සබරගමුව හා ඌව පළාත්වලින් කොටසක් ද, ඇතුළුව වර්තමාන නැගෙනෙහිර සහ දකුණු පළාත් දෙක ප්‍රමාණයට ඉතා කිට්ටුය" ඊසානයේ සිට නිරිතදිගට මෙය රාජරටින් ගඟ දක්ෂිණ දේශයෙන් වෙන් කළ මායිම් නම් ගං මෝයේ සිට වළය නම් වූ කඳුකරයේ වැටෙන තැන දක්වා වූ මහවැලි ගඟ ද කඳුකරය අසල වූ මෝයේ සිට ආරම්භ වන කළු ගඟ ද වේ (ගයිගර්, 1969).




**සිතියම් අංක 07. රෝහණ රාජ්‍ය තුළ ප්‍රාදේශීය බෙදීම්**

මුල් අවධිය තුළ අනුරාධපුරය උත්තර ප්‍රදේශය, ප්‍රාචීන දේශය, පුබ්බ දේශය, පුරත්ථිම දේශය, පශ්චිම දේශය සහ දක්ෂිණ දේශය ලෙස බෙදා වෙන් කර ඇත. මෙම අවධිය තුළ අගනුවර අනුරාධපුරයට උතුරු, බස්නාහිර, නැඟෙනහිර, දකුණු යන සතර දිග්හි වූ ප්‍රදේශ අයත් ව පැවතිණි. එහෙත් පසුකාලීන දේශපාලන මැදිහත් වීම මත මෙම කලාප නැවත අන්තර් කලාප වශයෙන් ද බෙදා වෙන් කර ඇත. ක්‍රි:ව 6 වැනි සියවස වන විට සිලාකාල (සලමෙවන්) මෙය අන්තර් කලාප වශයෙන් බෙදා වෙන් කරන ලදී. එම බෙදීම් අනුව ප්‍රාචීන දේසය තම වැඩිමහල් පුතුට ද, දක්ෂිණ දේශය දෙවැනි පුත්‍රයාට ද බෙදා වෙන් කර දී ඇත. අනුරාධපුර මුල් අවධියේ බෙදීම් ක්‍රමය ක්‍රි:ව 8 වන සියවස වන තෙක් භාවිතයේ පැවතී ඇත. මෙහි දක්ෂිණ දේශය ලෙස නම් කර ඇති කොටසට සමස්ත රෝහණය අයත් නොවූ බව පැහැදිලි වනුයේ 4 වැනි කස්සපගේ (ක්‍රි:ව: 896-913) කාලයේ සිට උතුර එක්සේසත් රාජ්‍යයක් ලෙස පැවැති හෙයිනි. රෝහණය මෙයින් වෙන්ව පාලන කටයුතු ගෙනගොස් ඇත. පසුව රාජරට්ඨ, දක්ෂිණ දේශ සහ රෝහණ යන දේශත්‍රය ම ව්‍යවහාර කිරීම හඳුනාගත හැකිය. 12 වන සියවස අගභාගයේ දී රාජරට්ඨ සහ දක්ෂිණ දේශ යන නාමයන් අභාවයට ගොස් පතිට්ඨාරට්ඨ (පිහිටි) හා මායා රට්ඨ ලෙස භාවිතයට පැමිණ ඇත. මෙයට රෝහණ රාජ්‍යය ද එකතුව රුහුණු, මායා, පිහිටි ලෙස ත්‍රිසිංහලය ලෙස නම් කිරීම හඳුනාගත හැකි වේ (ආරියපාල, 1969).

වර්තමානයේ රුහුණු ලෙස හඳුන්වන "ගිනිකොන රට" අතීතයේ රෝහණය ලෙස ව්‍යවහාර විය. භූමි ප්‍රමාණය අතින් රෝහණය සබරගමුව හා ඌව පළාත්වලින් කොටසක් ද ඇතුළුව වර්තමානයේ නැඟෙනහිර සහ දකුණු පළාත් දෙක වන ගාල්ල /මාතර /හම්බන්තොට දිස්ත්‍රික්කවල වඩාත් සමීප වේ. මෙහි සීමා මායිම් වන්නේ ඊසානයෙහි සිට නිරිතදිගට රාජරට්ඨ හා දක්ෂිණ දේශයන්ගෙන් වෙන් කළ මායිම් නම්, ගං මෝයේ සිට මහවැලි ගඟ දක්වා ද, කළුතර අසල වූ මෝයේ සිට ආරම්භ වන කළු ගඟ වේ.

කිරිඳි ඔය අසල වර්තමානයේ මාගම ලෙස හඳුනාගනු ලබන ස්ථානයේ වෙනම රාජධානියක් පිහිටු වා ගන්නා ලද්දේ ක්‍රි:ව 3 වන සියවසේ දී දේවානම් පියතිස්සගේ බාල සොහොයුරා වූ මහානාග විසින් බව මහාවංශය පෙන්වාදෙයි. මෙතැන් සිට ශතවර්ෂ ගණනාවක්ම රාජ්‍ය උරුම කුමාරවරුන් බිහි කළ භූමියක් බවට රෝහණ රාජ්‍ය පත් වී ඇත. භූ ගෝලීය අතින් රෝහණ රාජ්‍ය පුළුල් ලෙස ව්‍යාප්ත වූ රාජ්‍ය කාල පරිච්ඡේදයක් වශයෙන් පළමු වන විජයබාහු රාජ්‍ය කාලය (ක්‍රි:ව: 1059 - 1114) පෙන්වාදිය හැකිය. කුරුණෑගලට ඊසාන දිගින් පිහිටි වර්තමානයේ බදලගොඩ නම් වූ බදලත්ථල නම් ගම්මානය හෝ නගරය පෙන්වාදිය හැකිය. විජයබාහු රාජ්‍ය කාලයෙන් පසු දක්ෂිණ දේශයේ අගනුවර පුංචගාමය වූ බවත් එය කෑගල්ලට සැ: 12 ක් නිරිත දිගින් වර්තමාන කෑගල්ලට අයත් දැදිගම බව පැහැදිලිය. පසුව කුරුණෑගලට දකුණින් පිහිටි 'සංඛත්ථලි' අගනුවර වී ඇත (කොඩ්රිංටන්, 1986). පරාක්‍රමබාහු රට එක්සේසත් කිරීමට පෙර ඔහුගේ පාලන බලය සුමනකූටයේ සිට සමුද්‍රතීර්ථයන් දක්වා ව්‍යාප්තව පැතිරී පැවතිණි.

12 වන සියවස මුල් භාගය තුළ රෝහණ රාජ්‍යත්වය මත කොටස් දෙකකට බෙදුණි. එනම් කිත්සිරිමේඝ සහ සිරිවල්ලභ යන දෙසොයුරන් දෙදෙනා අතර බෙදුණි. එනම් කිත්සිරිමේඝ විසින් දොළොස් දහස් රට හෙවත් ද්වාදසසහස්සකරට්ඨ නම් නිරිත දිග ප්‍රදේශය සිය පාලන බලයට නතු කර ගෙන ඇත. සිරිවල්ලභ විසින් අටදහස් රට හෙවත් අට්ඨසහස්සකදස නම් ඊසාන දිග පෙදෙස් වල බලය පිහිටුවා ගත්තේ ය. මෙම ප්‍රාදේශය බල ප්‍රදේශවල අගනුවර වශයෙන් කිත්සිරිමේඝ අම්බලන්තොට නමින් වර්තමානයේ හැඳින්වෙන අතීතයේ මහානාග හුල අගනුවර ලෙස තෝරා ගන්නා ලදී. සිරිවල්ලභ සිය අගනුවර වශයෙන් මොනරාගල අසල ප්‍රදේශයක් තෝරා ගෙන ඇත. අටදහස් රටට දීඝවාපි ප්‍රදේශය අයත්ව පැවැති බව තහවුරු වන සේ මේ කලාපය යුද්ධ ව්‍යාපාර සිදුවූ ස්ථානයක් ලෙස ප්‍රසිද්ධයක් ඉසිලූ බැවිනි.

දොළොස් දහස් රටෙහි (ද්වාදසසහස්සයෙහි) දක්ෂිණ දේශයට යාව තිබෙන කොටසෙහි බටහිර දෙසින් පිහිටි කොටස නම් පඤ්චයෝජනරට්ඨ (පස්දුන් කෝරළය හා නවයෝජනරට්ඨයි) පස්දුන් කෝරළයෙන් එක් කොටසක් සබරගමුවට ද තවත් කොටසක් රෝහණයට ද අයත් ව පවතින්නට ඇත. ඒ බව තහවුරු වනුයේ කළුතරට සැතපුම් 18 ක් පමණ දකුණින් පිහිටි බෙන්තොට නම් වූ භීටතිත්ථ පඤ්චයෝජනයේ පිහිටා තිබීමෙනි. එමෙන්ම දක්ෂිණ දේශයේ සිට මුහුදු බඩ මහානාගහුලය

දක්වා ඉදිරියට යාමට පරාක්‍රමබාහුගෙන් අණ ලැබූ සෙන්පතියා පළමු ආරක්ෂක පෙරමුණ මුණගැසී ඇත්තේ ගාල්ල අසල ගිං ගඟ (ගිංතොට) නම් වූ ගිම්හතිත්ථයේදී ය. මෙම ගමනේ දී පසුකර ගිය ප්‍රදේශ වන්නේ වැලිගම කඹුරුගමුව යන ගම් පසු කළ බව පෙන්වාදෙයි. මේ අනුව සබරගමුවට අයත් ප්‍රදේශයන්ගෙන් එක් කොටසක් දක්ෂිණ දේශය හෙවත් රෝහණයට අයත්ව පවතින්නට ඇතැයි පැහැදිලිය. නවයෝජනය කුමන රාජ්‍ය කාලයක් තුළ වුවද එයින් එක් කොටසක් දක්ඛිණ දේශය හෙවත් රෝහණයට අයත් ව පවතින්නට ඇතැයි පැහැදිලිය. නවයෝජනය කුමන රාජ්‍ය කාලයක් තුළ වුව ද එයින් එක් කොටසක් රෝහණයට අයත්ව පැවතී ඇත. ඒ බව පැහැදිලි වනුයේ රත්නපුරයට ගිණිකොනින් වූ පැල්මඩුල්ල මාදම්පේ ද්‍රෝණියෙහි වූ දෙවන (ද්‍රෝණිවග්ග) සිට නව යෝජනයට දිවෙන මාර්ගයේ රක්වාන කඳු වැටිය නිසා ඇති බාධා සැලකිල්ලට ගෙන රෝහණයේ කැරලිකරුවන්ට විරුද්ධව පරාක්‍රමබාහුගේ සෙන්පති 'රක්ඛ' ගෙනගිය යුද ක්‍රියාදාමයේ වැදගත් ස්ථානයක් ලෙස පැවති හෙයිනි.

12 වන සියවසේ අවසාන භාගයේ ශ්‍රී ලංකාව රජරට, දක්ෂිණ දේශය හා රුහුණු රට වශයෙන් ප්‍රදේශ තුනකට බෙදා තිබුණු බව ප්‍රකට ය. මෙම බෙදීම්වල සීමා මායිම් ලෙස රජරට හා උතුරු මැද පළාත් වශයෙන් සැලකෙන ප්‍රදේශ මාතලේ උතුරු හා නැගෙනහිර පළාත් ද, මළය රට නමින් හැඳින් වූ කඳුකර පළාත් ද අයත් වී ඇත. දක්ෂිණ දේශයට තිබ්බා, ගිරිබා, මෝරවාපි, මහීපාල, පිලවිට්ඨික, බුද්ධගාම, අම්බවන, බෝදිගාමවර, කණ්ටකපෙටක රට්ඨ ආදී ප්‍රදේශ ද, පඤ්චයෝජනය ද ඇතුළත් ශ්‍රී පාද අඩවියේ සිට මුහුද දක්වා බිම් තීරය දකුණු මායිම කොටගත් ප්‍රදේශය දක්ෂිණ දේශය නම් විය (චූ. ල, 69:8). රුහුණු රට වර්තමානයේ මරකඩ නොහොත් නාකුළුගමුව නමින් හැඳින්වෙන මහානාග කුලය අගනුවර කොටගත් දළ වශයෙන් දකුණු පළාත යැයි සැලකිය හැකි දොළොස් දහස් රටත් ඌව පළාත යැයි සැලකිය හැකි අගනුවර උද්ධනද්වාරය කොටගත් (උඳුන්දොර) අටදහස් රටත් රුහුණු රට ලෙස සලකනු ලබයි (JRAS:Vol XvIX:65). 12 වන සියවස අගභාගය වන තෙක්ම මෙම බෙදීම් මෙලෙස පැවතිණි.

13 වන සියවස ආරම්භයත් සමග නැවත ලංකාව රුහුණු මායා පිහිටි වශයෙන් කොටස් තුනකට වෙන් වී ඇත. මෙම බෙදීම කුමන කාලයක් තුළ සිදු වී ද යන්න නිශ්චිත සාක්ෂි තහවුරු කර ගැනීම අසීරු ය. කාල පරිච්ඡේදයක් වශයෙන් පළමු වන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ සිට ලීලාවතී රැජිනගේ (ක්‍රි:ව: 1197-1200) දක්වා අතරතුර නව බෙදීමට පදනම වැටෙන්නට ඇති බව පූර්ව පර්යේෂණ දක්වා විස්තරයේදී පැහැදිලිය. එය ක්‍රි:ව: 1214-1235 කාල වකවානුවේ දී ඇති වන්නට ඇති බව පෙන්වාදිය හැකිය (චූල, 81.41). ශිලා ලේඛන සාක්ෂි අනුව ලීලාවති රැජින ත්‍රිසිංහලයම එක් සේසත් කළ බව ද ශිලා ලේඛන සාක්ෂි දරයි. අනතුරුව දශක කිහිපයක්ම මෙම බෙදීම සැලකිල්ලට ගෙන රට පාලනය කළ අතර 16/17 සියවස්වල යුරෝපීය පාලනයට නතු වීමත් සමග ප්‍රාදේශීය පාලන ක්‍රමයට අනුව නැවත කුඩා පළාත්වලට බෙදා පාලනය ගෙන ගොස් ඇත. මෙහි දී අපේක්ෂිත අරමුණ වූයේ පුරාණ රෝහණය තුළ සිදු වූ බල විචල්‍යතා සමග දේශපාලන බෙදීම් කුමන ආකාරයෙන් සිදුවී ද යන්න අධ්‍යයනය කිරීමයි. 21 වන සියවස වන විට පුරාණ රෝහණය අයත් භූමි භාගය නැගෙනහිර පළාත (අම්පාර මොනරාගල ත්‍රිකුණාමලය) දකුණු පළාත (ගාල්ල, මාතර, හම්බන්තොට) සබරගමුව පළාත්වලින් කොටසක් ද අයත් ව පැවතැණි. එහෙත් වර්තමානයේ බෙදීම් අනුව පුරාණ රෝහණයේ වැඩි කොටසක් නැගෙනහිර පළාතට අයත්ව ඇති බව පැහැදිලිය.

### ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංශය* (සිංහල), (1967), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, නුගේගොඩඑ දීපානි ප්‍රකාශකයෝ. පි. 47-48.

*මහාවංශය* (පාලි), (1959), සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

*ගයිගර්, විල්හෙල්ම්,* (1969), පරිවර්තනය. ඇම්. ඩී. ආරියපාල. මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය.ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. ආරියපාල, ඇම්. ඩී. (2014). මධ්‍ය කාලීන ලංකා සමාජය.ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.


Cooray, P.G. (1984), *The Geology of Sri Lanka,* (Ceylon). 2nd eds. Colombo: National Museum Publication, 24-124. pp.

Cooray, P.G¡ (1984), *An Introduction to the Geology of Sri Lanka (Ceylon).* Colombo: National Museum of Sri Lanka, 70-75. pp.

Domroes, M.(1998). Variabilities of temporal and climate.

Journal of the Royal Asiatic Society (JRAS), Colombo. Vol. XXIX. 65 pp

Sirinanda, K.U. 1983.Rainfall variability patterns and agricultural production in Sri Lanka. In: Yoskino, M.M.I.Kayane and C.M.Maddhuma Bandara eds. Climate water and agriculture in Sri Lanka.Japan: University of Tsukuba Ibaraki.PP 83-110.



# ඇසළ පොහොය උදාවේ බොදු අසිරිය

**ශාස්ත්‍රවේදී චන්ද්‍රසිරි වැලිගමගේ**

ශ්‍රී බු: වර්ෂ 2565 ක්වූ ඇසළ මස නොහොත් මෙම ජූලි මස 23 වැනිදාට ඇසළ පුර පසළොස්වක පොහොය යෙදී ඇත. ලෝකවාසී බෞද්ධ ජනතාවට ඇසළ පුර පසළොස්වක පොහොය වැදගත් වන කරුණු කිහිපයකි. ඉන් පළමුවැන්න ලෙස හැඳින්විය හැක්කේ සිදුහත් කුමරා ඇසළ පුන් පොහොය දිනයේදී මහමායා දේවියගේ කුසයෙහි පිළිසිඳ ගැනීමයි.

බෝසත් කුමරා ගිහිගෙයින් නික්ම යෑමට (අභිනිෂ්ක්‍රමණය) සමගාමීවම රාහුල කුමරාගේ උපත සිදුවූයේද අද වැනි ඇසළ පුන් පොහෝදාකය. ගිහිගෙයින් නික්ම ගිය ගමන සාර්ථකවී බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව ප්‍රථම ධර්ම දේශනාව උදෙසා (ධම්මචක්කප්පවත්තන සූත්‍රය) පස්වග තවුසන් (කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම සහ අස්සජී යන තවුසන්) සොයා ගෙන බරණැස ඉසිපතනයේ මිගදායට බුදු හිමියන් වැඩම කරන ලද්දේද ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූයේ ද ඇසළ පුන් පොහෝ දිනකය.

බුදුරජාණන් වහන්සේ ප්‍රථම වස් විසීම සිදු වූයේද ඇසළ පුන් පොහෝ දිනකදීය. එමෙන්ම මහා සංඝයා වහන්සේගේ පෙර වස් එළැඹීම ද මෙම පොහොයේදී සිදු කරයි.

බුදුරජුන් තව්තිසා දෙව්ලොවට වැඩම කොට, මහාමායා දේවියගේ දේව උප්පත්තිය වූ මාතෘ දිව්‍ය රාජයා ප්‍රමුඛ දෙවියන් උදෙසා අභිධර්මය දේශනා කරන ලද්දේද ඇසළ පොහොය දවසේදීය. ඒවගේම ප්‍රථම ධර්ම සංඝායනාව පැවැත්වීමට කටයුතු ආරම්භ කිරීමද මෙම පොහොයේදී සිදුවිය.

ඓතිහාසික මහනුවර ශ්‍රී දළදා සහ සතර මහා දේවාල පෙරහර, රුහුණු කතරගම මහා දේවාලයේ වාර්ෂික පෙරහර මංගල්‍ය, බෙල්ලන්විල පෙරහර ගඩලාදෙණි පෙරහැර, මැදවල පෙරහැර ගල්ගමුව පෙරහර දෙවුන්දර පෙරහැර ආදී බොහෝ පෙරහර මෙම ඇසළ මාසය පුරාවටම පවත්වනු ලැබේ. මෙහි සඳහන් කරන ලද බෞද්ධාගමික සිදුවීම් සියල්ල මෙනෙහි කරන විට මෙම පොහොය බොදු සැදැහැවතුන්ට පමණක් නොව සමස්ත ලෝකවාසී බොදුනුවනට ඉතා වටිනාම පොහොයකි.

බුද්ධ චරිතය, බුද්ධ ධර්මය, ශාසන ඉතිහාසය, බෞද්ධ ජනතාව හුරු පුරුදු වී ඇති බෞද්ධ සිරිත් විරිත් සම්බන්ධයෙන් ලක්වැසි බෞද්ධ ජනතාව වගේම සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාව අතිමහත් ගෞරවයකින් සිහිපත් කරන ශ්‍රී දළදා වහන්සේ හා ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ සම්බන්ධවත් ඇසළ පුන් පොහොය ඓතිහාසික සිදුවීම් රාශියකින්ද

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි 2021 ජූලි - අගෝස්තු

උද්දීපනයට පත්ව ඇත. සිදුහත් බෝසත් කුමරුගේ මාතෘත්වයට පත් වූ සුද්ධෝදන මහා රජතුමාගේ අග මෙහෙසිය වූ මහා මායා දේවියගේ කුසෙහි සිදුහත් බෝසතාණන් පිළිසිඳ ගැනීමත්, වෙසතුරු අත්බවින් මිදුණු මහා බෝසතුන් එතැන් සිට සත්තුසිත දිව්‍ය ලෝකයේ තුසිත නම් දිව්‍ය රාජව පහළ වී පස් මහා බැලුම් බලා තුසිත දෙව්ලොවින් චුතව, මේ මනුලොව මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගැනිණි.

දඹදිව මධ්‍ය දේශයෙහි රජපත් සුද්ධෝදන මහා රජුගේ අගමෙහෙසිය වූ මහාමායා දේවිය එදා ඇසළ පුර පසළොස්වක පුන් පොහෝදින පෙහෙවස් සමාදන් ව රාත්‍රී නින්දට ගිය පසු දුටු සිහිනය වූයේ සුදු ඇත් පැටියෙක් සුදු නෙළුම් මලක් සිය සොඬෙන් රැගෙන අවුත් දේවියගේ කුසයේ දකුණැලයෙන් සිය කුස තුළට ඇතුළු වූවාක් මෙන් දේවියට දැණුනු කියැවුණු බවයි.

**ඇසළ මාසයේ අමාවක දිනයේදී සුරාසුර යුද්ධයේදී සුරයන්ගේ ජයග්‍රහණය සිහිපත් කිරීමට ඇසළ උත්සවය ආරම්භ වූ බව බෞද්ධ වංශ කථාවේ සඳහන් වේ.**

ඉන් පසුව එළැඹුණ වෙසක් පොහෝදින මනුලොව උපන් සිද්ධාර්ථ නම් ඒ බෝසතාණන් සොළොස්වන වියේදී කපිලවස්තු නුවර රජ පැමිණ යශෝධරාව සිය අගමෙහෙසිය කර ගන්නා ලදී. එතැන් සිට වසර දහතුනක් ශරීරයට අපමණ ලෞකික සුව සම්පත් ලබා දෙමින් සිට සතර පෙර නිමිති දැක ගිහිගෙයි ජීවිතය ගැන අපමණ කලකිරීමට පත්ව එදින රාත්‍රී නින්දට ගොස් මහා රෑ අවදි වූ කල්හි නිළියන්ගේ විකාර රූ දැක, සිත කලකිරීමට පත්කරගත් අප මහා බෝසතාණන් වහන්සේ මේ මහා රෑ ගිහිගෙය අතහැර අභිනිෂ්ක්‍රමණය කළෙත් ඇසළ පුන් පොහොය දවසකම බව බුද්ධචරිතය තුළ සඳහන් වේ.

එමෙන්ම බුදුරජාණන් වහන්සේගේ චරිතාප්‍රදානය තුළ ඉතා වැදගත් කරුණක් වන්නේ සිදුවීම් දාමයකට සම්බන්ධ කතා පුවතකි. සිදුහත් රජතුමාගේ පුත් කුමරු වූ රාහුල කුමාරයාගේ උපත සිදු වුයේද මේ ඇසළ පුර පසළොස්වක පොහොය දිනයක වීම සුවිශේෂී සංසිද්ධියකි.

ඇසළ පෙරහර මාසය ගැන සඳහන් කළහොත් ශ්‍රී ලංකාවේ පෙරහර පිළිබඳ ඉතිහාසය සිහල වංශ කථාවේ දිගු අතීතයකට නෑකම් කියනු ලබයි. මහා වංශයේ සඳහන් (මහා වංශය 24-39 ගාථා ) අන්දමට විජය රජතුමා පඬුවස් දෙව් රජතුමාගේ දියණිය මහත් වූ පෙරහරකින් අග මෙහෙසි තනතුරට පත් කළ බව සඳහන් වේ.

ඇසළ මාසය පැරණි දඹදිව උත්කර්ෂවත් මාසයක් ලෙසින් සැලකූ බවට වූ බොහෝ සාක්ෂි බුද්ධ චරිතය ආශ්‍රිතව අපට දැනගන්නට ලැබේ. මහමායා දේවිය පෙහෙවස් සමාදන්ව සිටි සතියපුරා කාලයේදී කිඹුල්වත් පුර නුවර 'ඇසළ කෙළිය' නමින් වූ විසිතුරු උත්සවයක් පැවැති බව ජාතක කතාවෙහි සඳහන් වේ.

පත්තිනි හෑල්ලෙහි සඳහන් අන්දමට පත්තිනි දේවිය ඇසළ මාසයේදී විශේෂ කෙළිපුද භාරගන්නට සැරසී සිටි බව සඳහන් වේ.

ඇසළ මාසයේ අමාවක දිනයේදී සුරාසුර යුද්ධයේදී සුරයන්ගේ ජයග්‍රහණය සිහිපත් කිරීමට ඇසළ උත්සවය ආරම්භ වූ බව බෞද්ධ වංශ කථාවේ සඳහන් වේ. මෙම අවස්ථාව සිහිපත් කරනු වස් අදටත් ඇසළ පෙරහර අවසානයේදී සිදුවෙන දිය කැපීමෙන් සිහිපත් කරන්නේ සුරාසුර යුද්ධයේදී අසුරයින් මරා දැමූ කඩු, සුරයින් විසින් සේදූ අවස්ථාව සිහිපත් කිරීමටයි.

තවත් මතයකට අනුව වංකනාසිකතිස්ස (ක්‍රි.ව. 110 - 113) රජ දවස ලංකාව ආක්‍රමණය කළ සොළීන් විසින් මෙරට වටිනා ජාතික වස්තු සහ 12000 ක සිහල සේනාව සොලී රටට ගෙන යන ලදී. වංකනාසික රජුගේ පුත් ගජබා රජු සොළි රටට ගොස් සිංහල සිරකරුවන්ද, සොළීන් විසින් රැගෙන ගිය පාත්‍රා ධාතූන් වහන්සේද, සතර දේවාලයේ රන් ආයුධ ද පත්තිනි දෙවියන්ගේ රන් සළඹද රැගෙන පැමිණීම සිහිපත් කිරීම ඇසළ පෙරහරට නිමිති වී ඇතැයි සැලකේ. මෙම මතය සනාථ කිරීමට ආධාරවන සිරිතක් ඇසළ පෙරහරේ දියකැපුම් සිරිතෙන් උපුටා දක්වයි. ගජබා රජතුමා සමඟ සොලී රටට ගිය නීල මහා යෝධයා යගදාවෙන් ගසා මුහුද දෙබෑකළ අවස්ථාව දිය කැපීමේ චාරිත්‍රය පිළිඹිබු කරන බවයි.

# THREE-WAY LIBERATION FROM SAMSARA

Das Miriyagalla

The subject of 'Three-way Liberation from Samsara' is directly related to the three fundamental characteristics of the universe **Anicca** (Impermanence), **Dukkha** (Unsatisfactoriness) and **Anatta** (Impersonality) which the **Tathagata Gautama Buddha** used as the foundation for His doctrine, the Dhamma. According to Dhamma, a complete understanding of the true meanings or a realization of the true nature of the three characteristics leads one to the door-step of **Nibbana** or liberation from Samsara,(Note 1) the cycle of birth and death.

After attaining Enlightenment, the Tathagata Gautama Buddha, fully realized the true nature of existence of the world including human beings. He took into consideration the existence of the above three characteristics of the universe Anicca (impermanence), Dukkha (unsatisfactoriness) and Anatta (impersonality). Thereafter, His limitless compassion referred to as **Maha Karuna**, towards fellow human beings, made him take a decision to relieve the humanity from what He saw as 'suffering' referred to in His doctrine as **Dukkha**. However it is noteworthy that he hesitated to preach His doctrine immediately after the Enlightenment as His concepts were considered to be too deep for understanding by ordinary human beings. But, after serious consideration and delay He commenced his preaching. It was for the benefit of all human beings who could realize the teachings which He preached as the doctrine on 'liberation' from 'suffering' referred to as Dukkha.

Due to the Buddha's supreme level of communication ability, competence and effective usage of terminology He was able to convince the truth and reality of His doctrine to the vast majority of those who assembled to listen to His Dhamma. But in today's context there is a need for his followers to put in extra effort to perform mental development in achieving the level of understanding needed for reaching the goal of total liberation from the cycle of birth and death, referred to as **Samsara**.

The term 'Dukkha' which refers to the First Noble Truth is translated as **'suffering'** or **'unsatisfactoriness'**. But a wider meaning is conveyed when the term **'disharmony'** is used in publications such as 'Significance of Four Noble Truths' (Note 2). 'Dukkha' has to awaken in our minds the idea of not only pain and distress but also unhappiness due to disappointments and dislikes. We aspire for something to happen. But something different happens causing disharmony and disappointment. Hence it is seen that each translation gives one correct meaning, but not entirely the full meaning of the concept of 'Dukkha'. Therefore there is a need to think carefully and apply mental development in arriving at the precise meaning. The word Dukkha is also an example of conventional (Sammuti) meanings being different from absolute (Paramatta) meanings. While 'suffering' can be similar to the conventional meaning, the term 'disharmony' is closer to its absolute meaning.

The cause of Dukkha is stated in the Second Noble Truth as **'Tanha'** and is translated as attachment for sensual pleasures, attachment for existence and non-existence and in short, for all what one 'desires'. Hence it can be clearly inferred that getting rid of Dukkha is possible by reaching a 'desire-less' state. It is noteworthy that a 'desire-less state' is considered as one of the most significant concepts in the doctrine Dhamma. (Cula Vedalla Sutta in Majjima Nikaya and several other Suttas) (Note 3). It is noteworthy that if a follower of the path of liberation, who can be called a 'practitioner', can reach a 'desire-less' state, he is at the door step of one of the **three gateways to liberation** from Samsara. (Note 4) The explanation of a 'desire-less' state gives a clear vision of the path to liberation from the cycle of birth and death through a study of Dukkha leading to Deliverance of Mind (Ceto Vimutti') .

Here in comparison to the liberation from Dukkha through a 'desire-less' state, the other two gateways to liberation are also considered along with the process of liberation relating to each of them. This is mainly due to the reason that the three characteristics Anicca, Dukkha and Anatta are **inseparably connected to each other.** In reaching the goal of total liberation from the cycle of birth and death, referred to as **Samsara,** it is quite relevant to examine not only Dukkha but in addition, Anicca ( impermanence) and Anatta ( impersonality) as well. However for ease of detailed study we could consider one of the three concepts at a time.

The term 'Anicca', even though translated in simple terms as 'impermanence', needs further analysis. According to the doctrine, all things which are 'formations' or **Sankhara** including animate and inanimate matter undergo constant change.

We clearly notice, effortlessly, some objects like collapsing buildings and landslides where changes are rapid. But other objects including human lives change too slowly giving a **false impression of permanency.** As a result of such a false perception of permanence, one considers a particular object as **'significant'** and gets linked by noting, labeling and naming it with a 'sign'. It is observed that a false notion of permanence has made some of the objects significant. But realization of absence of permanence will lead to absence of any significance. If one does not get carried away by a false impression of permanency, then there will not be any aspiration or expectation which will cause any 'sign'. One cannot see any purpose or objective in linking with such an object which has no permanency and no significance. The day someone truly understands that everything is changing constantly, he will find all formations to be insignificant resulting in a realization of a 'sign-less' state leading to Deliverance of Mind.

In considering the validity of **Anicca,** it is also necessary to take the case of a few examples. In the City of Colombo we see so much of rapid changes that even the survey department is seeing the need to get city maps continuously amended. If we look at more examples including all our thought processes, it will be noted that one cannot find anything which has a fixed shape, fixed form, fixed status or fixed nature. Finally it is noted that there is nothing which has a fixed sign. It is on the day one fully realizes the 'sign-less nature of all things' and through this the 'second path', one has the opportunity of reaching the door-step to liberation from Samsara, the first path being the 'desire-less state' mentioned earlier.

Now we come to **Anatta,** the third of the three fundamental characteristics, the understanding of which in its true nature will lead to realization of **Sunnata** or 'emptiness' or a state of 'void-ness'. According to Dhamma, one of the false views or misconceptions of every human being is the illusion of a 'personality' or a 'self'. Anatta is translated as 'egoless-ness', 'soul-less- ness' or 'impersonality'. However, as the most appropriate translation, we may use the term 'impersonality' which in fact can be called the essence of Buddhist doctrine. Hence realization of 'void-ness' will lead to realization of 'impersonality' and 'Anatta'.

It may be noted that words such as 'I' and 'mine' are used by us merely as conventions. In absolute terms they have no validity. If one gets rid of the notion of self, the notion of 'I' and 'mine' also ceases and the individual becomes free from the idea of 'mine'. This shows that one gets linked to an ' I ' with a mistaken belief of an ego-entity when there is no ego-entity but only emptiness or 'void-ness'. Here what is important to realize is that Sunnata or 'void-ness' or 'emptiness' does not mean 'total emptiness'. It actually means emptiness of any essence, or anything of substance or any core element or any ego entity. A false view of **substantiality** of anything in the world leading to delusion or **'Avijja'** mentioned in the doctrine is one of the main causes of unsatisfactory situations we experience. The realization of 'void-ness' through impersonality is the 'third way' to liberation. It may be appreciated that any one of the 'three ways' which correspond to the realization of any of the three states **desireless-ness, signless-ness or void-ness** which are closely inter connected, leads one to liberation from Samsara.

Here, it has to be noted that there is a need for a practitioner to maintain an adequate level of mental development which requires a moral foundation based on Right View. If the Right View is at 'mundane level' one is affected by **'influxes'** better known as 'Asravas' or taints such as attachments to sensual pleasures and attachments to existence in this world. One has to be oriented towards an **'influx-free Right View'.** This need not be interpreted as refraining from 'happiness'. The doctrine accepts both 'happiness' and 'unhappiness' as a part of normal life as long as they do not result in **'attachment'** and **'hatred'**. In fact, the Buddha's mission was to promote happiness for all human beings. An influx-free right view without attachment and hatred will facilitate the three states **desireless-ness, signless-ness** or **void-ness** in reaching liberation from Samsara.

May all living beings attain liberation !


**References and Notes:**

Note 1 - Pali term for Door-step to Nibbana: *Vimokkha Mukha*

Note 2 - V F Gunaratne- Significance of Four Noble Truths (p 8) Wheel Publication – B.P.S.

Note 3 - *Maha Vedalla Sutta – Majjima Nikaya*
*Culla Vedalla Sutta – Majjima Nikaya*
*Culla Sunnata Sutta – Majjima Nikaya*
*Sangiti Sutta – Digha Nikaya*
*Godatta Sutta- Sanyutta Nikaya*
*Sunnata Samadhi Sutta - Sanyutta Nikaya*
*Dhammapada – Stanzas 92-93*

Note 4- Pali terms for Three Gate ways to Liberation are
*Appanihita* (desireless-ness),
*Animitta* (signless-ness)
*Sunnata* (void-ness)




ප්‍රත්‍යවේක්ෂාව යනු නුවණින් සලකා බැලීම යි, පරීක්ෂා කිරීම යි. වැටි වැටී වුව නැගිටිමින් ජීවිතයේ දියුණුවක් ම අපේක්ෂා කරන අයෙකුට ප්‍රත්‍යවේක්ෂාව වැනි වැදගත් අන් ධර්මයක් නැති තරම් ය. නිතර නිතර සලකා බලා කටයුතු සංවිධානය කරගනිමින් අඩු පාඩු සකස් කරගත යුතු ය. වරෙක කැඩපත උපමාවට ගත් බුදුරජාණන් වහන්සේ රාහුල හිමියන්ට මෙසේ වදාළහ.

"රාහුලය, මේ ගැන (ඔබ) කුමක් සිතන්නේ ද? කැඩපත කුමක් ප්‍රයෝජන කොට ඇත් ද? ස්වාමීනී, පරීක්ෂා කොට බැලීම ප්‍රයෝජන කොට ඇත. එසේ ම රාහුල, පිරික්ස පිරික්සා කයින් කර්ම කළ යුතු ය. පිරික්ස පිරික්සා වචනයෙන් කර්ම කළ යුතු ය. පිරික්ස පිරික්සා මනසින් කර්ම කළ යුතු ය."

කැඩපත ළඟට යන පුද්ගලයෙක් කැඩපතින් තම රුව, ඇඳුම් පැළඳුම් ආදියෙහි ගුණ දොස් පරීක්ෂා කොට බලයි. එසේ අඩුපාඩු පරීක්ෂා කරන පුද්ගලයා යම් අඩුවක් දකියි නම් එම අඩුව සම්පූර්ණ කරගනියි. අඩුවක් නැති ව ලස්සනට සිටී නම් තමා කෙරෙහි අඩුවක් නැතැයි සිතා සතුටට පත් වෙයි. ගමනකට හෝ යම් වැදගත් අවස්ථාවකට සූදානම් වන විට කැඩපත බලා තතු විමසන්නාක් මෙන් තමා විසින් යම් කයින්, වචනයෙන් හෝ මනසින් යමක් කිරීමට, කීමට හෝ සිතීමට පෙර නුවණින් සලකා බැලීම වැදගත් වේ. තමා විසින් මේ කරන කර්මය කෙබඳු දැයි විමසා බලා එහි යම් දොසක් ඇත් නම් එය නො කර සිටිය හැකි ය. ප්‍රත්‍යවේක්ෂාව පිළිබඳ ව වැඩි දුර කරුණු දක්වන බුදුරජාණන් වහන්සේ රාහුල හිමියන්ට යම් කර්මයක් කිරීමට පෙර එසේ නුවණින් සලකා බැලිය යුතු අංශ කිහිපයක් පිළිබඳ ව ද වදාළහ. ඒවා කෙටියෙන් මෙසේ ය.

මාගේ මේ ක්‍රියාව මට ගැටලුවක් ඇති වීම පිණිස හේතු වේ ද?

මාගේ මේ ක්‍රියාව අනුනට ගැටලුවක් ඇති වීම පිණිස හේතු වේ ද?

මාගේ මේ ක්‍රියාව මට ද අනුනට ද යන දෙපැත්තට ම ගැටලුවක් ඇති වීම පිණිස හේතු වේ ද?

මාගේ මේ ක්‍රියාව අකුසල, දුක් විපාක ඇති කරන්නක් ද? නැති නම් කුසල, සැප විපාක ඇති කරන්නක් ද? යනුවෙනි.

මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කොට බලන්නේ තමා කරන්ට බලාපොරොත්තු වන ක්‍රියාව තමාටත්, අනුන්ටත්, අනුන්ටත්, තමාටත් යන දෙපැත්තට ම ද අයහපත පිණිස පවතී නම්, අකුසල වූ දුක් විපාක දෙන්නක් නම් එය නො කළ යුතු ය. එසේ නො වී කිසිවෙකුටත් අයහපත පිණිස නො පවතින, සැප විපාක ඇති කරවන්නක් නම් එය කළ යුතු ය.

මෙහිදී කෙනෙකුට මනෝ කර්ම සම්බන්ධයෙන් යම් ගැටලුවක් ඇති විය හැකි ය. එනම් මනසින් යමක් සිතන්නට පෙර ඒ ගැන නුවණින් සලකා බලන්නේ

> අනුනට චෝදනා කරන්නට සූදානම් වන තමා ධර්මය පිළිබඳ ව බහුශ්‍රැත ව ධර්මය අවබෝධ කරගත් අයෙක් ද? යනුවෙන් විමසිය යුතු ය. ඉදින් තමා ධර්මය පිළිබඳ ව බහුශ්‍රැත ව ධර්මය අවබෝධ කරගත් අයෙකු නොවේ නම් "එසේ නම් ආයුෂ්මත් තෙම පළමුවෙන් ම ආගමය (ධර්මය) ඉගෙනුව" යනුවෙන් තමා තමාට කියා ගත යුතු ය.

කෙසේ ද? යන්න යි. මෙය ක්‍රමයෙන් පුරුදු පුහුණු කර ගත යුත්තකි. එනම් මෙම ක්‍රමය නුපුහුණු කළ වැරදි සිතුවිලි බොහෝ වේලාවක් සිතා ඉන් අනතුරු ව තමා මේ සිතන්නේ වැරදි සිතුවිලි නො වේ දැයි වටහා ගෙන එම කල්පනාවෙන් ඉවත් වෙයි. කලක් මෙම නුවණින් සලකා බැලීමේ මනසිකාර ක්‍රමය පුරුදු පුහුණු කරගත් පසු වැරදි සිතුවිලි ඇති වී ස්වල්ප කාලයකින් ම තමා විසින් මේ මෙනෙහි කරන්නේ වැරදි සිතුවිලි බව වටහා ගෙන එම වැරදි සිතුවිලිවලින් ඉවත් වීමට උත්සාහ කරයි. මෙලෙස තවත් කලක් ගත වන විට වැරදි සිතුවිල්ලක් සිතට එන විට ම එය හඳුනා ගෙන බැහැර කිරීමේ හැකියාවක් ඇති වෙයි. ප්‍රත්‍යවේක්‍ෂා කොට බලා මනසින් කර්ම කිරීම පුහුණු කරගත් විට අනවශ්‍ය, වැරදි සිතුවිලිවලින් ඉවත් වී අවශ්‍ය, යහපත් සිතුවිලි ම මනසිකාරය කළ හැකි ය.

මීළඟට විමසා බැලිය යුතු කරුණ නම් පුද්ගලයාට මෙවන් පිරික්සා බැලීමක් නිතර නිතර අවශ්‍ය වන්නේ මන්ද? යන්න යි. මෙහි ඇති ප්‍රයෝජනය කුමක් ද? යන්න යි. සාමාන්‍ය පුද්ගලයාගේ කයින්, වචනයෙන් හා මනසින් යන තිදොරින් යහපත් කර්ම සිදු වීමට ඇති ඉඩකඩට වඩා අයහපත් කර්ම සිදු වීමට ඇති ඉඩකඩ ම වැඩි ය. අපාය මහ ගෙදර කරගනිමින් සසර ඒ ඒ තැන කාලයක් සැරි සරන පුද්ගලයෙකුට එක වර ම මනසට එනුයේ කුසලයට වඩා අකුසල ය. එයට හේතුව නම් කාලයක් තිස්සේ වැඩි පුර තමා විසින් බහුල වශයෙන් පුරුදු පුහුණු කොට ඇත්තේ අකුසල් ම වන බැවිණි. මෙහිදී දැක් වූ ක්‍රමයට අතීතය පිළිබඳ ව ප්‍රත්‍යවේක්‍ෂා කරන ඇතැමෙකුට තමා විසින් දන්නා කාලයේ පටන් ම කුසලයට, යහපතට වඩා අකුසලය, අයහපත ම කළ බව පැහැදිලි වනු ඇත.

දවසින් බොහෝ වේලාවක් අයහපතට ම කාලය වෙන් වෙයි. ඇතැමෙකු සතුන් මැරීම, සොරකම් කිරීම ආදියෙන් වෙන් වුව ද දිනකට හිස් වචන කොපමණ ප්‍රමාණයක් පිට වේ ද? එවැනි හිස් වචන විශාල ප්‍රමාණයක් මුවින් දොඩන්නට මනසින් සිතූ සිතුවිලි ප්‍රමාණය කෙතරම් ද? පිනක් කරන්නට සිතා විහාරයට යන විට වුව, ගිය විට වුව මනසේ බහුල වශයෙන් ඇත්තේ යහපත් සිතුවිලි ද? නො එසේ නම් අයහපත් සිතුවිලි ද? අනුන්ගේ දේට ආශා ඇති වීම ආදි වශයෙන් දවස පුරා, සතිය පුරා, මාසය පුරා, අවුරුද්ද පුරා හා අවුරුදු ගණන් පුරා ඇති කරගත් කර්ම විඳවන විට ඇති තත්ත්වය කෙසේ ද? යනුවෙන් මේ සියල්ල සලකා බලන විට නුවණින් විමසමින් සිදු වන ඒ අඩුපාඩු ඒ ඒ මොහොතේදී ම නැති කර ගැනීමේ වැදගත්කම පැහැදිලි වනු ඇත.

ප්‍රත්‍යවේක්‍ෂාව තවත් බොහෝ අංශ ප්‍රමාණයකට වැදගත් වේ. ඒ පිළිබඳ ව පැහැදිලි වීමට එක් අංශයක් පිළිබඳ ව මෙසේ විමසා බැලිය හැකි ය. එනම් ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකුට විභාගයකට මුහුණ දීමට නියමිත ව ඇත. කාලය ඇත්තේ සීමිත ප්‍රමාණයකි. එහෙත් අධ්‍යයනය කොට ධාරණය කරගත යුතු දෑ බොහෝ ය. මෙවන් අවස්ථාවකදී

ශිෂ්‍යයා සීමිත කාල සීමාවකින් වැඩි වැඩ කොටසක් කරගැනීම නම් අභියෝගයට මුහුණ දිය යුතු ය. ඒ සඳහා අනුගමනය කරන වැඩ පිළිවෙළෙහි පළමු වැන්න අනවශ්‍ය කටයුතු ඉවත් කරගැනීම විය යුතු ය. ඒ සඳහා නුවණින් සලකා බැලීම මෙසේ කළ හැකි ය.

**මාගේ මේ ක්‍රියාව විභාගයට අදාළ වුවක් ද?**
**මෙම ක්‍රියාවෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද?**
**මෙම ක්‍රියාව කළ යුත්තක් ම ද?**

මේ ආකාරයට නිතර සලකා බලන විට අනවශ්‍ය කටයුතු රාශියක් අතහැර දමා අවශ්‍ය කාර්යයට කාලය ඉතිරි කරගත හැකි ය. මනසින් අනවශ්‍ය සිතුවිලි සිතීමට පවා කෙතරම් කාලයක් වැය වේ ද? වෙනත් කටයුත්තක් කරන විටදී පවා උගත් දෑ මෙනෙහි කිරීමට ඇති අවස්ථාව ඉතිරි කරගත යුතු නො වේ ද? එසේ නැති නම් ඉගෙනීමට ම මනස වෙහෙසී ඇත් නම් අනෙක් කටයුතු කරන විටදී වත් මනසට විවේකයක් ගත යුතු නො වේ ද? වෙනත් කටයුත්තක් කයින් කරන අතරේ ම මනසින් තවත් බොහෝ දෑ ගැන සිතයි. මෙය මානසික විවේකයට බාධාවකි. එහෙත් එම අතිරේක කටයුතු කරන අතරේ ම සිහිය හොඳින්, පිරිසිදු ව පවත්වා ගනිමින්, කරන එම අතිරේක කටයුත්ත පිළිබඳ ව පූර්ණ අවධානය යොමු කළ හැකි නම් එය මානසික විවේකයකට හේතු වේ. එවිට කය කෙතරම් වෙහස වුව මනස වෙහෙස වී නැත. ඇතැම් විට සිහිය බලවත් වුව හොත් කායික වෙහෙසක් ද නො දැනේ. එවිට අඩු නින්දක් ලැබීමෙන් වුව සෑහී අධ්‍යයන කටයුතුවලට කාලය වෙන් කරගත හැකි ය. අනවශ්‍ය සිතුවිලි බැහැර කොට සිහියෙන් සිටින විට මනසට පමණක් නොව කයට ද වෙහෙසක් නො දැනේ. කයට යම් වෙහෙසක් දැනේ නම් ඒ ඉතා අල්ප වශයෙනි.

මුලින් සඳහන් කළ ආකාරයට ප්‍රත්‍යවේක්ෂාව පිළිබඳ ව රාහුල හිමියන්ට කරුණු දැක් වූ බුදුරජාණන් වහන්සේ තව දුරටත් මෙසේ ද වදාළහ. එනම් අතීතයෙහි, වර්තමානයෙහි හෝ අනාගතයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් කායකර්ම, වචීකර්ම හා මනෝකර්ම පිරිසිදු කළේ වී නම් හෝ කරන්නේ වී නම් හෝ ඒ සියලු දෙනා එම පිරිසිදු කිරීම කරනුයේ පිරික්ස පිරික්සා බැලීමෙනි. එබැවින් පිරික්ස පිරික්සා බලා කාය කර්ම, වචී කර්ම හා මනෝ කර්ම පිරිසිදු කරන්නෙමියි හික්මිය යුතු බව ද වදාළහ.

**(අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රය)**

බුදු දහමේ ඉගැන්වෙන ප්‍රත්‍යවේක්ෂාව පිළිබඳ කරුණු දැක්වීම් මෙපමණකින් අවසන් නො වේ. ප්‍රත්‍යවේක්ෂාව සම්බන්ධ තවත් බොහෝ දේශනා ත්‍රිපිටකය හා අටුවාදිය පුරා විසිර පවතී. ඉන් කිහිපයක් මෙසේ ය.

අනුනට චෝදනා කරන්නට කැමැති වන භික්‍ෂුව කරුණු පහක් තමා තුළ ඇත් දැයි ප්‍රත්‍යවේක්ෂා කොට බලා අනුනට චෝදනා කළ යුතු ය. ඒවා මෙසේ ය.

* අනුනට චෝදනා කරන්නට සූදානම් වන තමා පිරිසිදු කායික ක්‍රියා ඇත්තෙක් ද? යනුවෙන් විමසිය යුතු ය. ඉදින් තමා පිරිසිදු කායික ක්‍රියා නැත්තෙකු නම් ''එසේ නම් ආයුෂ්මත් තෙම පළමුවෙන් ම කායික සමාචාරයෙහි හික්මෙව'' යනුවෙන් තමා තමාට කියා ගත යුතු ය.
* අනුනට චෝදනා කරන්නට සූදානම් වන තමා පිරිසිදු වාචික ක්‍රියා ඇත්තෙක් ද? යනුවෙන් විමසිය යුතු ය. ඉදින් තමා පිරිසිදු වාචික ක්‍රියා නැත්තෙකු නම් ''එසේ නම් ආයුෂ්මත් තෙම පළමුවෙන් ම වාචික සමාචාරයෙහි හික්මෙව'' යනුවෙන් තමා තමාට කියා ගත යුතු ය.
* අනුනට චෝදනා කරන්නට සූදානම් වන තමා සබ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි මෛත්‍රී සිත් ඇත්තෙක් ද?, යනුවෙන් විමසිය යුතු ය. ඉදින් තමා සබ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි මෛත්‍රී සිත් නැත්තෙකු නම් ''එසේ නම් ආයුෂ්මත් තෙම පළමුවෙන් ම තමා සබ්‍රහ්මචාරීන් වහන්සේලා කෙරෙහි මෛත්‍රී සිත් ඇත්තෙකු වන්න'' යනුවෙන් තමා තමාට කියා ගත යුතු ය.
* අනුනට චෝදනා කරන්නට සූදානම් වන තමා ධර්මය පිළිබඳ ව බහුශ්‍රැත ව ධර්මය අවබෝධ කරගත් අයෙක් ද? යනුවෙන් විමසිය යුතු ය. ඉදින් තමා ධර්මය පිළිබඳ ව බහුශ්‍රැත ව ධර්මය අවබෝධ කරගත් අයෙකු නො වේ නම් ''එසේ නම් ආයුෂ්මත් තෙම පළමුවෙන් ම ආගමය (ධර්මය) ඉගෙනුව'' යනුවෙන් තමා තමාට කියා ගත යුතු ය.
* අනුනට චෝදනා කරන්නට සූදානම් වන තමා උභය ප්‍රාතිමෝක්ෂය (භික්‍ෂු, භික්‍ෂුණී යන දෙපිරිස විසින් රැකිය යුතු ශික්ෂා පද) පිළිබඳ ව මනා දැනීමක් ඇත්තෙක් ද? යනුවෙන් විමසිය යුතු ය.

ඉදින් තමා උභය ප්‍රාතිමෝක්‍ෂය පිළිබඳ ව මනා දැනීමක් නැත්තෙකු නම් ''එසේ නම් ආයුෂ්මත් තෙම පළමුවෙන් ම විනයෙහි හික්මෙව'' යනුවෙන් තමා තමාට කියා ගත යුතු ය.

**(කුසිනාරා සූත්‍රය)**

අනුනට චෝදනා කරන්නට සූදානම් වන භික්ෂුව විසින් මෙකරුණු පහ තමා තුළ ඇත් දැයි ප්‍රත්‍යවේක්ෂා කොට බැලීමෙන් තමා නිදොස් වූ, නිකරුණේ අනුනට චෝදනා නො කරන්නෙකු ද, නිවැරදි පුද්ගලයෙකු ද විය හැකි ය. තවද සාර්ථක පැවිදි ජීවිතයක් ගත කරනු කැමැති පැවිද්දා විසින් නිතර නිතර මෙනෙහි කළ යුතු කරුණු දහයකි. දසධම්ම සූත්‍රයෙහි අන්තර්ගත එම කරුණු සැකෙවින් මෙසේ ය.

★ මම විවර්ණ බවට පත් වූවෙක්මි (ගිහියා නොයෙක් දෙයින් නිතර වර්ණවත් වේ. විචිත්‍රවත් වේ. එහෙත් පැවිද්දා එසේ නො වේ.)

★ මාගේ දිවි පැවැත්ම අනුනට අයත් වූවකි

★ මා විසින් (ගිහියන්ට වඩා) වෙනත් ආකල්පයකින් කටයුතු කළ යුතු ය

★ කිමෙක් ද? සීලය හේතුවෙන් මගේ සිත චෝදනා කෙරේ ද?

★ කිමෙක් ද? නුවණැති සබ්‍රහ්මචාරීන් වහන්සේලා සීලය හේතුවෙන් මට චෝදනා කෙරේ ද?

★ ප්‍රිය, මනාප හැම දෙයින් ම මාගේ වෙනස් වීම හා වෙන් වීම සිදු වේ

★ මම කර්මය ස්වකීය කොට ඇත්තෙක් වෙමි, කර්මය දායාද කොට ඇත්තෙක් වෙමි, කර්මය උපන් යෝනිය කොට ඇත්තෙක් වෙමි, කර්මය ඥාතියා කොට ඇත්තෙක් වෙමි, යහපත් වූ හෝ පාපී වූ හෝ යම් ම කර්මයක් කෙරෙම් නම් එයට දායාද වෙමි

★ රෑ දවල් ගෙවී යන්නේ මා කෙසේ වසන විට දී ද?

★ කිමෙක් ද? මම ශූන්‍යාගාරයෙහි (හිස් ගෙයෙහි) සිත් අලවා වාසය කරම් ද?

★ උතුරු මිනිස් දහමින් වැඩි ආර්ය භාවය කිරීමෙහි සමත් කිසියම් ගුණ විශේෂයක් මා තුළ වේ ද? ඒ මම ජීවිතයේ අවසන් කාලයෙහි සබ්‍රහ්මචාරීන් විසින් විමසන ලද විට නිර්භය ව පිළිතුරු දිය හැක්කෙක් වෙමි (එනම් තමා මාර්ග ඵලාදියක් ලබා ඇත් ද? යන්න යි)

**(දසධම්ම සූත්‍රය)**

මෙම කරුණු දහය නිතර මෙනෙහි කරන පැවිද්දා පිරිහීමට පත් නො වන බව පැහැදිලි කරුණකි. තවද ස්ත්‍රීන් විසින්, පුරුෂයන් විසින්, ගිහියන් විසින් හා පැවිද්දන් විසින් යන සෑම දෙනෙකු විසින් ම නිතර ප්‍රත්‍යවේක්ෂා කළ යුතු කරුණු පහක් සඳහන් වේ. ඒවා මෙසේ ය.

★ මම ජරාවට පත් වන ස්වභාව ඇත්තෙක් වෙමි, ජරාවට පත් වන ස්වභාවය නො ඉක්ම වූවෙක් වෙමි

★ මම ව්‍යාධියට පත් වන ස්වභාව ඇත්තෙක් වෙමි, ව්‍යාධියට පත් වන ස්වභාවය නො ඉක්ම වූවෙක් වෙමි

★ මම මරණයට පත් වන ස්වභාව ඇත්තෙක් වෙමි, මරණයට පත් වන ස්වභාවය නො ඉක්ම වූවෙක් වෙමි

★ ප්‍රිය, මනාප හැම දෙයින් ම මාගේ වෙනස් වීම හා වෙන් වීම සිදු වේ

★ මම කර්මය ස්වකීය කොට ඇත්තෙක් වෙමි, කර්මය දායාද කොට ඇත්තෙක් වෙමි, කර්මය උපන් යෝනිය කොට ඇත්තෙක් වෙමි, කර්මය ඥාතියා කොට ඇත්තෙක් වෙමි, යහපත් වූ හෝ පාපී වූ හෝ යම් ම කර්මයක් කෙරෙම් නම් එයට දායාද වෙමි යන කරුණු පහ යි.

**(ඨාන සූත්‍රය)**

මේ ආකාරයට නිතර මෙනෙහි කරන තැනැත්තා තුළ පාපී අකුසල දහම් වැඩීම අඩු වේ. නිවනට අප්‍රමාද වේ. මෙතෙක් දැක්වූ සියලු ප්‍රත්‍යවේක්ෂාවන්ගෙන් සිය අරමුණු හා ඉලක්ක ජය ගැනීම විෂයෙහි පුද්ගලයා නිතර නිතර උත්සාහවන්ත කරවීමක් හා සවිඥානික කරවීමක් සිදු වන බව පැහැදිලි ය. එබැවින් පැහැදිලි අරමුණු හා ඉලක්ක ඇත්තෝ ප්‍රත්‍යවේක්ෂාව කෙරෙහි උත්සුක වෙත්වා.

**(මජ්ඣිමනිකායේ මජ්ඣිමපණ්ණාසකය හා අඞ්ගුත්තර-පඤ්චක හා දසක නිපාත ඇසුරු කැරිණි)**

බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි 2021 ජූලි - අගෝස්තු



# සෝතාපන්න සිත

නාලක ජයසේන

සංසාරයෙන් නිදහස් වීමේ ගමන් මඟ තෝරාගත් ප්‍රඥාවන්තයකු හට එම බුදුමඟ අනුගමනය කරන විට ලැබෙන පළමු පලය වන්නේ සෝවාන් හෙවත් සෝතාපන්න පලයයි. සෝවාන් මාර්ගය වඩන විට යම් මොහොතක එය මුහුකුරායයි. එකල්හි සෝවාන් පලයට පත්වූ ආර්ය ශ්‍රාවකයකු බවට එම සාංසාරික සත්ත්වයා පත්වෙයි. එහෙත් සැබැවින්ම සෝවාන් පලය යනු කුමක්දැයි හා සෝවාන් වූ අයෙකුගේ ස්වභාවය කුමක්දැයි අප ධර්මානුකූලව විමසා බැලිය යුතුය. යම් ගිහි හෝ පැවිදි අයකු සෝවාන් පලයට පත් වූවා යනු ඔහුගේ හෝ ඇයගේ සිත තුළ පරිවර්තනයක් සිදු වී ඇති බවයි. ඒ කවර නම් පරිවර්තනයක්ද යන්න ප්‍රායෝගික උදාහරණ සහිතව මෙම ලිපිය මඟින් සාකච්ඡා කරමු.

අපි ජීවත් වෙනවා යනු කුමක්ද ? ඉපදීමත් මරණයත් අතර ලෙඩවෙමින් මහලුවෙමින් ජීවිකාව ගෙන යාම පමණක්ද? නැත. ඉගෙනීම, රැකියාවක යෙදීම, විවාහ වීම යන ජීවිත සාධක සාක්ෂාත් කිරීමද නොවෙයි. එසේ නම් කා බී හැඳ පැලඳ සිටීමද ? එයත් නොවේ. සැබැවින්ම එකී නොකී කරුණු ජීවත් වීම නොව ජීවිකාවේ අංග පමණි. නැත්නම් අවස්ථා පමණි. ධර්මානුකූලව ගැඹුරින් විමසන විට ජීවත් වෙනවා යනු සංසාරයට කර්ම සකස් කිරීමයි. මෙසේ කර්ම සකස් කරන්නේ කෙසේද ? අප අපගේ ගත හා සිත යොදාගෙන කියන කරන සියල්ලෙන්ම කර්ම සකස් වෙයි. ගැඹුරු නින්දේදී හා සිහි විසඥ නොවූ සෑම මොහොතකම කර්ම සකස් කරමු. එහෙත් කර්ම සකස් කරනවා යනු කුමක්ද ? එය ධර්මානුකූලව දක්වතොත් සිත් සකසනවා යනුවෙන් දැක්වීමට හැකිය.

ඒ අනුව අපි උදේ අවදි වූ මොහොතේ සිට නින්දට යන මොහොත දක්වා සිදු කරන්නේ සිත් සැකසීමයි. දිනකට ඔබ මා සිත් කොපමණ සකස් කළේදැයි ගණන් කළ නොහැකිය. දැන් මේ ලිපිය කියවන විටත් ඔබ තුළ සැකසෙන්නේ මොනවාද? සිත්ය. එසේ සැකසෙන සිත් මඟින් සිදුවන්නේ කුමක්ද?

කර්ම සැකසීමයි. වෙනත් වචනයකින් කිවහොත් අභිසංස්කාර ඇති වීමයි. මෙම ස්වභාවය ධර්මයේ මෙසේ විස්තර කෙරෙයි.

මහණෙනි, කවර කරුණින් සංස්කාර කියන්නේ යත් මහණෙනි සංඛත කොට අභිසංස්කරණය කෙරෙත්නුයි එයින් සංස්කාරහ කියනු ලැබෙත්. කවර කරුණින් සංඛතය අභිසංස්කරණය කෙරෙති යත්, රූපය, රූපය පිණිස සංඛත කොට අභිසංස්කරණය කෙරෙති. වේදනාව වේදනාව පිණිස සංඛත කොට අභිසංස්කරණය කෙරෙති. සංඥාව සංඥා පිණිස සංඛත කොට අභිසංස්කරණය කෙරෙති. සංස්කාර සංස්කාර පිණිස සංඛත කොට අභිසංස්කරණය කෙරෙති. විඥානය විඥානය පිණිස සංඛත කොට අභිසංස්කරණය කෙරෙති. මහණෙනි සංඛත කොට අභිසංස්කරණය කෙරෙත්නුයි එයින් සංස්කාරහයි කියනු ලැබෙත් (ඛජ්ජනීය සූත්‍රය ඛන්ධ සංයුක්තය සංයුත්ත නිකාය)

ඉහත ධර්මතාව වාචිකව සැලකුවහොත් පංච උපාදානස්කන්ධය නැවත නැවතත් හට ගැනීමකි. එහෙත් විදර්ශනා ප්‍රඥාවෙන් බලන කළ එමගින් සිත් සැකසීමේ ක්‍රියාවලිය අනාවරණය වෙයි. මෙය ඉතා ගම්භීර හා ඉතා සියුම් ඉතා සංකීර්ණ කරුණකි. වචනයෙන් විස්තර කළ නොහැකි අත්දැකීමෙන්ම ප්‍රත්‍යක්ෂ කළ යුත්තකි. එබැවින් එය සරලව මෙසේ පැහැදිලි කරගන්නට තැත් කරමු.

ජීවත් වීම යනු සැබැවින්ම අපගේ ඉන්ද්‍රියන් විසින් අරමුණු සැකසීමයි. ඉන්ද්‍රියයෝ යනු ඇස, කන, දිව, නාසය, කය හා මනස යන සයයි. ධර්මය තුළ ඒවා ආධ්‍යාත්මික ආයතන ලෙසද හැඳින්වෙයි. ඒ හයට එන යන අරමුණු නම් වශයෙන් දක්වතොත් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස හා ධම්ම නම් වෙයි. ඒවා බාහිර ආයතන නම් වෙයි. මේ ඇතුළත හා පිටත ආයතන අතර සිදුවන ප්‍රතික්‍රියාව මගින් සිත් සැකසෙයි. එනම් ඇහැට අරමුණක් එන විට ඇහේ විඤ්ඤාණය උපදියි. අනිත් ආයතනද එසේය. එයාකාරයට සිත් සැකසුණු වහාම සංසාර ස්වභාවය අනුව රාගයෙන් ඇලීම, ද්වේශයෙන් ගැටීම හෝ මෝහයෙන් මුළාවීම සිදු වෙයි. එසේ සිදුවන රාගය, ද්වේශය හා මෝහය යන ක්ලේශත්‍රය තිබුණේ කොහේද ? සිත තුළයි.

දැන් නැවතත් සූත්‍ර ගත කළහොත් සිතක් සැකසෙනවා යනු ඉන්ද්‍රියකට අරමුණක් එක්ව ඒ පිළිබඳව සිතේ දැනීමක් ඇති වීමත් සමඟ කෙලෙස් සහිතව කය, වචනය හා මනස ක්‍රියාත්මක වීමයි. මෙසේ ක්‍රියාත්මක වීම සමඟ කර්ම සැකසෙයි. අභිසංස්කරණය යනු එයයි. ජීවත් වීම යනු එයයි. සංසාරයේ සැරිසැරීම හෝ සංසාරයේ අතරමං වීම යනු එයයි. එසේ සිදුවන අභිසංස්කරණය බුදු ඇසින් දැක අංශ පහක් ලෙස විග්‍රහ කොට ඇත.

ඒ රූප හෙවත් සිත් ඇතිවීමෙහි ලා භෞතික අරමුණුවල ක්‍රියාකාරිත්වයත්, වේදනාව හෙවත් අරමුණු සැප, දුක් හා උපේක්ෂා වශයෙන් දැනීම, සංඥාව හෙවත් එම අරමුණුවල දැනීම හඳුනා ගැනීම, සංඛාර හෙවත් එම හඳුනා ගැනීමට අනුව සිතුවිලි සැකසීම, විඤ්ඤාණය හෙවත් එම ක්‍රියාදාමයට අදාළ මානසික ශක්තිය ක්‍රියාත්මක වීම වශයෙනි. පංච උපාදානස්කන්ධය යනු මෙය බවද දත යුතුය.

පෘථග්ජන ජීවිතය යනු ඉහත කී පංච ස්කන්ධය වෙත උපාදානය හෙවත් බැඳී යාමයි. එහි ප්‍රතිඵලය යනු සංසාරයේ තිස් එක් තලයක උපතයි. එය දුකක් බව බුද්ධ දේශනාවයි. එනයින් ජීවිතය දුකකි. මේ සියල්ල දෙස විචක්ෂණශීලීව බලන විට රූප වේදනාදී අවස්ථා කෙරේ මානසික බැඳීම එම දුකට හේතුව බව අවබෝධ වනු ඇත. එබැවින් අවිද්‍යාව හෙවත් ඇත්ත නොදැනීමත් තණ්හාව හෙවත් ආශාමය බන්ධනයත් හේතුවෙන් සත්ත්වයකු සසරට බිහි කරයි.

මෙසේ සිත් හට ගැනීම එදිනෙදා ජීවිතයේ අප සියලු දෙනාම මුහුණ දෙන අත්දැකීමයි. දැන් සෝවාන් සිත යනු කුමක්දැයි බලමු. සෝවාන් පලයට පත්වූ විට සත්කාය දිට්ඨිය බිඳ වැටෙන බව අපි දනිමු. සක්කාය දිට්ඨිය යනු ගැඹුරු දහමක් වුවද සරලව ගතහොත් මම, මගේ, මට අයත් යන හැඟීමයි. සාමාන්‍ය පුද්ගලයකුගේ සිතේ ක්‍රියාකාරිත්වය පවතින්නේ එම හැඟීමෙනි. ඒ අනුව සාමාන්‍ය ජීවිතය හෙවත් සාංසාරික ජීවිතය යනු මමත්වයේ පැවැත්මයි.

මමත්වයෙන් යුතුව සිත් ඇතිවීම තුළ රූප වේදනාදිය හට ගැනීමේදී කර්ම සැකසෙයි. කෙනෙක් සෝවාන් පලයට පත් වෙනවා යනු ඔහුගේ හෝ ඇයගේ සිතේ එක මොහොතක මමත්වයෙන් තොරව සිතක් හට ගැනීමයි. එය සිදුවන්නේ මෙසේය. ධර්මය තුළ සිත දියුණු කරන විට සිතේ සත්‍ය අවබෝධ වෙයි. එනයින් යම් මොහොතක ඇති වන සිතක මම යන හැඟීම බිඳ වැටෙයි. එහෙත් ඉන් අනතුරුව ඇතිවන සිත්තුළ නැවත නැවතත් කර්ම සැකසීම සිදු වෙයි.

රහත් පලයට පත්වන තෙක්ම එය සිදුවෙයි. නමුත් සෝවාන් පලයට පත් වූ උතුමා කර්මය නැති කරන මාර්ගයට පිවිස ඇති බැවින් සංසාර කර්ම ක්ෂය වන මොහොතක් එයි. එම මොහොතට පත්වන අයුරු ඔහු හෝ ඇය තුළම හට ගන්නේ, ආසවක්ඛය නමැති නුවණ ලැබීමත් සමඟිනි.

නමුත් ඒ උතුම් නිවනට පිවිසීමේ චිත්තමය හැරවුම සිදුවන්නේ සෝවාන් පලයට පත් වීමෙනි. සෝවාන් පලයට පත්වන ප්‍රායෝගික ආකාරය ඉදිරි ලිපිවලදී අපි තවදුරටත් සාකච්ඡා කරමු. නමුත් මෙම ලිපිය අවසානයේදී සෝවාන් සිතක් ඇති කර ගැනීමට ඔබ සැමට එදිනෙදා ජීවිතය තුළ පුරුදු කළ හැකි අභ්‍යාසයක් හෙළි කරමු.

සිතක් ඇති වන සරල ආකාරය ඉහත පැහැදිලි කර ඇත. නමුත් එය ඔබට අවබෝධ වන්නේ ඔබ සිත දෙස සිහියෙන් නුවණෙන් හා වීර්යයයෙන් බැලුවහොත් පමණි. ඔබ මේ මොහොතේ කරන්නේ කුමක්ද ? මෙම ලිපිය කියැවීමයි. මේ සමග සිත් දහස් ගණනක් ලක්ෂ ගණනක් නොව කෝටි ප්‍රකෝටි ගණනක් ඇතිව නැතිව යයි. අකුරක් කියැවීම ආරම්භ කර අවසන් කරන විට සිත් ගණනාවක් ඇතිව නැතිව ගොසිනි. නමුත් ඒ සිත් ඔබ මගේ යන හැඟීමෙන් එනම් එය විඳින කෙනෙකු ඇත යන සංඥාවෙන් ගොඩනගනවා ඇත. එයින් මිදීම එකවර කළ නොහැකිය. නමුත් ඔබ දක්ෂ නම්, සෝවාන් පලයට පත්වන්නට අධිෂ්ඨාන කර ගත් උතුමෙකු නම් ඔබට කියැවීම තුළ ඉහත කී පංච උපාදානස්කන්ධය ඇති වන ආකාරය නුවණෙන් මෙනෙහි කළ හැකිය. ඒ මෙසේය. අකුරු යනු ඇහැට එන අරමුණුය. ඒ දෙක ප්‍රතික්‍රියා කරනුයේ විඤ්ඤාණ ශක්තිය මඟිනි. එම ප්‍රතික්‍රියාව හා එම ශක්තිය සමඟ ඔබ ඒ අකුරු පිළිබඳ වේදනාවක් ලබයි. එම වේදනාව කැමැති එකක් නම් ඔබ ඊළඟ අකුර කියවනු ඇත. එම වේදනාව දුකක් නම් ඔබ ඊළඟ අකුර නොකියවනු ඇත. මොහොතක් මේ ස්වභාවය මෙනෙහි කරන්න. එවිට දහම් දොර විවර කරන යතුර ඔබ ළඟය.

සියලු සත්ත්වයෝ චතුර්ආර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගනිත්වා !!!


**සබ්බ දානං - ධම්ම දානං ජිනාති**

**සියලු දානයන්ගෙන් ධම්ම දානය උතුම් වේ**

**බෞද්ධාලෝකය - බෞද්ධ සඟරාව**
**ධර්ම දානයක් සේ පූජා කරන්න**

**සඟරා 50 ට**
**වඩා මිලදී ගැනීමේදී 15 % සිට වට්ටම්**
**සඟරා 50 - 100 - 200 හෝ**
**ඊට වැඩි වශයෙන්**
**මිලදී ගෙන පූජා කිරීමට පුළුවන.**



ඔබගේ, ඔබේ දරුවෙකුගේ විවාහ සංවත්සරය,
උපන් දිනය හෝ මියගිය ඥාතීන්ට පිං පැමිණවීමට,
පෝදා සිල් සමාදන්වන උපාසක උපාසිකාවන්ට ධර්මදානයක් ලෙස
බෞද්ධාලෝකය සඟරාව පූජා කරන්න.



වෙනත් පිංකම් වලදීත් පූජා තිළිණයක් ලෙසින්,
මෙම සඟරාය පූජා කරන්න.



# අධ්‍යාපනයේ බෞද්ධ පිවිසුම

**තරිඳු ධනංජය වීරසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

නූතන ලෝකයේ සෑම සමාජයක්ම දේශපාලන, ආර්ථික, සමාජයීය, සංස්කෘතික යනාදී සිය ආංශික මෙහෙයුම්වලදී නිරන්තර තරගයක යෙදෙයි. එම තරගයට මුහුණදීමට ඇති වැදගත්ම දිරිගැන්වීම්වලින් එකක් වන්නේ අධ්‍යාපනය බව නූතන තරගකාරී ලෝකයේ පිළිගැනීමයි. අධ්‍යාපනයෙන් අරමුණු කරන්නේ අදාළ රට-ජාතිය සඳහා වටිනා මානව සම්පතක් සංවර්ධනය කරමින් මිනිසුන් ලෙස මිනිසුන්ගේ ප්‍රඥාව වැඩිදියුණු කිරීමයි. ඒ අනුව අධ්‍යාපන ක්‍රම සංවර්ධනය කර ඇත්තේ මූලික පරමාර්ථ තුනක් පෙරදැරිවය.

- සමාජයේ හොඳ සාමාජිකයකු වීමට මිනිසා සූදානම් කිරීම.
- සමාජයේ සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර, මූලධර්ම හා සම්මතයන්ට අනුව ජීවත් වීමට මිනිසා පුහුණු කිරීම.
- විමුක්ති සාධනය උදෙසා අවැසි ප්‍රඥාව පොහොසත් කිරීම.

ඉහත සඳහන් කළ, අධ්‍යාපනයේ පළමු පරමාර්ථය වන්නේ හොඳ සාමාජිකයන් වීමට මිනිසුන් සූදානම් කිරීමයි. 'හොඳ' යන පදය විවිධ පුද්ගලයින් සඳහා විවිධ අර්ථ නිරූපණයන් ගෙන යා හැකිය. එය සමාජීයව ගොඩනඟා ඇති අතර අදාළ සමාජයේ සිරිත් විරිත්, චාරිත්‍ර, සම්මතයන් සහ මූලධර්ම අනුව සාපේක්ෂව පිළිගනු ලැබේ. සමාජයේ හොඳ සාමාජිකයන්ට අවම වශයෙන් හැකියාවන් දෙකක්වත් තිබිය යුතුය. පළමුවැන්න වන්නේ තම ජීවිකාව සරිකර ගැනීම සඳහා වැඩ කිරීමේ හැකියාවයි. දෙවැන්න නම් සමාජයේ සෙසු සාමාජිකයන් සමඟ ගැළපීමට ඇති හැකියවයි. මිනිසාට මූලික පැතිකඩ දෙකක් ඇති බව නූතන ලෝකයේ පිළිගැනීමයි. ඒ බාහිර පැතිකඩ හා අභ්‍යන්තර පැතිකඩ වශයෙනි. බාහිර පැතිකඩ අන්‍යයන් සමඟ සම්බන්ධතා ඇති අතර, අභ්‍යන්තර පැතිකඩ යනු කෙනෙකුගේ මනුෂ්‍යත්වයේ සැබෑ හරය යි. බෞද්ධ දර්ශනයට අනුව පරමාර්ථ ධර්ම සමඟ සම්බන්ධ වන්නේ මිනිසාගේ මේ අභ්‍යන්තර පැතිකඩයි.

ඉහත සඳහන් අරමුණු තුන අතර අධ්‍යාපනයේ තුන්වන පරමාර්ථය වඩාත් වැදගත්ම පරමාර්ථය වේ. දැනුම යනු ප්‍රඥාව කරා යන ගමනේ ආරම්භක ලක්ෂ්‍යයයි. ප්‍රඥාව යනු අවසානයක් මිස වෙනත් දෙයකට මාධ්‍යයක් නොවේ. ඇතැම් විට බුදුසමය පෙන්වා දෙන මෙම දර්ශනය දැනුම පිළිබඳ නූතන බටහිර විශ්වාසයන් සමඟ පරස්පර විරෝධී තර්කයකි. බටහිරයන් විශ්වාස කරන්නේ දැනුම යනු විකිණිය හැකි, එසේම ඵලදායී නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා භාවිත කළ හැකි සම්පතක් බවයි. එනිසා අද නූතන සමාජ දැනුම් සේවකයින් පිළිගනී. එහෙත් බෞද්ධ දර්ශනයට අනුව එය ඉතා පටු සංකල්පයකි. බුදුදහම එම දැනුම - ප්‍රඥාව පිළිබඳ වාදය සම්බන්ධ ඉතා ප්‍රායෝගික මතයක් ඉදිරිපත් කරයි. ප්‍රඥාව යනු කෙනෙකුගේ දැනුම තමාගේ ජීවිතයටත් පසුව ලෝකයේ වෙනත්

> බුදුන් වහන්සේ කාලාම සූත්‍රයෙන් දේශනා කළ පරිදි විමසීමේ නිදහස අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය අංගයකි. යමක් ඇසූ පමණින් හෝ දුටු පමණින් නොව ඒ ගැන සිහිබුද්ධියෙන් සිතා බලා තමාට ගෝචර වේ නම් පමණක් පිළිගත යුතුය. නැතිනම් ඒ පිළිබඳ ප්‍රශ්න කළ යුතුය.

අවස්ථාවන්ටත් අදාළ කර ගැනීමයි. අවබෝධයෙන් තොර දැනුම පුද්ගලයා විනාශය කරා ගෙනයයි. අවබෝධයෙන් තොර දැනුම පුද්ගලයා ලෝකෝත්තර ධර්ම වෙත කැඳවා ගෙන නොයයි. බෞද්ධ අධ්‍යාපන දර්ශනය තුළ අගය කරන්නේ දැනුම නොව ප්‍රඥාව යි.

අද වන විට මිනිසා යම් සංවර්ධන ක්‍රියාවලියක හෝ පද්ධතියක යෙදවුමක් බවට පත්ව ඇත. අපි ඔවුන් මානව සම්පත ලෙස හඳුන්වන්නේ එබැවිනි. එය උතුම් මානව ගුණයේ හරය පොහොනි කිරීම හා පරම සත්‍යය (නිවන) අවබෝධ කර ගැනීම සඳහා මිනිසා සංවර්ධනය කිරීම අරමුණු කරගත් පුරාතණ චින්තනයට හාත්පසින්ම වෙනස් ය. නූතන ලෝකයේ සෑම රටකම පාහේ සිදු කර ඇති පරිදි ආර්ථික අරමුණු සඳහා අධ්‍යාපනය සංවිධානය කිරීම නූතන අධ්‍යාපන ක්‍රමය බෞද්ධ දෘෂ්ටියෙන් මෙතරම් දුරස් වීමට හේතු වී තිබේ. මනුෂ්‍යත්වය සහ පරම සත්‍යය වෙත පිවිසීමේ පරමාර්ථ එවිට අධ්‍යාපනයෙන් ගිලිහී යයි.

බෞද්ධ දර්ශනය අනුව අපේ අවසාන පරමාර්ථය නිවන ය. බෞද්ධ මතයට අනුව, පුද්ගලයෙකු ජීවත්වන සමාජයේ ස්වරූපය පරම සත්‍යය සාක්ෂාත් කර ගැනීම සඳහා බලපාන තීරණාත්මක සාධකයක් නොවේ. තීරණාත්මක සාධකය පුද්ගලයා තුළ ම පවතී. පුද්ගලයා ගනුදෙනු කළ යුත්තේ ඔහු හෝ ඇය තුළ ඇති ශක්තීන් සමඟ මිස සමාජයේ බාහිර ස්වරූපයන් සමඟ නොවේ. ඉහළම වටිනාකම ලැබෙන්නේ පුද්ගලයා තුළ ඇති එම ශක්තියට යි, එම ස්වයං නිදහසට යි.

බෞද්ධ දර්ශනයට අනුව ඕනෑම අධ්‍යාපන ක්‍රමයක් මඟින් සමාජ අවශ්‍යතා, පුද්ගලයාගේ සංවර්ධන අවශ්‍යතා සහ ලෝකෝත්තර සත්‍යය වෙත යොමු කරවීම යන කාරණා තුනම ආමන්ත්‍රණය කළ යුතුය. අධ්‍යාපනය මඟින් සමාජ අවශ්‍යතා ද සපුරාලිය යුතුය. අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කරන, ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන සැලකිලිමත් වන, සහ සමාජයේ යාන්ත්‍රණයන් යම් තාක් දුරට දැන සිටින යහපත් පුරවැසියන් ලෙස අප මිනිසුන් ගොඩනැඟිය යුතුය. ඉගෙන ගත් පුද්ගලයකු යනු සමාජයේ ආචාරධාර්මික නායකත්ව කාර්යභාරයක් භාර ගැනීමට සූදානම්, එසේම අන් අයගේ ගෞරවය සමඟ පහසුවෙන් කටයුතු කළ හැකි අයෙකි. ඒ හා සමානව, අධ්‍යාපනය පුද්ගලයාගේ සංවර්ධනය සම්බන්ධයෙන් ඇති අවශ්‍යතා ද සපුරාලිය යුතුය. එනම්, අධ්‍යාපනය විසින් තමන්ගේ ගෞරවයට ගරු කරන, ස්ව තාර්කිකත්වයක් හා ස්ව පෞරුෂයක් ඇති පුද්ගලයකු ගොඩනැඟිය යුතුය. අධ්‍යාපනය තුළින් මිනිසා තම අභ්‍යන්තර සාමය ක්‍රමානුකූලව සෙවීම සඳහා යොමු කරවිය යුතුය.

බෞද්ධ අධ්‍යාපන දර්ශනය තුළ අන් කිසිදු අධ්‍යාපන ක්‍රමයක් තුළ දැකිය නොහැකි මූලිකාංග තුනක් දක්නට ලැබේ.

- විමසීමේ නිදහස
- ප්‍රතිසංස්කරණයේ නිදහස
- විවෘතභාවයේ නිදහස

බුදුන් වහන්සේ කාළාම සූත්‍රයෙන් දේශනා කළ පරිදි විමසීමේ නිදහස අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය අංගයකි. යමක් ඇසූ පමණින් හෝ දුටු පමණින් නොව ඒ ගැන සිහිබුද්ධියෙන් සිතා බලා තමාට ගෝචර වේ නම් පමණක් පිළිගත යුතුය. නැතිනම් ඒ පිළිබඳ ප්‍රශ්න කළ යුතුය. මෙම චින්තන සහ විමංසන නිදහස අන් කිසිදු ආගමික දර්ශනයක දක්නට ලැබෙන්නේ නැත. බුදු දහම දේව වාක්‍යයක් මත නොරැඳයි. බෞද්ධ අධ්‍යාපනය ද එවැනි අතාර්කික විශ්වාසයන් මත නොරැඳයි.

යමෙකුගේ කීමක් හුදෙක් පහත සඳහන් හේතු නිසා විශ්වාස නොකළ යුතුය. පිළිනොගත යුතුය.

- එය දීර්ඝ කාලයක් තිස්සේ තහවුරු කර ඇති නිසා
- එය කටකතාවක් නිසා
- එය පොත්වල ලියා ඇති නිසා
- එය තර්කානුකූල නිසා
- එය අනුමාන කළ හැකි නිසා
- එය සාධාරණ යැයි බැලූ බැල්මට පෙනෙන නිසා
- එය න්‍යායට ගැළපෙන නිසා
- එය විශ්වාසදායක බව බැලූ බැල්මට පෙනෙන නිසා
- එය තම ගුරුවරයා පැවසූ නිසා

අප යමක් විශ්වාස කළ යුත්තේ එය නිසි පරිදි අවබෝධ කර, ක්‍රියාවට නංවා ප්‍රතිඵල අප විසින්ම අත්දුටු විට පමණි. තම ඉගැන්වීම් ප්‍රශ්න කිරීමට පවා බුදුරජාණන් වහන්සේ අනුගාමිකයන්ට ආරාධනා කළහ. විමසීමේ නිදහස යනු ලත් දැනුම විමසා බලා ජීවිතයට අදාළ කර ගැනීම ය. කාළාම සූත්‍රය අපට පෙන්වා දෙන්නේ යමක් හෝ යමෙක් සිහි නුවණින් විමසා නොබලා විශ්වාස නොකරන ලෙසයි. එයින් අදහස් කරන්නේ අප කිසිසේත් අන් අය විශ්වාස නොකළ යුතු බව නොවේ. ඒ වෙනුවට අප අසා ඇති දේ හෝ දැක ඇති දේ ගැන ප්‍රශ්න කර, එය විශ්වාස කිරීමට පෙර එය අප විසින්ම පරීක්ෂා කර බැලිය යුතු බවයි. මේ අනුව, බෞද්ධ අධ්‍යාපන දර්ශනය මඟින් පුද්ගලයාට "ඔබ ඔබේ ස්වාමියා ය සහ ඔබේ ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාක සඳහා ඔබ වගකිව යුතුය". යන්න තේරුම් ගැනීමට ඉඩදීම අරමුණු කර ඇති බව පැහැදිලිය. බෞද්ධ අධ්‍යාපනයේ අවසාන ඉලක්කය වන්නේ ලෝකයේ යථාර්ථය ඉගෙන ගැනීම, තේරුම් ගැනීම සහ තමන්ගේ ගැලවීමයි. ගැලවීම යනු උපත, මරණය සහ නැවත ඉපදීම යන චක්‍රයෙන් නිදහස් වීමයි. ලෞකික දුක්වලින් මිදීම මෙකී ගැලවීමට අවශ්‍ය මූලික පදනම සකසයි. එමනිසා අධ්‍යාපනය මඟින් මිනිසුන්ට ස්වකීය ගැලවීම උදෙසා නිසි මග පෙන්විය යුතුය. බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ හරය ස්වකීය ගැලවීම පිණිස පුද්ගලයා මෙහෙයවීමයි.

ප්‍රතිසංස්කරණයේ නිදහස යනු වැරදි යැයි පෙනෙන දේ වෙනස් කිරීමට නිදහසයි. එවැනි වෙනස්කම් ප්‍රචණ්ඩකාරී ලෙස ගෙන ඒමට නොව සම්මුතියේ ස්වභාවය අනුව ගෙන ඒම ප්‍රඥාවන්තයාගේ ලක්ෂණය යි. බුදුරජාණන් වහන්සේ සිය ඉගැන්වීම් තුළින් ප්‍රතිසංස්කරණයේ නිදහස ක්‍රියාවෙන්ම විදහා දැක්වූ සේක. එය බෞද්ධ අධ්‍යාපනයට ද ඇතුළත් වේ. උන්වහන්සේ පෙන්වා දුන්නේ දෙවියන් වහන්සේ, කුල භේදය, ගුප්ත විද්‍යාවන් පිළිබඳ ඉගැන්වීම් පරම සත්‍යයට අනුකූල නොවන බවයි. බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණවාදයේ සමහර ඉගැන්වීම් ප්‍රතික්ෂේප කළ සේක. ඇතැම් අදහස් ප්‍රතිසංස්කරණය කරමින් නව අරුතක් හා අර්ථකථන ලබා දෙමින් සමාජ සම්මුතීන් ඇති කළ සේක. එසේම සම්මුති මායාවෙන් මිදීමේ මාර්ගය ද පෙන්වා වදාළ සේක.

බෞද්ධ අධ්‍යාපන දර්ශනයේ තුන්වන අංගය වන්නේ විවෘතභාවයේ නිදහස යි. විවෘත මනසක් ඇති පුද්ගලයන් සතුව මූලික ලක්ෂණ දෙකක් තිබේ.

- විවිධ විශ්වාසයන් හා ජීවන රටාවන් ඇති පුද්ගලයින් සමඟ එක්ව ජීවත් වීමේ හැකියාව.
- තමන්ගේ විශ්වාසයන් හා ජීවන රටාවන් අන් අය විසින් විවේචනය කරන විට, අමනාප නොවී සවන් දිය හැකි, ආක්‍රමණශීලී ලෙස ප්‍රතිචාර නොදක්වා සිටීමට ඇති හැකියාව.

බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ මෙම ලක්ෂණ දෙකම අගය කරයි. එවැන්නන් අධ්‍යාපනයෙන් බිහි කළ යුතු බව අවධාරණය කරයි. මෙම ලක්ෂණය 'පුළුල් මනස' යනුවෙන් නූතන අධ්‍යාපන ක්‍රම තුළද ප්‍රකට ය. පුළුල් මනසක් ඇති පුද්ගලයන්ට ආත්ම විශ්වාසයක් ඇතත් ස්වයං විනයක් ඇතත් ලෝකය පිළිබඳ කම්පා නොවී සිටීමේ තාදී ගුණය ඇත.

දැනුම ක්‍රියාවේ යොදවන විට පුද්ගලයා තුළ වෙනසක් ඇති වේ. එය ප්‍රඥාව යන ඉහළම අනුවාදය වන දැනුමේ භාවිතාව යි. කෙසේ නමුත් දැනුමට පමණක්

ක්‍රියාවකට මුල පිරීමට හැකියාවක් නැත. එනිසා ප්‍රශ්න කිරීම ප්‍රයෝජනවත් බවත්, විවෘත, පුළුල් මනස යහපත් බවත්, යෝග්‍ය පරිදි ප්‍රතිසංස්කරණ සිදුකළ යුතු බවත් පුද්ගලයකු දැන සිටිය යුතුය.

බෞද්ධ අධ්‍යාපනය තුළ ස්වකීය විමුක්ති සාධනය සඳහා පහසුකම් සපයන සාධක තුනක් අඩංගු වේ: සදාචාරය (සීල), සමාධිය (සමාධි) සහ පඤ්ඤා (ප්‍රඥාව) යනු එම සාධක තුනයි. එය අවසාන සත්‍යයට මඟ පෙන්වන මාවතයි. ඒවා නූතන අධ්‍යාපන ක්‍රමවේද තුළ අද අත්‍යාවශ්‍ය අංග විය යුතු බව තදින් දැනේ.

මේ අතර ඉහළින්ම ඇති සාධකය ප්‍රඥාවයි. ප්‍රඥාව යනු ලෝක යථාර්ථය පිළිබඳ අවබෝධයයි. බුදුන් වහන්සේ සඳහන් කළ පරිදි සත්‍යය සත්‍යය ලෙස දැකීමටත් අසත්‍යය අසත්‍යය ලෙස දැකීමටත් ප්‍රමාණවත් ප්‍රඥාවක් ඉගෙන ගන්නාට තිබිය යුතුය. හොඳ අධ්‍යාපනයක් මඟින් මිනිසුන් හැඟීම් පාලනය කර ගැනීමට පුහුණු කරවයි. අවම වශයෙන් ලෝකයට හොඳ පුද්ගලයෙකු වීමට එය ප්‍රමාණවත් වේ.

සීල, සමාධි සහ ප්‍රඥා පිළිබඳ බෞද්ධ අධ්‍යාපනයේ මෙම දැක්ම පුද්ගල දැනුම, ආකල්ප හා කුසලතා, සංවර්ධනය සමඟ ද සමපාත වේ. සීල යනු කුසලතා ය. සමාධි යනු මනාව පිහිටුවා ගත් සිතක ඇතිවන යහපත් ආකල්ප ලෙස සලකනු ලැබේ. ප්‍රඥාව අවබෝධය ගැන ය. එහෙත් බෞද්ධ දෘෂ්ටිය බටහිර සංකල්ප තුළ කියැවෙන "හිස, හදවත සහ අත" පිළිබඳ නූතන විශ්වාසයට වඩා බෙහෙවින් පුළුල් ය. ඒ, ඉහත දැක්වූ පරිදි අධ්‍යාපනය පිළිබඳ බෞද්ධ දැක්මේ ඇති උපාංග තුනම පුද්ගල සංවර්ධනය පිළිබඳ නූතන දෘෂ්ටියට වඩා පුළුල් පරාසයක පිහිටන බැවිණි. ප්‍රඥාවන්තයා පළමුව තමා වෙනස් වී අන්‍යයන් වෙනස් කිරීමට උත්සාහා දරන්නෙකි. හෙතෙම නිවැරදි අධ්‍යාපනය තුළින් නියමාකාර ඉගෙනීමක් ලැබූවෙකි.

ප්‍රඥාවන්තයෝ අනුන් විනිශ්චය නොකරති. ඔවුන් අනුන්ගේ වචන හෝ ක්‍රියාවන් හෝ අනුන් කර ඇති හෝ නොකළ දේ විනිශ්චය කරන්නේ නැත. ප්‍රඥාවන්තයන් කල්පනා කරන්නේ තමාගේම වචන හා ක්‍රියාවන් පිළිබද පමණි.


### සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ

## යාවජීව සාමාජිකත්වය හෝ සමිති සඳහා සාමාජිකත්වය ලබාගැනීමට...

- සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයෙහි යාවජීව සාමාජිකත්වය අවුරුදු 18 සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික බෞද්ධ පුරවැසියන්ට අයදුම් කළ හැකිය.
- ඔබගේ ප්‍රදේශයේ හෝ විහාරස්ථානයට අනුබද්ධව පවත්වාගෙන යන බෞද්ධ සමිති සඳහා ද සාමාජිකත්වය අයදුම් කළ හැකිය.
- සෙ. මී. 22 x 10 (අඟල් 9 x 4) ප්‍රමාණයේ දිග ලිපි කවරයක ඔබගේ නම ලිපිනය සඳහන් කර ඇති රු. 15 ක් වටිනා මුද්දර අලවා එම ලිපි කවරයේ උඩ කෙළවර නව"අයදුම්පතක්" යනුවෙන් ද "යාවජීව සාමාජිකත්වය" හෝ 'සමිති සාමාජික' යන පදය ද සුදුසු පරිදි සඳහන් කර අප වෙත යොමු කිරීමෙන් අයදුම් පත් ගෙන්වා ගත හැක.

**ලේකම්**
**සාමාජික හා සමිති සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය**
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
**380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**දුරකථන - 0112688517 / 0112691695**
**වෙබ් අඩවිය www.acbc.lk**

අයදුම්පත් පැමිණ හෝ අපගේ වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබාගත හැකිය.

# අනුරාධපුර පැරණි යෝධ ඇළෙහි වාරි තාක්ෂණික ලක්ෂණ



කථිකාචාර්ය,
ආචාර්ය එච්.එච්.ඒ. කරුණාරත්න

ලාංකේය වාරි කර්මාන්තය තුළ හඳුනාගත හැකි ඇළ මාර්ග අතර අනුරාධපුර පැරණි යෝධ ඇළ සුවිශේෂ වාරි නිර්මාණයක් ලෙස සලකනු ලබයි. ජලය කළමනාකරණයෙන් යුතුව බෙදා හැරීම සඳහා නිර්මාණය කරන ලද ඇළ මාර්ග ලෙස මිණිපේ ඇළ, කාලිංග ඇළ හා ඇළහැර ඇළ වැදගත් වේ. මෙම ඇළ මාර්ග නිර්මාණය කර ඇත්තේ මහවැලි ගඟ හරස් කිරීමෙන් බඳින ලද අමුණුවලට සම්බන්ධ කොට ය. උදාහරණයක් ලෙස, මිණිපේ ඇළ ආරම්භක ස්ථානය පිළිබඳව බ්‍රෝහියර් ද මෙසේ පෙන්වාදී ඇත "මහවැලිගඟ වක් වූ ස්ථානයක ඉවුර අද්දරම තිබෙන දූපතක් නිසා පටු ඇළක් සෑදී තිබේ. ගඟෙන් විශාල ජලස්කන්ධයක් ඇළට ඇදීයයි. ඇළේ අනෙක් කෙළවරේ ගල් දෙකක් තිබේ. ඇළේ ජලය නැවත වැටෙන්නේ මෙම ගල් දෙකෙන් නිසා තරමක් දුරට ජලය එහි සිරවී තිබේ. මේ ගල් දෙක බැම්මකින් යාකර තිබේ (Brohier, 1935:10). අනුරාධපුර පැරණි යෝධ ඇළ කලා වැවේ ඉහළ උන්නතාංශයක ස්ථානගත කර ඇති සොරොව්වකින් ආරම්භ වී කලාඔය ඉහළ මිටියාවත හරහා අන්තර්කලාපයේ ජනාවාස සඳහා අවශ්‍ය ජලය ලබාදෙමින් තිසාවැව දක්වා ගලා ගොස් ඇත. "ඇළ" සංකල්පයෙන් ඔබ්බට ගොස් "යෝධ ඇළෙන්" අන්තර්කලාපයට ජලය ලබාදීම සඳහා අන්තර්ඇළ මාර්ග නිර්මාණය කර ඇත. මේ හෙයින් යෝධ ඇළ අගනගර ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට නිර්මාණය කරන ලද හුදු ජල පවාහන මාධ්‍යයක් පමණක් නොව අන්තර්කලාපයේ ජනාවාසවලට අවශ්‍ය ජලය සැපයීමට නිර්මාණය කරන ලද දිගු වැවකි.

## සොරොව්

යෝධ ඇළ විශිෂ්ට වාරි අංගයක් ලෙස සොරොව් නිර්මාණය හඳුනාගත හැකිය. සොරොව් හා ඇළෙහි ඉවුරු නිර්මාණය අතර මනා සම්බන්ධතාවක් පෙන්නුම් කරන අතර ඇළෙහි ජලය වැව් හා කුඹුරුවලට කළමනාකරණයෙන් යුතුව බෙදා දීම මෙමඟින් සිදු ව ඇත. ක්ෂේත්‍ර අධ්‍යයන අනුව කලාවැවේ සිට නඹඩෑව පාලම තෙක් වූ සොරොව් සාධක කලා ඔය ඉහළ නිම්න කලාපය තුළින් හඳුනාගත හැකි සොරොව් ලෙස ගෝනපතිරාව, මරදන්කඩවල, ඉහළගම, කූට්ටිකුලම, අලුත්වැව, අමුණුකොළය, කෝන්වැව, කිරලෝගම, තිරප්පනය ආදී සොරොව් දක්වාලිය හැකිය.


යෝධ ඇළෙන් වැවකට ජලය ලබාදුන් බවට පළමු සාධකය හඳුනාගත හැකි වනුයේ ගෝනපතිරාව

වැවට සම්බන්ධ සොරොව්ව මඟිනි. යෝධ ඇළෙන් කුට්ටිකුලමවැවට හා ඉහළගමවැවට ජලය සපයන සොරොව් හඳුනාගත හැකි අතර මේවායේ ව්‍යුහාත්මක ස්වරූපය මුල් ඉදිකිරීම්වලින් බැහැර වේ (ඡායාරූප අංකඃ10). අලුත්වැවට යෝධ ඇළෙන් ජලය ලබාදීම සඳහා යෙදූ පැරණි සොරොව්ව හඳුනාගත හැකි වුව ද එයට ආසන්නව යටත් විජිත අවධිය තුළ ගොඩනඟන ලද සොරොව්ව හඳුනා ගන්නා ලදී (100.02371 B). අලුත්වැවත් කූට්ටිකලමවැවත් භූමි මට්ටමින් සමාන උන්නතාංශයක පිහිටීම නිසා කූට්ටිකුලමවැවේ සොරොව්වත් අලුත්වැව සොරොව්වත් එකම ස්ථානයක ස්ථානගත කළයුතු යැයි සිතිය හැකිය (98.16732 A, 98.52321 A, 97.95324 A) (ඡායාරූප අංකඃ11). අලුත්වැව ශේෂව ඇති පැරණි සොරොව්වත් කූට්ටිකුලම සොරොව්වත් සමාන උන්නතාංශයක ස්ථානගත කර ඇත. එහෙත් අලුත්වැවේ නව සොරොව්ව පැරණි සොරොව්වට මඳක් ඉහළින් පිහිටීම නිසා කූට්ටිකුලම වැවට අයත් සොරොව්වේ උන්නතාංශය පිළිබඳ සැලකිලිමත් වීමේ දී පහළ සොරොව්ව නිශ්චිත ලෙසම පැරණි සොරොව්ව විය හැකි බව නිගමනය කළ හැකිය.

අපගේ ක්ෂේත්‍ර ගවේෂණය මඟින් අනාවරණය විය. ඇළ මඟින් වැව්වලට ජලය ලබාදීම සඳහා ඉහළ භූ විෂමතාවක් සහිත කලාපවල ස්ථානගත කර ඇති සොරොව් ද කෘෂි බිම් සඳහා ජලය ලබාදීමට පහළ උන්නතාංශයක් සහිත කලාපයක ද සොරොව් ස්ථානගත කර ඇත.

## දියකලිය

දියකලිය ජලය රැඳවීම සඳහා යොදාගත් ක්ෂුද්‍ර ජල මූලාශ්‍රයක් ලෙස ජන ව්‍යවහාරයේ පැවතිය ද නිර්මාණ තාක්ෂණය හා උපයෝගීතාව තුළින් ජල කළමනාකරණය හා පරිසර තුළනාත්මක සංකල්පයේ විශිෂ්ට පැතිකඩක් විවර කරයි. යෝධ ඇළට සම්බන්ධ ව නිර්මාණය කර ඇති "දියකලියේ" ප්‍රධාන කාර්යයන් වනුයේ ජලය ඉදිරියට ගලායාමට අවශ්‍ය බලය නිපද වීම, රොන්මඩ පාලනය, උත්ස්වේදනය හා උෂ්ණත්වය පාලනය කිරීම, පාංශු ජල මට්ටම ඉහළ අගයක පවත්වා ගැනීම, කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාදෙන ඒකකයක් ලෙස ක්‍රියා කිරීමයි. කුඩා වැවක් ලෙස හඳුනාගත හැකි දියකලියේ සාමාන්‍ය ගැඹුර අඩි 35/40 ක් පමණ





**සැලසුම් අංක (1), සොරොව් පිහිටි උන්නතාංශ**
**මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර අධ්‍යයනය ඇසුරින්**

ඇළ මාර්ගයෙන් වැව්වලට අමතරව කෘෂි භූමිවලට ජල ලබාදීම සඳහා යෙදූ සොරොව් ඇති බව වේ. පවතින සාධකවලට අනුරූපව ඕවලාකාර ව්‍යුහාත්මක හැඩයක් අනාවරණය කරගත හැකි

මෙහි භූමියේ සමෝච්ච රේඛාවල හා භූ භෞතික සාධකවල විහිදීම අනුව ව්‍යුහයේ වෙනස්වීම් පවතී. දියකලිය ස්ථානගත කිරීමේ දී භූමියේ සම උන්නතාංශයක් සහිත සමෝච්ච රේඛාවල පිහිටීම පිළිබඳ සැලකිලිමත් වී ඇත. ක්ෂේත්‍ර ගවේෂණයේ දී යෝධ ඇළට සම්බන්ධ ව ඉදිකර ඇති දියකලි 50 ආසන්න ප්‍රමාණයක් අනාවරණය කරගත හැකිවිය. වර්තමානයේ මේ අවශේෂ නිර්මිත භූමි දර්ශනයෙන් වෙනස් වී ඇත. කලා වැවෙන් යෝධ ඇළට නිකුත් කරන ජලයෙන් ද, ජල පෝෂකවලින් ලැබෙන ජලයෙන් ද, වර්ෂා ජලයෙන් ද යෝධ ඇළ පෝෂණය වී ඇත. ඉහත ක්‍රම තුළින් වසරේ වැඩි කාලයක් ඇළ මාර්ගයට ජලය සැපයෙන හෙයින් දියකලිය ද ජලයෙන් පිරී පැවතීමට හේතු විය. ප්‍රාදේශීය ව්‍යවහර අනුව තහවුරු කරගත් දියකලි අතර වැටකොලු දියකලිය, රන්හාමි දියකලිය, පුංචි බණ්ඩා දියකලිය වැදගත් වේ.

## ඉවුරු නිර්මාණය

අනුරාධපුර පැරණි යෝධ ඇළ ගලාගිය කලාපයේ සෑම භූමි ඛණ්ඩයකට ම මතුපිට හා භූගතව ජලය ලබාදිය හැකි පරිදි ඇළ මාර්ග අවකාශය සංවිධානය කර ඇත. ඒ බව පැහැදිලි වනුයේ භූගත ජල මට්ටම ඉහළ නැංවීම සඳහා යෙදූ තාක්ෂණික ක්‍රමවේද අනුසාරයෙනි. යෝධ ඇළ තැනි නිම්න සහිත භූමි කලාපයක් හරහා කලා වැවේ සිට තිසාවැව දක්වා ගලායන පරිදි නිර්මාණය කර ඇත. භූමියේ මද බෑවුම් සහිත ස්ථානයන්හි ජලය ඉදිරියට ගමන් කිරීමට අවශ්‍යය බලය ලබා ගෙන ඇත්තේ අදාළ කලාපයේ භූ විෂමතාව අනුව ඉවුරු ව්‍යුහාත්මකව සකස් කිරීමෙනි. පහළ උන්නතාංශයක් සහිත භූ විසමතා කලාපයන්හි ඉවුරු උසින් නිර්මාණය කිරීමත් ඉහළ උන්නතාංශයක් සහිත භූ විෂමතා ලක්ෂණ පිහිටි කලාපවල අවම උස මට්ටමින් ඉවුරු නිර්මාණය කර ඇත.



යෝධ ඇළ බැම්ම විවිධ භූමි උන්නතාංශ තුළ විවිධත්වයක් සහිතව හඳුනාගත හැකිය. එවැනි විශේෂතා රැසක් යෝධ ඇළ ක්ෂේත්‍ර ගවේෂණයේ දී අනාවරණය කරගත හැකිවිය.

- වැවට ඉහළින් ඇළ මාර්ගය ගමන් කිරීම සඳහා නිර්මිත බැමි සාධක
- උස් භූමියක් තරණය කර පහත් භූමියක් වෙතට ප්‍රවේශ වීමේ දී නිර්මිත බැමි සාධක
- වැවක් තුළ විවිධ භූ විෂමතාවක් සහිත වූ විට ගමන් කිරීමට යෝග්‍ය පරිදි නිර්මිත බැමි සාධක
- පහළ භූමි කලාපයක් තුළ යෝධ ඇළ ගමන් ස්වරූපය හැසිර වීමට නිර්මිත බැමි

යෝධ ඇළ ගලායන උපරිම ගැඹුර අඩි 2 කට නොවැඩි වන බවයි. මෙතරම් විශාල ජල කඳක් අඩි 2ක ගැඹුරු හා අඩි 40ක පළල ප්‍රමාණයක ඇළ මාර්ගයකින් සැ.පු. 54ක් දුරක් ගලායාමට හැකි පරිදි නිර්මාණ තාක්ෂණය කෙසේ හැසිර වුවාද යන්න පිළිබඳවයි. වාරි ශිල්පීන් මෙහි දී යෙදූ උපක්‍රමය වන්නේ දකුණු ප්‍රදේශය ඉවුරක් ස්වරූපයෙන් ඉදිනොකරන භූමියේ බෑවුම් ස්වභාවය විවෘත භූමියක් ලෙස පැවතීමට ඉඩහැරීමයි. වම්පස ප්‍රදේශය දකුණු තැනි නිම්න ස්වරූපයේ ඉහළම බෑවුමට අනුරූපව වම් පස ප්‍රදේශයේ ඇළ මාර්ග යේ ඉවුර නිර්මාණය කර තිබීම හඳුනාගත හැකිය.

## අන්තර් ඇළ මාර්ග

ඇළ මාර්ගයක කාර්යයට ඔබ්බට ගිය යෝධ ඇළ විශිෂ්ට වාරි නිර්මාණයක් බව පැහැදිලි වන්නේ පහළ උන්නතාංශයක් සහිත ප්‍රදේශවලට පමණක් නොව ඉහළ උන්නතාංශයක් සහිත භූමි ප්‍රදේශවලට ද අන්තර් ඇළ මාර්ග නිර්මාණය කිරීම තුළින් ජලය ලබාදීමට කටයුතු කර තිබීමයි. කලාවැවේ සිට තිසාවැව දක්වා ඇළ මාර්ගය තුළින් මෙවැනි අන්තර් ඇළ මාර්ග තුනකි.

01. මරදන්කඩවල වැවේ උපරිභාගය හරහා ගමන් කරන යෝධ ඇළ බැම්මේ සිට උඩාවත දක්වා ගමන් කරන ඇළ මාර්ගය

02. අමුණුකොළයවැවේ උපරිභාගය හරහා ගමන් කරන යෝධ ඇළ බැම්මේ සිට ආරම්භ වන ඇළ මාර්ගය

03. එප්පාවල සිට කටියාව දක්වා ඉදිකර ඇති කොනිත්ති ඇළ (අන්තර්නිම්න කලාපයේ) මෙම ඇළ මාර්ග නිර්මාණ තාක්ෂණය වන්නේ පහළ සමෝච්ච රේඛා සහිත කලාපය හරහා ඉදි නොකර ඉහළ සමෝච්ච රේඛා කලාපයට ජලය ලබාදීමට කටයුතු කිරීමයි.

කලාවැවේ සිට නඹඩෑව පාලම දක්වා කලා ඔයට බෑවුම් වූ (වම් ඉවුරු) ප්‍රදේශයේ සැබෑ මුහුදු මට්ටම් අගය අඩි 99ත් 105ත් අතර විහිදී යන හෙයින් කලාවැවේ සිට නඹඩෑව දක්වා වම් ඉවුර දෙසට බෑවුම ඉහළ අගයක් ගනු ලබයි. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන දකුණු ඉවුර නිර්මාණය වූ බවත් නඹඩෑව සිට තිසාවැව දක්වා දකුණු ඉවුර බෑවුම් වන සැබෑ මුහුදු මට්ටම් අගය අඩි 105 සිට 85 දක්වා බෑවුම් ස්වරූපය අනුව ඉවුර නිර්මාණය කිරීමෙන් වැඩි ජල ධාරිතාවක් ගබඩා කරගත හැකි පරිදි බැම්ම භූමියේ සමෝච්ච රේඛාවල පිහිටීම අනුව ස්ථාන ගතකර ඇත.

යෝධ ඇළ හුදු ඇළ මාර්ගයක් නොව දිගු වැවක් ය යන්න තහවුරු කිරීම සඳහා යෝධ ඇළ නිර්මාණ ලක්ෂණ පිළිබඳ තහවුරු කරගන්නා ලදී. ඇළ මාර්ගයක ප්‍රධාන කාර්යය වනුයේ ප්‍රධාන ජල මූලාශ්‍රයක සිට ජල අවශ්‍යතාව ඇති ප්‍රදේශයක් වෙත ජලය ලබාදීමයි. යෝධ ඇළ අන්තර් ඇළ මාර්ගයක් ලෙස හඳුනාගත හැකි අතර මෙයින් ජලය පවාහනය කිරීම සඳහා පමණක් නොව අන්තර්කලාපයේ ජනාවාසවලට අවශ්‍ය ජලය ලබාදුන් වාරි තාක්ෂණික ලක්ෂණ අනාවරණය කරගත හැකි විය.

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ**
**ජාතික සමාජසේවා මණ්ඩලය මගින් පාලනය වනු ලබන**
**ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස හා භික්ෂු ගිලන් විවේකාශ්‍රම සඳහා**
**ඔබගේ පරිත්‍යාගයන් ලබා දීමට අපව අමතන්න.**

පරිපාලන නඩත්තු, සනීපාරක්ෂක සහ වෙනත් අවශ්‍යතා සඳහා
ඔබට පරිත්‍යාගයන් ලබා දිය හැක.

**දුරකථන අංක :- 011-2691695/2688517**

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

**ජාතික සමාජසේවා මණ්ඩලය – සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

**ගිණුම් අංකය :- 078-100193691803**

මහජන බැංකුව - බොරැල්ල ශාඛාව

බෞද්ධාලෝකය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ඇසළ - නිකිණි 2021 ජූලි - අගෝස්තු



# සම්මාකම්මන්ත

**පූජ්‍ය මහාචාර්ය**
**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**
**පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සිව්වැනි අංගය සම්මා කම්මන්තය යි. එහි අර්ථය යහපත් කටයුතු යනු යි. සංයුත්ත නිකාය මග්ගසංයුත්තයෙහි විභංග සූත්‍රයෙහි විවරණය වී ඇති පරිදි පරපණ නැසීම, සොරකම, අබ්‍රහ්මචර්යාව යන තුනෙන් වැළකී කටයුතු කිරීම සම්මාකම්මන්ත නම් වේ. එනම් කයින් සිදුවන වැරදිවලින් වැළකීම යි. එහෙයින් සම්මාකම්මන්තය යනු කාය සංවරය යි. කාය වාක් මනෝ යන ද්වාරත්‍රය ම සංවර කරගැනීම යහපත් බව බුද්ධදේශනාව යි. කාය සංවරය සීලයෙහි මූලික පැතිකඩකි. යහපත් ලෙස කාය වාක් ක්‍රියාවන් පැවැත්වීම සීලය සේ අර්ථකථනය වී ඇත්තේ එහෙයිනි. ඒ අනුව සීලය සපුරාලීමට කායිකව සම්පූර්ණවිය යුතු කරුණු සම්මාකම්මන්තය යටතට අයත් වෙයි. ඉහත කී පරිදි ඊට කරුණු තුනක් අයත් වේ.

ඒවා විවරණය කිරීමට පෙර ඒ හා සම්බන්ධවන විරමන හා සමාදාන යන සංකල්ප දෙකක් ඇති බව කිව යුතුය. විරමන යනු වෙන්වීම යි. සමාදාන යනු සමීපයට ඇදගැනීම යි. විරමනයෙහි ඈත් කරන දේ වෙනුවට සමාදානයෙන් බොහෝ දේ සමීප කරගනු ලැබේ.

## පරපණ නැසීමෙන් වැළකීම

පණ ඇති සතුන්ගේ දිවි තොරකිරීම හෝ කරවීම ප්‍රාණඝාත නම් වේ. පරපණ නසන්නා මරණින් මතු අපාය දුගති සංඛ්‍යාත නිරයෙහි උපදියි. යම් හෙයකින් මිනිසකු වී උපන්නේ නම් අල්පායුෂ්ක වේ. තමන්ගේ සැපත සඳහා බොහෝ සෙයින් පරපණ නසයි. මුදල් ඉපයීම, ආහාරය, ආගමික අරමුණු සපුරාලීම ආදි විවිධ පරමාර්ථ එහි වේ. කවර පරමාර්ථයකින් ප්‍රාණඝාතය කළත් එය අකුසලයකි. එපමණක් නොව වෙනත් අකුසල් කිරීමට අවකාශ සලසන අකුසල කර්ම පථයක් ද වේ.

සම්මාකම්මන්තයට අයත් අංගයක් ලෙස ප්‍රාණඝාතයෙන් වැළකීම අර්ථකථනය කළ යුත්තේ එහි විරමනය සලකා නොව සමාදානය සැලකීමෙනි. සත්ත්ව ඝාතනයෙන් වැළකෙන පුද්ගලයා වෙතට ඇදී එන ගුණධර්ම කිහිපයකි. කරුණා, මෛත්‍රී, ලජ්ජා, දයා, අනුකම්පා ආදිය ඊට අයත් ය. එය 'සර්වසත්ත්වහිතානුකම්පාව' ලෙස සූත්‍රවල දැක්වේ. වෙනත් වචනයකින් ගතහොත් සියලු සත්ත්වයන් කෙරෙහි හිතවත්ව අනුකම්පා ඇති බව යි. සත්‍ය ලෙසම මේ කරුණා මෛත්‍රී දෙක යි. ඒ අනුව සම්මාකම්මන්තයේ එක් පැතිකඩක් වන්නේ මෙත්තාව හා කරුණාව වර්ධනය කිරීම යි. සාමයෙහි මූලිකංග වන ඒවා සතර බ්‍රහ්ම විහරණවල පළමු හා දෙවන තැන් නියෝජනය කරයි. එහෙයින් එක් අතකින් ප්‍රාණඝාතයෙන් වැළැක්ම යනු බ්‍රහ්මවිහරණ දෙකකින් යුක්ත වීම යි.

## සොරකමෙන් වැළකීම

තමන්ට නොදෙන ලද දෙය සොරසිතින් ගැනීම අදින්නාදානය හෙවත් සොරකම යි. තමන්ට අයත් නැති දේ පැහැරගැනීම, වංචාකිරීම, මංකොල්ලකෑම, අයථා ලෙස ලබාගැනීම හා අනුන් රවටා අයත් කරගැනීම ද සොරකමට ම වැටෙයි. තෘෂ්ණාව, අලසකම, ක්‍රෝධය හෝ වෛරය ඊට පදනම් සලසයි. සොරකමෙන් වැළකෙන්නා සමීප කරගන්නා ගුණාංග දානය හෙවත් පරිත්‍යාගය හා සම්බන්ධ වේ. ඒ තුළ ක්‍රියාත්මක වන්නේ නොසොර වූ පිරිසිදු චින්තනයකි.

සොරකමෙන් වැළකී පරිත්‍යාගය හුරුකිරීම සම්මාකම්මන්තය සේ සැලකීම වඩා සුදුසු ය. එක් අතකින් දානය පාරමිතාවකි. එහි පාරප්‍රාප්තිය නිවන අවසන් කර ඇත්තේය. අනෙක් අතින් පරිත්‍යාගය සමාජ ධර්මයකි. බොහෝ බෞද්ධ සංකල්පවල දානය පුරෝගාමීව දැක්වෙන්නේ එහෙයිනි. සම්මාකම්මන්තය යටතේ වඩා වැදගත් වන්නේ සමාජ සංහිඳියාව උදෙසා මෙහි බලපෑම යි. සොරකම නිසා හටගන්නා ගැටුමට පරිත්‍යාගයෙන් ඉඩක් නොමැතිවීම එම සමාජ සංහිඳියාවේ පදනම යි. පරිත්‍යාගශීලි පුද්ගලයා මිනිස් නොමිනිස් සැමට ප්‍රිය වේ. ඔහුගේ ඇසුරට බොහෝ දෙනා එකතු වේ. ඔහුගේ කීර්තිය ද බොහෝ තැන පැතිරී යයි. පිරිස අතර ඔහු විශ්වාසවන්තයකු වෙයි. මෙම අන්‍යොන්‍ය බැඳීම සමාජ ප්‍රගමනයට වඩාත් වැදගත් වෙයි.

## අබ්‍රහ්මචර්යාවෙන් වැළකීම

සම්මාකම්මන්තය සම්පූර්ණවීමට අවශ්‍ය තෙවැනි අංගය අබ්‍රහ්මචර්යාවෙන් වැළකීම යි. එනම් බ්‍රහ්මචාරීවීම යි. බොහෝ දෙනෙක් මෙය කාමමිථ්‍යාචාරයෙන් වැළකීම සේ විවරණය කළ ද ඉහත කී සංයුත්ත නිකාය විභංග සූත්‍රයට අනුව අබ්‍රහ්මචර්යාවෙන් වැළකීම ම සම්මාකම්මන්තයට අදාළ වේ. මගේ අදහස අනුව එය සම්මාකම්මන්තයේ දාර්ශනික අර්ථය සේ සැලකිය යුතුය. ඉහත කී ජනප්‍රිය අර්ථය එහි සමාජ අර්ථය සේ ගත යුතුය. දීඝනිකාය අටුවාව බ්‍රහ්මචරිය ශබ්දය විවරණය කිරීමේ දී එම අර්ථ දෙක ම ගෙන ඇත්තේ එහෙයිනි.

අර්ථ දහයකින් බ්‍රහ්මචරිය ශබ්දය විස්තර කරන අටුවාව පස්වන හා සවන අර්ථ සේ දක්වා ඇත්තේ මෛථුන විරතිය (වැළකීම) හා ස්වදාර සන්තුෂ්ටිය යි. මෙහි මෛථුන විරතිය යනු අබ්‍රහ්මචර්යාවෙන් වැළකීම යි. එනම් ලිංගික හැසිරීමෙන් ඉවත්වීම යි. ස්වදාර සන්තුෂ්ටිය යනු කාමමිථ්‍යාචාරයෙන් වැළකීම යි. එනම් ස්වාමියා භාර්යාව නොඉක්මවීම හා භාර්යාව ස්වාමියා නොඉක්මවීම යි. සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් පරිදි මෛථුනය ග්‍රාම්‍ය ධර්මයකි. අටුවාව අසත් ධර්මයක් සේ එයම විස්තර කරයි. මෛථුනයෙන් සපුරා ඉවත් වී එනම් බ්‍රහ්මචාරීවීමෙන් මාර්ගාංගයක් සේ සම්මාකම්මන්තය සම්පූර්ණ කර නිර්වාණාවබෝධයට පත් විය හැකිය.

පරපුරුෂ හා පරස්ත්‍රී සේවනයෙන් ඉවත්වීම සම්මාකම්මන්තයේ සමාජීය අර්ථය යි. එය සුචරිතවත් සමාජයක් ගොඩනැගීමේ පදනම යි. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය තුළ බහුලව දක්නට ලැබෙන ස්ත්‍රී/ළමා දූෂණ හා අපචාරවල මෙන්ම ඝාතනවල ද පදනම වී ඇත්තේ සම්මාකම්මන්තයේ මෙම පැතිකඩ පුද්ගල ජීවිතවල තහවුරු වී නොතිබීම යි. පසුගිය මාස කිහිපය තුළ සිදු වූ බොහෝ මනුෂ්‍ය ඝාතන සිදුවී ඇත්තේ අයථා කාම සේවනයේ අනිටු විපාක වශයෙනි. මෙම අයථා කාම සේවනය සඳහා පුද්ගල මනස සකස් කිරීමෙහි ලා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක බොහෝ රූපවාහිනී නාලිකා ඍජු දායකත්වයක් සපයන බව මගේ අදහස යි. මිනිස් මනස තුළ සංවර්ධනය කළ යුතු වැදගත් ගුණ ධර්ම වෙනුවට නොමිනිස් ගති වර්ධනය කිරීමෙහි ලා එම නාලිකා උත්කෘෂ්ඨ සේවයක් ඉටුකිරීම අතිශය ඛේදජනක ය.

සම්මාකම්මන්තයේ පැතිකඩ දෙකක් ඇති බව දත යුතුය. ඉන් පළමු වැන්න නිර්වාණාවබෝධය අවශ්‍ය කුසල නිෂ්පාදනය කිරීමට පුද්ගලයා යොමුකිරීම යි. කය මූලික කරගත් කුසල සම්පාදනය සඳහා සම්මාකම්මන්තය ප්‍රගුණ කළ යුතු වේ. ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් කරුණාව හා මෛත්‍රිය ප්‍රගුණ කෙරෙයි. සොරකමෙන් වැළකී පරිත්‍යාගශීලි වීමෙන් තෘෂ්ණාව තුනී කෙරෙයි. බ්‍රහ්මචර්යාවෙන් රාග සමනයට මඟ පාදයි. සාමකාමී හා සුචරිතවත් සමාජයක් ගොඩනැංවීමට අවශ්‍ය පුද්ගලයන් නිර්මාණය කිරීම සම්මාකම්මන්තයේ දෙවැනි පැතිකඩ යි. මිනිස් නොමිනිස් සැම දෙනා කෙරෙහි කරුණා මෛත්‍රී දයා අනුකම්පා සහගත සිතිවිලි පතුරුවන ඔවුනොවුන් ගරුකරන අන්‍යොන්‍ය සුහදත්වයෙන් සැම දෙනා පිළිබඳ විශ්වසනීයත්වයෙන් ක්‍රියාකරන සුචරිතවත් සමඟි සම්පන්න මිනිසුන් සහිත සමාජයක් ගොඩනංවාගැනීමට සම්මාකම්මන්තය වඩාත් ඉවහල් වෙයි.

**2021 ජනවාරි මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයට ඉදිරි වර්ෂ තුන සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිලධාරීන් පත්කර ගැනීමේ නිලවරණය කෝවිඩ් වසංගතය හේතුවෙන් කල්දැමීම නිසා 2021 අප්‍රේල් 3 දින පවත්වන ලද අතර වාර්ෂික මහා සභාව අප්‍රේල් 04 ඉරුදින පවත්වන ලදී. ඉදිරි වර්ෂ තුන සඳහා වැඩි ඡන්දයෙන් තේරී පත්වූ කෘත්‍යාධිකාරී මණ්ඩලය මෙසේය.**

ගරු සභාපති

**චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා**

ගරු හිටපු සභාපති

**ජගත් සුමතිපාල මහතා**

ගරු නියෝජ්‍ය සභාපති

**රොෂාන් මද්දුමගේ මහතා**

ගරු උපසභාපතිවරුන්

**වෛද්‍ය රාණි ප්‍රනාන්දු මහත්මිය**
**වසන්ත ද සිල්වා මහතා**
**රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතා**
**නීලිකා සේනානායක මහත්මිය**
**ලක්ෂ්මන් කෝට්ටගේ මහතා**
**විද්‍යාජෝති මහාචාර්ය නිමල් ද සිල්වා මහතා**
**උපුල් රූපසිංහ මහතා**
**මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා**
**ආචාර්ය සෙනරත් දිසානායක මහතා**
**ආචාර්ය එල්. එම්. කීර්ති තිලකරත්න මහතා**

ගරු සමලේකම්වරු

**තුෂාර දිලුම් වාහලතන්ත්‍රී මහතා**
**ඉෂාන් බුද්ධික එදිරිසූරිය මහතා**

ගරු භාණ්ඩාගාරික

**ජෙනරාල් දයා රත්නායක මහතා**

ගරු උපලෙකම්වරු

**ජී.වී. එඩ්මන් වික්‍රමසිංහ මහතා**
**එච්. රවීන්ද්‍ර කුමාර් පීරිස් මහතා**

තේරී පත්වූ උපසභාපති ආචාර්ය සෙනරත් දිසානායක මහතා ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුවට විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලීන්ද්‍ර රණවීර මහතා ව්‍යවස්ථානුකූලව පත්කරන ලදී.

අප්‍රේල් 03 නිලවරණයෙන් තේරී පත් වූ නව නිලධාරී මණ්ඩලය - වාර්ෂික මහා සභාව නිමවූ විගස බම්බලපිටියේ සිරි වජිරාරාමයට ගොස් අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද හිමියන් බැහැදැක අනුශාසනා පරිදි තෙරුවන් වැඳපුදා ගති.

එම මස 09 වෙනි සිකුරාදා දින ගෞරවනීය සංඝරත්නය සම්මේලන මූලස්ථානයට වැඩමකරවා සිදුකරන ලද දානමය පුණ්‍යකර්මය ප්‍රථම නිල රාජකාරිය විය.

ඉන්පසු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික සාමාජිකාවන් අප්‍රේල් 17 දින මහනුවර බලා පිටත් වී අතිපූජනීය දළදා වහන්සේ වැඳ පුදාගති. පිරිස ඉතා ආදරයෙන් පිළිගත් දියවඩන නිලමේ නිලංග දෑල මැතිතුමා උදය භෝජන සංග්‍රහය පිරිනැමීමට කාරුණික විය.

ඉන් අනතුරුව පිරිස මල්වතු අස්ගිරි මහනා හිමිවරුන් හා අනු නා හිමිවරුන් බැහැ දුටුවෝය. පිරිස ඉතාම කරුණාවෙන් හා මෛත්‍රියෙන් පිළිගත් මහා නා හිමිවරුන් රටේ අනාගත මෙන්ම බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් බෞද්ධ මහා සම්මේලනයේ කාර්යභාරය පැහැදිලි කර, ඒ සඳහා කළයුතු වැඩපිළිවෙළ දීර්ඝ ලෙස සාකච්ඡා කර ඒ සඳහා නව නිලධාරී මණ්ඩලයට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කර, පිරිත් නූල් බැඳ සෙත් පැතූහ.

# පූජාවලි 2021

## සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර හා ගීත රචනා තරඟාවලිය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ, ජාතික අධ්‍යාපන මණ්ඩලය මඟින් සංවිධානය කරනු ලබන පහත සඳහන් චිත්‍ර සහ ගීත රචනා තරඟ සඳහා නිර්මාණ **2021 ජූලි 20 සිට අගෝස්තු 31** වන දින දක්වා භාර ගැනේ.

### සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර තරඟය

දිවයිනේ සියලුම පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් ගේ බෞද්ධ චිත්‍ර නිර්මාණ මෙම අංශය යටතේ ඉදිරිපත් කල හැකිවේ.

පූර්ව ප්‍රාථමික අංශය අවු. 05 - 08
ප්‍රාථමික අංශය අවු. 09 - අවු. 11
කනිෂ්ඨ අංශය අවු. 12 - අවු. 14
ජ්‍යෙෂ්ඨ අංශය අවු. 15 - අවු. 18
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය අභ්‍යන්තර ශිෂ්‍ය ලියාපදිංචිය

### සමස්ත ලංකා ළමා සංවර්ධන බෞද්ධ චිත්‍ර තරඟය

දිවයිනේ පවතින රජයේ සහ පෞද්ගලික ළමා සංවර්ධන මධ්‍යස්ථාන සහ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි සිසුන් සඳහා වෙන්වූ බෞද්ධ චිත්‍ර තරඟයයි.

(ළ/ස) පූර්ව ප්‍රාථමික අංශය - අවු. 5, 8
(ළ/ස) ප්‍රාථමික අංශය - අවු. 9, 11
(ළ/ස) කනිෂ්ඨ අංශය - අවු. 12, 14
(ළ/ස) ජ්‍යෙෂ්ඨ අංශය - අවු. 15 සිට

### සමස්ත ලංකා පාරිවේණික හා විද්‍යායතන බෞද්ධ චිත්‍ර තරඟය

දිවයිනේ සයිලුම පාරිවේණික හා විද්‍යායතන සිසුන්ගේ චිත්‍ර නිර්මාණ මෙම අංශය යටතේ ඉදිරිපත් කල හැකිවේ.

පා/පූර්ව ප්‍රථමික අංශය - මූලික 1 විද්‍යායතන 6,7
පා/ප්‍රාථමික අංශය - 2, 3 ශ්‍රේණි. විද්‍යායතන 8,9
පා/කණිශ්ඨ අංශය - 4, 5 ශ්‍රේණි, විද්‍යායතන 10,11
පා/ජ්‍යෙෂ්ඨ අංශය - ප්‍රාචීන/ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන 12, 13 ශ්‍රේණි

### සමස්ත ලංකා පරිගණක බෞද්ධ චිත්‍ර තරඟය විවෘත තරඟ අංශයකි

පරිගණක බෞද්ධ චිත්‍ර තරඟය - වයස අවු. 18 අඩු සිසු දරු දැරියන්ගේ පරිගණක චිත්‍ර මේ සඳහා ඉදිරිපත් කල හැකිවේ.

පරිගණක බෞද්ධ චිත්‍ර තරඟය (විවෘත) - අවු. 19 ට වැඩි ඕනෑම පුරවැසියෙකුට මෙම තරඟ අංශයට නිර්මාණ ඉදිරිපත් කල හැකවේ

### චිත්‍ර නිර්මාණය කල යුතු තේමා

1. පූර්ව ප්‍රාථමික සහ ප්‍රාථමික අංශ - බුදු දහමට අදාල තේමාවක් යටතේ සුදුසු මාතෘකාවක් තෝරා ගැනීම
2. කනිෂ්ඨ අංශය - අටලෝ දහම
3. ජ්‍යෙෂ්ඨ අංශය - මනුෂ්‍යත්වයේ වටිනාකම
4. විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන සහ විවෘත - සාර්ථක දිවියකට බුදු දහම

### චිත්‍ර ඇඳීමේ කඩදාසි ප්‍රමාණයන්

1. පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ තරඟ අංශ සඳහා - අගල් 14 × 18 ප්‍රමාණය
2. විශ්වවිද්‍යාල සහ විවෘත අංශ - අගල් 16 × 20 ප්‍රමාණය
3. පරිගණක චිත්‍ර අංශය - 3 ප්‍රමාණය

## සමස්ත ලංකා බෞද්ධ ගීත රචනා තරඟාවලිය

### සමස්ත ලංකා බෞද්ධ ගීත රචනා තරඟය

1. ශිෂ්‍ය අංශය - වයස අවු. 18 ට අඩු සියලුම දරු දැරියන්ට මෙම අංශය සඳහා බෞද්ධ ගීත රචනා ඉදිරිපත් කල හැකිවේ.
2. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය - විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විද්‍යාර්ථීන්ගේ ගීත රචනා මෙම අංශයට ඉදිරිපත් කල හැකිවේ.
3. විවෘත අංශය - ඉහත අංක 1,2 යටතේ ඇතුලත් නොවන ඕනෑම ශ්‍රෝත්‍රයක පුද්ගලයෙකුට මෙම තරඟ අංශය සඳහා ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.

### සමස්ත ලංකා බෞද්ධ ළමා ගීත රචනා තරඟය

1. ශිෂ්‍ය අංශය - වයස අවු. 18 ට අඩු සියලුම දරු දැරියන්ට මෙම අංශය සඳහා බෞද්ධ ගීත රචනා ඉදිරිපත් කල හැකිවේ.
2. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය - විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විද්‍යාර්තීන්ගේ ගීත රචනා මෙම අංශය සඳහා ඉදිරිපත් කළ හැකිවේ.
3. විවෘත අංශය - ඉහත අංක 1,2 යටතේ ඇතුලත් නොවන ඕනෑම පුද්ගලයෙකුට මෙම තරඟ අංශය සඳහා ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.

### බෞද්ධ ගීත සහ බෞද්ධ ළමා ගීත රචනා සඳහා තේමාවන් තෝරා ගැනීම

★ තමන් කැමති බෞද්ධ තේමාවක් හෝ සංකල්පයක් යටතේ බෞද්ධ ගීත රචනාවක් නිර්මාණය කිරීම.

**සියලුම බෞද්ධ චිත්‍ර තරඟ සහ බෞද්ධ ගීත රචනා සඳහා අයදුම් පත්‍ර සහ විස්තර කොළඹ 07, අංක 380, බෞද්ධාලෝක මාවත, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මූලස්ථාන කාර්යාලයෙන් හෝ අපගේ වෙබ් අඩවිය www.acbc.lk/application වෙත යොමුවීමෙන් ලබා ගත හැක.**
**දුරකතනයෙන් විමසීම් - 0765 611 374 - 0772 342 577 - 0714 894 925**

* සියලුම තරඟ අංශයන්හි ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා ත්‍යාග සහ සහතික පත්‍ර ද, විශිෂ්ඨ කුසලතා, කුසලතා සහිත නිර්මාණ වෙනුවෙන් සහතික පත්‍ර ද, සුදුසු කෘති සඳහා සහභාගීත්ව සහතික ද පිරිනමනු ලැබේ.

**ජාතික අධ්‍යාපන මණ්ඩලය,සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**
අංක. 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. - දු.ක. 0112 691 695/www.acbc.lk/application

# පින සහ කුසලය
# එකක්ද? දෙකක්ද?

- පින් පව් කුසල් අකුසල් කියන්නේ මොනවාද?
- පින් පව් කුසල් අකුසල් කරන්නේ කෙසේද?
- පින් කියන්නෙ කයෙන් කරන යහපත් ක්‍රියා හා වචනින් පවසන යහපත් හොඳ වචන.
- පව් කියන්නේ කයෙන කරන අයහපත් නරක ක්‍රියා සහ වචනින් පවසන නපුරු අයහපත් වචන.
- කුසල් කියන්නෙ යහපත් හොඳ සිතිවිලිවන කරුණාව, මෛත්‍රිය, දයාව, පරාර්ථකාමී සිතිවිලි.
- අකුසල් කියන්නෙ නරක අයහපත් සිතිවිලි වන තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර. ආත්මාර්ථකාමී වැනි සිතිවිලි.
- කයට හා වචනයට කරුණාව මෛත්‍රිය දයාව පරාර්ථකාමී වැනි සිතිවිලි ඇති කර ගැනීමට නොහැකි බැවින් කයට හා වචනයට කුසල් කිරීමට නොහැකිය.
- කයට හා වචනයට තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර, ආත්මාර්ථකාමී වැනි සිතිවිලි ඇතිකර ගැනිමට නෙහැකි බැවින් කයට හා වචනයට අකුසල් කිරිමට නොහැකිය.
- සිතින්, සතෙකුට කන්න දෙන්න හෝ කෙනෙකුට යහපත් වචනයකින් උපදෙස් වැනි යහපත් දෙයක් කරන්න බැරි බැවින් සිතට පින් කිරිමට නොහැකිය.
- සිතින් කෙනෙකුට ගහන්න බණින්න වැනි නරක අයහපත් දෙයක් කරන්න බැරි බැවින් සිතින් පව් කිරිමට නොහැකිය.
- සිතට තනියෙන් කුසල් අකුසල් කිරීමට හැකියාව ඇතත් කයට හා වචනයට සිතේ ආධාර නැතිව පින් පව් කිරිමට නොහැකිය.
- කෙනෙකුට යමක් දෙන්න හෝ බණින්න හෝ පළමුව සිතින් සිතිය යුතුය.
- සිතින් සිතන විට චේතනාවක් ඇති වේ.
- එම චේතනාව ක්‍රියාත්මක කරන විට පිනකුත්, බණින විට පවකුත් සිදුවේ.
- එසේ ම යමක් දීමට සිතීමේ දී සිතින් සිතීම නිසා කුසලයක් ඇති වේ.
- බැණීම සිතින් සිතීම නිසා අකුසලයකුත් ඇති වේ.
- බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පින් හතරක් දේශනා කර තිබේ. එනම් සම්මා වාචා, බොරු නොකීම, කේළම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීමයි. කය සංවර කරන පින් තුනක් දේශනා කර ඇත. සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීමයි.
- ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාව මිථ්‍යා වාචා. වචනයෙන් කරන පව් හතර එනම් බොරු කීම, කේළම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීමයි. කයෙන් කරන පව් තුන නම් සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම්. වචනින් පව් හතරක් දේශනා කර ඇත. කයෙන් පව් තුනක් ද සමඟ පව් හතකි.


## පින් පව් කුසල් අකුසල් ගැන දැන ගැනීමට පොත්.

- පින් සහ පව් - කුසල් සහ අකුසල් 120/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම 125/-
- හොඳ - නරක, පින් - පව්, කුසල් - අකුසල් 100/-
- සිතුවිලි සහ සිතින් සිතීම 150/-
- චිත්ත නියාම ධර්මය 125/-
- සිත මනස සහ ආගම් 80/-
- සිත ගැන දැනගන්න 125/-
- දූ දරුවන්ගේ සාරධර්ම අත්පොත 100/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය හා මනසින් පින් පව් 100/-
- සිතෙහි සතුට ඇති කරගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න 125/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? 175/-

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**
**661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.**
**දුරකථන: (011) 2685369, 2686925**
**ෆැක්ස්: 2674187**


2021 මැයි මස 24 වන දින රටට සහ සියලු ලෝ වාසීන්ට සෙත් පතා පිරිත් පිංකමක් සමස්ත ලංකා  බෞද්ධ මහා සම්මේලන මූලස්ථානයේ පවත්වන ලදී.
බෞද්ධාලෝක
වෙසක්
ශ්‍රී බු. ව. 2564/2021 මැයි 24 දින...
කොවිඩ් 19 උවදුරින් පීඩාවට පත් ලක්වැසි
ලෝවැසි සැමට සෙත්පතා සිදු කරන
සෙත් පිරිත් සජ්ඣායනාව



2021 මැයි මස 26 වන දින බෞද්ධාලෝක මාවතේ වෙසක් උත්සවය නිමිත්තෙන් පැවති ආලෝක පූජාව ගරු අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතාගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.


බෞද්ධාලෝකය®

ප්‍රකාශනය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථන: 011-2691695/2688517

ජාත්‍යන්තර ග්‍රන්ථ හඳුනාගැනීමේ සංකේතය
ISSN 2613-8743
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි අංකය
P 1567
තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය
QD/NEWS/117/2021

9 772613 874002